# නියමුවා

ISSN 1391 - 1031 | 2021 නොවැම්බර් | 26 වෙළුම | 07 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"සමාජමය නිෂ්පාදනය සහ බෙදා හැරීම විද්‍යාත්මක මාර්ගයක් අනුව පුළුල් ලෙස ව්‍යාප්ත කිරීමට ඒවා වැඩ කරන ජනතාවගේ ජීවිතය පහසු කිරීමේ සහ හැකි තරම් දුරට ඔවුන්ගේ යහ සාධනය වැඩි දියුණු කිරීමේ අරමුණට යටත් කිරීමටත් ඉඩ සලසන්නේ සමාජවාදය පමණකි. මෙය ඉටු කළ හැක්කේ සමාජවාදයට පමණකි. එසේම, සමාජවාදය මෙය ඉටු කළ යුතු බවද අපි දනිමු."

ලෙනින්
තෝරාගත් කෘති,
08වැනි වෙළුම,
134පිටුව



**1989-2021**

බිමෙන් බිම නුඹ අතුල
අසීමිත ප්‍රේමයේ පණිවිඩය
හදවතේ ගැඹුරින්ම තබාගෙන
දරන්නෙමු කිසිදිනක අතනෑර

පරපුරක් නොවේ ඉතිහාසයක්
වේදනාවේ ඉපිද වේදනාවේ මියෙන
සුවහසක් මිනිස් යායක සතුට
මේ ගමන වෙනස් කර ගැනීමය

නපුරට පියපත් ලැබී ඇත
මරණයේ හෙවණැලිය තැනින් තැන
විසාලාවක් නැවත මවී බිමම
අමනුෂ්‍ය රෝ බිය පැතිර යන

නේක මල් පිපෙන මහ කැලෑවල
රතු කුසුම් හදවතින් නෙළාගෙන
පංතියට අසීමිත ප්‍රේමයෙන
නුඹේ මඟ ගත යුතුය අරමුණට

නුඹට හිමි හදවතේ මහා ඉඩ
මේ ඉල් මහේදිත් මෝදු වෙන
කඳු මුදුන් වේය රතු ධජ ලෙළෙන
මිනිසුන්ට අසීමිත ප්‍රේම කළ

තාරකා පහන් එළි නැගීගෙන
අඳුරුබර කඳු මුදුන් හිසින් එන
අන්ධකාරය මුදා එළිය ගෙන
සූරියා පායාවි උදෑසන

(32වැනි ඉල් මහ විරු සමරුව වෙනුවෙනි)






# අලුත් දේශපාලන ගමනට ඇරයුම් කරන්න
# ජනතා විමුක්ති පෙරමුණ ගමට



ජනතාව නව බලාපොරොත්තු සහිතව වත්මන් ආණ්ඩුව බලයට පත් කර ගත් නමුත් ඉතාම කෙටි කාලයක් තුළ ආණ්ඩුව තමන්ගේ අසාර්ථකත්වය රට හමුවේ ඔප්පු කරනු ලැබ ඇති බව පෙන්වා දෙන ජනතා විමුක්ති පෙරමුණ, අසාර්ථක ආර්ථික දේශපාලන ගමන් මඟ වෙනුවට නව ආර්ථික දේශපාලන ගමනක් නිර්මාණය කරන නව බලවේගයක් වටා ඒකරාශි විය යුතුය යන පණිවිඩය රැගෙන ජනතාව සමග නව සංවාදයක් ආරම්භ කර තිබේ.

ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, මේ බව අනාවරණය කළේ, ජනතා විමුක්ති පෙරමුණ විසින් නොවැම්බර් 01වැනි දින සිට රට පුරා දියත් කරන 'ගමෙන් පටන් ගමු' නව දේශපාලන වැඩපිළිවෙළෙහි ආරම්භක අවස්ථාවට එක් වෙමිනි.

මහරගම ප්‍රදේශයේ ජනතාව හමුවීමට පෙර මාධ්‍ය වෙත අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"දශක ගණනාවක් තිස්සේ පාලක කණ්ඩායම් දෙකක් විසින් අපේ රටේ ගෙන ගිය පාලනයේ අසාර්ථකභාවය අද ඉතා හොඳින් ඔප්පුකොට තිබෙනවා. විශේෂයෙන්ම පසුගිය ජනාධිපතිවරණයේදී සහ මහා මැතිවරණයේදී මේ රටේ ජනතාව විශාල අපේක්ෂාවන් සහ බලාපොරොත්තු සහිතව වර්තමාන පාලනය ගෙන ඒම සඳහා කටයුතු කළා.

කෙසේ වුවත් එම පාලනය සෑම අතින්ම අසාර්ථක බව අද වන විට ඔප්පු වී තිබෙනවා. මෙය දූෂිතභාවය ඉහවහා ගිය, සාමූහිකත්වය වෙනුවට පවුල කේන්ද්‍රකර ගත්, ආර්ථික සංවර්ධනය වෙනුවට සියල්ල විකිණීම කේන්ද්‍රගත කරගත්, ජනතාවට සහන ලබාදෙනවා වෙනුවට භාණ්ඩ මිල ඉහළ දමමින් ජනතාව අමාරුවේ දමන පාලනයක්. ඒ වගේම ගොවි ජනතාවගේ පොහොර ප්‍රශ්නය දිනෙන් දින උග්‍ර **02 වැනි පිටුවට**

## පොහොර වංචාව ගැන නොසොයා ආණ්ඩුව මාධ්‍යවේදීන් සොයා යාම විහිළුවක්

**ජ.වි.පෙ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**



ඉන්දියාවෙන් දියර පොහොර ගෙන්වීමේදී වංචාවක් සිදු වී ඇති බවට වාර්තා වන බව පැවසූ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ආණ්ඩුව ඒ පිළිබඳව පරීක්ෂණ නොකොට එම ගනුදෙනු පිළිබඳව වාර්තා කරන මාධ්‍යවේදීන් පිළිබඳව විමර්ශනය කිරීමට කටයුතු කරමින් සිටිම විහිළුසහගත බවත් පොහොර වංචාව පිළිබඳව වහාම පරීක්ෂණයක් සිදු කළ යුතු බවත් ප්‍රකාශ කළේය.

හඳුන්නෙත්ති සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 24වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී කරුණු දක්වමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"අංශු මාත්‍ර ශාක පෝෂක නිෂ්පාදක සැපයුම යටතේ පොහොර ගෙන්වීම සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා පසුගිය 15වැනිදා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මෙම නයිට්‍රජන් පොහොර තොගය ඉන්දියාවෙන් ගෙන්වා තිබෙන්නේ කැබිනට් සංදේශයට පටහැණිව බව දැන් අනාවරණය වෙනවා. රජයන් අතර ගනුදෙනුවක් නම් රජයේ සමාගම් හරහා ආනයනය ක්‍රියාවලිය සිදුවිය යුතු නමුත් ඉන්දියානු සමාගමේ දේශීය නියෝජිතයා වන පෞද්ගලික සමාගමකට භාණ්ඩාගාරය අනුමත කළ මුදල් මහජන බැංකුව මගින් ලබාදී

**02 වැනි පිටුවට**

## මිල තීරණය කරන්නේ කොම්පැනිකාරයෝ නම් කැබිනට් එකක් මොකටද?

**ජ.වි.පෙ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**




ආණ්ඩුව මේ වන විට මිල පාලනය, රජයේ දේපළවල අයිතිය, ජනතාව පිළිබඳ වගකීම් ආදී සියල්ලම සියලුම අංශවල පාලනය අත්හැර ඇති බවත් ආණ්ඩුවක් තිබිය යුත්තේ ජනතාව පීඩාවට පත්වීමේදී එයින් මුදා ගැනීම සඳහා බවත් ආණ්ඩුව එම වගකීම මුළුමනින්ම අත්හැර ඇති බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල තීරණය කරන්නේ සමාගම් අයිතිකරුවන් නම් කැබිනට් මණ්ඩලයක් නඩත්තු කළ යුත්තේ ඇයිදැයි ප්‍රශ්න කළේය.

විජිත් හේරත් සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"මේ ආණ්ඩුව පැයෙන් පැය බඩු මිල වැඩි කරමින් තිබෙනවා. මේ නිසා ජනතාව දරා ගන්න බැරි පීඩාවකින් ඉන්නේ. මහ බැංකුව ට්‍රිලියන දෙකකට ආසන්න මුදල් ප්‍රමාණයක් මේ වෙනකොට අච්චු ගසා තිබෙනවා. මේ නිසා රටේ බඩු මිල වේගයෙන් වැඩි වෙනවා. බැංකු පොලී අනුපාත වෙනස් වෙනවා. මේ නිසා නැවත වටයකින් අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යනවා. නමුත් ලැබෙන වැටුප්, ජනතාවගේ ආදායම් වැඩිවී නැහැ.

**02 වැනි පිටුවට**


**03 ආණ්ඩුවේ 'විසඳුම්'**



ආණ්ඩුව ගන්නා වැරදි අදූරදර්ශී ක්‍රියා මගින් පෙන්වන්නේ අන්කිසිවක් නොව පවතින බරපතළ අර්බුදයට දැනට පවතින ආර්ථික හා දේශපාලන ක්‍රමය තුළ...

**05 නොවැම්බරයේ ඇත්ත කථාව**



1988 - 89 භීෂණය' ලෙස සමාජ ගතකර තිබෙන්නේ ඝාතකයන් විසින් ලියන ලද ඉතිහාසයකි. සත්‍ය ඉතිහාසය නොවේ.

**07 පොහොසත් කළ හැකි රටක්**



මේ ලාභයම පමණක් අරමුණු කරගත්, කෑදර කොමිස් වෙනුවෙන් රටම අනතුරට හෙළන දේශපාලන ක්‍රමය වෙනස් නොකරන තාක් කල්...

**09 ලංකාවේ කළු ආර්ථිකයේ කතාව**



ඉස්පිරිතාලයේ බෙහෙත් පෙත්ත ගන්න නැතිව, තමන්ගේ අස්වැන්න විකුණාගන්න බැරිව හෙම්බත්වී හුල්ලන ජනයාගේ ධනය එක්රැස්වී තිබෙන්නේ කොතනැද?

තරුණ................................ 04
ජාත්‍යන්තර............................ 06
කාන්තා................................ 08
විශේෂාංග............................ 10
වේදිකාව ............................ 11


*යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!*

# සටන් බිම

## රු.10,000කින් වැටුප් වැඩිකිරීමක් ඉල්ලා රට පුරා විරෝධතා



රු. 10,000කින් සියලු සේවක වැටුප් වැඩිකරන ලෙස ආණ්ඩුවට බලකරමින් සටන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණය වීමට කටයුතු කරන ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය පවසයි. අයවැයේදී රාජ්‍ය, පෞද්ගලික හා වතු අංශවල සේවය කරන හා විශ්‍රාමිකයින්ටත් 10,000/=ක වැටුප් වැඩිවීමක් අත්‍යාවශ්‍ය බවත් මේ සම්බන්ධව ආණ්ඩුවට ලිඛිතව දැනුම් දී ඇති බවත් ඔහු පැවසීය. රටේ වැඩකරන ජනතාව මේ වනවිට අරගල කිහිපයක නිරත වී සිටින බව කියා සිටි ඔහු ගුරු මෙම අරගලවල නිරත වී සිටින පිරිසට වැටුප් වැඩිකර ගැනීමේ අරගලයටද එකතුවෙන ලෙස ආරාධනා කළේය.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා මේ බව පැවසුවේ පසුගියදා වෘත්තීය සමිති නායකයින් ගණනාවක් එක්ව පැවැත්වූ ඒකාබද්ධ මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දක්වූ ඔහු මෙසේද පැවසීය.

"ආණ්ඩුව සල්ලි නෑ කියනවා. අවුරුදු ගාණක් හොරාකාලා තියෙන සල්ලි එළියට දාල ඒවා රටට අරගෙන ආ යුතුයි. ඒකත් මේ අරගලයේ කොටසක් බවට පත් කළ යුතුයි. මේ රට හිඟමනට පත්වුණේ මේ රට පාලනය කළ අයගේ සහ කලින් පාලනය කළ අය මහජනයාගේ සල්ලි මහජන දේපළ හොරාකාපු නිසයි. ඒ මුදල් ගේන්න කියන බලපෑමත් මේ අරගලයේ තිබෙනවා."

මෙම මාධ්‍ය හමුව සඳහා රාජ්‍ය, පෞද්ගලික, වතු, යන සියලු ක්ෂේත්‍ර නියෝජනය කරමින් වෘත්තීය සමිති නායක නායිකාවෝ රැසක් සහභාගි වූහ. මෙහිදී අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් ජේ.එම්. ප්‍රේමරත්න, ලංකා විදුලි සේවක සංගමයේ ලේකම් රංජන් ජයලාල්, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි, අන්තර් සමාගම් සේවක සංගමයේ ලේකම් නීතිඥ ජානක අධිකාරී, විශ්‍රාමික හිමිකම් සුරැකීමේ ජාතික සංවිධානයේ ලේකම් සරත්ලාල් යන සහෝදරවරුද අදහස් දැක්වූහ.

## විදුලි බල මණ්ඩල සේවකයෝ දැවැන්ත සටනකට



කෙරවලපිටිය විදුලි බලාගාරයේ කොටස් 40% ක් හා LNG ගෙන්වීමේ හා බෙදාහැරීමේ ඒකාධිකාරිය ඇමෙරිකානු සමාගමකට විකිණීම, විදුලි බල මණ්ඩලය කොටස් කිරීමට එරෙහිව ලංවිම ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය විසින් රට පුරා විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කර ඇත. ඒ අනුව පසුගියදා කොළඹ ඇතුළු දිවයින පුරා විදුලි බල මණ්ඩල කාර්යාල හා බලාගාර ඉදිරිපිටදී උද්ඝෝෂණ ගණනාවක් පවත්වනු ලැබිණි. එම උද්ඝෝෂණ ව්‍යාපාරයෙන් අනතුරුව පෙත්සමක් අත්සන් කිරීමට කටයුතු කරනු ලැබීය. එසේම නොවැම්බර් 03 දින රට පුරා සියලු සේවකයින් කොළඹට පැමිණ දැවැන්ත විරෝධතාවයක් පැවැත්වීමට කටයුතු කරන බවද රංජන් ජයලාල් සහෝදරයා නියමුවා වෙත ප්‍රකාශ කළේය.

## ගුරු විදුහල්පති වැඩ වර්ජනය සාර්ථකයි





වසර 24 ක් තිස්සේ නොවිසඳී පවතින ගුරු විදුහල්පති වැටුප් විෂමතාවයට එරෙහි විරෝධතාවය අරඹා මේ වන විට දින 100 ක් ඉක්ම ගොස් තිබියෙදීත් ඊට විසඳුමක් ලබානොදීමට එරෙහිව ගුරු විදුහල්පතිවරු විසින් දියත් කරන ලද 21 /22 වැඩ වර්ජනය රට පුරා ඉතා සාර්ථක වූ බව ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය පවසයි.

එසේම ගුරු විදුහල්පතිවරු පසුගිය 25 දින රට පුරා උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්වූ අතර එයද ඉතා සාර්ථකව සිදු කළ බව එම සන්ධානය පවසයි.

ආණ්ඩුවේ බියවැද්දීම්වලට හා බොරු ප්‍රචාරවලට එරෙහිව ගුරු විදුහල්පතිවරුන් පෙරට පැමිණි බවත් ගුරුවරුන්ට චෝදනා කිරීම නවතා තවදුරටත් ප්‍රමාද නොකර අහිමි කරන ලද වැටුප වෙනුවට යෝජනා කර ඇති තුනෙන් එකක කොටස එකවර වහාම ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින වෘත්තීය සමිති සන්ධානය, එසේ නොවන්නේ නම් තවදුරටත් අරගලය පෙරට ගෙනයන බවද අවධාරණය කරයි.

එසේම දැනට ආරම්භ කරන ලද පාසල්වල ගුරුවරු හා විදුහල්පතිවරු පමණක් සේවයට වාර්තා කර අමතර වැඩ කිසිවක් නොකර ඉගෙනුම් ඉගැන්වීම් කටයුතුවල පමණක් නියැලීමට තීරණය කර ඇත.

## බටහිර ජැටිය විකිණීම බරපතළයි වරාය සමිති ජනාධිපතිට ලියයි



වත්මන් රජය බලයට පත් වීමේදී ජාතික ආරක්ෂාව පිළිබඳව මහත් උනන්දුවෙන් ජනතාවට සහතික ලබා දුන්නද වත්මන් ක්‍රියාකලාපය තුළ ජාතික ආරක්ෂාව පිළිබඳ විෂයේ ගැඹුරු කියවීමක් ඇද්ද යන්න බරපතළ ගැටලුවක්ද පවතින බව සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය ජනාධිපතිවරයා වෙත ලිපියක් යවමින් කියා සිටී. ජාත්‍යන්තර භූ දේශපාලනය තුළ ඉන්දියාව හා ඇමෙරිකාව එක් කඳවුරකත් චීනය තවත් කඳවුරකත් නියෝජනය කරනු ලබන අතර එවන් පසුබිමක දකුණු කොළඹ වරායේ දකුණු කොටස චීනයේ CICT සමාගමටත් බටහිර කොටස ඉන්දියාවටත් විකුණා දැමීමට කටයුතු කිරීම මගින් එකිනෙකට පස මිතුරු රාජ්‍යයන් දෙකක් එකම භූමියක හමුවීමට සැලැස්වීම අප වැනි කුඩා රාජ්‍යයක ආරක්ෂාව සබැඳිව එල්ල කරන බලපෑම සුළුවෙන් තක්සේරු කළ නොහැකි බවද එම ලිපිය මගින් පෙන්වා දී ඇත. සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකානගේ සහෝදරයාගේ අත්සනින් මෙම ලිපිය ජනාධිපතිවරයා වෙත ලිපිය යවනු ලැබ ඇත.

## පෞද්ගලික අංශයේ සේවකයින්ට 40%ක වැඩි වැටුප් ඕනෑ



ගෑස් මිල වැඩිවීම ඇතුළු සියලු බඩු මිල වැඩිවීම හමුවේ පෞද්ගලික අංශයේ සේවකයා දැඩි පීඩනයකට පත්වී ඇති බවත් වහා බඩු මිල පහත හෙළිය යුතු බවත් එසේ නොවන්නේ නම් 40%ක පඩි වැඩිවීමක් ඔවුන්ට ලබා දිය යුතු බවත් අන්තර් සමාගම් සේවක සංගමය පවසයි. එම සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා මේ බව පැවසුවේ මාධ්‍ය හමුවක් අමතමිනි.

එසේම ඔහු එහිදී පැවසුවේ අපේ රටේ ශ්‍රම බලකායෙන් ලක්ෂ 40ක් කඩසාප්පුවල වැඩකරන සේවකයාගේ සිට මහා පරිමාණ කර්මාන්තශාලා දක්වා පුද්ගලික අංශයේ සේවකයිනුයි. පහුගිය දින කිහිපය තුළ 40%කින් බඩු මිල වැඩි වී තිබෙනවා. මේ හැම කෙනෙකුටම බඩුමිල ඉහළ යාම අදාළයි. ඒ කියන්නෙ රු. 20,000ක් වැටුපක් ගන්න කෙනෙකුට තව අමතර රු. 8000ක් ඕන වෙනවා. ඒ විසිදාහෙ පඩියෙන් ජීවත්වුණු විදිහට ජීවත්වෙන්නත්.

ඒ නිසා අපි ආණ්ඩුවෙන් අහනවා, මොකක්ද ආර්ථික සැලැස්ම මේ තරමට බඩුමිල වැඩිකරලා ජීවත්වෙන්න අරින්න. මේ බඩුමිල වැඩිවීමත් එක්ක පුද්ගලික අංශයේ සේවකයා ජීවත්වෙන්නෙ අතිශය දුෂ්කර හා අපහසුතා මැදයි. මොළ හතේ මුදල් ඇමතිගෙ පළවෙනි අයවැය එනවා නොවැම්බර් මාසයේ. ඒ නිසා මොළ හත හිස් කළගෙඩි හතක් බවට පත්නොකර පුද්ගලික අංශයේ සේවකයාට 40%කින්වත් පඩි වැඩි වැඩිවීමට අවශ්‍යයි. ඒ පඩි වැඩිවීමට අදාළ පනත්, නීති පාර්ලිමේන්තුවට ගේන්න. බඩගින්න දරුණුයි. එක්කෝ බඩු මිල අඩුකරනු, නැත්නම් වැටුප් වැඩිකරනු,

මෙම මාධ්‍ය හමුවේදී අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරි සහ නීති ලේකම් සුජීව සුභසිංහ යන සහෝදරවරුද අදහස් දැක්වූහ.

### ඉතිරි...

## අලුත් දේශපාලන ගමනට...

1 පිටුවෙන්..



කළ පාලනයක්. මේ පාලනය නීතියේ විධානය බිඳවට්ටවා අධිකරණයේ ක්‍රියාදාමය හෑල්ලුවට ලක්කර වංචනිකයන් දූෂිතයන් නිදහස් කරන බව ඔප්පුකොට තිබෙනවා. මේ නිසා මේ ආණ්ඩුව පිහිටුවීමට ඡන්දය දුන් ජනතාව වගේම අනෙකුත් සියලුම ජනතාව මෙම පාලනය වෙනස් කළ යුතුයි කියන ස්ථාවරයකට අද පැමිණ තිබෙනවා.

දීර්ඝ කාලයක් තිස්සේ ජනතාව පැවැති පාලනයන් පලවා හැර බලාපොරොත්තු සහිතව අලුත් පාලනයන් අපේ රටේ ජනතාව විසින් පිහිටුවා තිබෙනවා. නමුත් වර්තමාන පාලනයද තමන්ගේ අසාර්ථකභාවය කෙටි කාලයක් තුළ නැවත ඔප්පු කර තිබෙනවා. ඒ නිසා තවදුරටත් පැරණි අසාර්ථක දේශපාලන, ආර්ථික ගමන් මඟ නියෝජනය කරන දේශපාලන ව්‍යාපාරයක් වෙනුවට අපේ රට නව ආර්ථික දේශපාලන ගමනක් නිර්මාණය කරන නව බලවේගයක් වටා ඒකරාශී විය යුතුයි කියන පණිවිඩය ජනතාවට ලබාදෙනවා. මේ රට හෙළා තිබෙන අගාධයෙන් ගොඩගැනීම සඳහා විසඳුම් යෝජනා සහ අදහස් ජනතාවට තිබෙනවා. ඒ යෝජනා සහ අදහස් ලබාගනිමින් ගමට යන වැඩසටහනේ ආරම්භක දිනය අදයි. අද සිට සියලු දිස්ත්‍රික්කවල මෙම ව්‍යාපාරය දියත් කරනවා. පක්ෂයේ සියලුම වගකීම් දරන සහෝදර සහෝදරියන් බිම් මට්ටමේ පුරවැසියන් එක්ක මේ සංවාදය ගෙන යන්න අපි සැලසුම් කර තිබෙනවා.

අලුත් මාවත පිළිබඳව ජනතාවට නව බලාපොරොත්තුවක් ඇති කරන්න, ජනතාව සක්‍රීයව ඊට මැදිහත් කර ගන්න සහ විශේෂයෙන්ම ගමේ පිරිස් මුණගැහෙන්න එන ලෙස කර තිබෙන ආරාධනාව අනුව මේ ක්‍රියාවලිය අප විසින් දියත් කර තිබෙනවා. නොවැම්බර් පළමුවැනිදා ආරම්භ කරන මේ වැඩසටහන අපේ රට අලුත් දේශපාලන ගමන සඳහා විශාල ධෛර්යයක් සහ විශ්වාසයක් සපයන බව පැහැදිලියි."

## පොහොර වංචාව ගැන

01 පිටුවෙන්..



තිබෙනවා. ශ්‍රී ලංකාවේ රජය යටතේ පොහොර සමාගම් දෙකක් ඇති නමුත් එම සමාගම් මෙම ගනුදෙනුවට සම්බන්ධ බවට තොරතුරු නැහැ. ඒ වෙනුවට එම ගනුදෙනුවට සිදු වී තිබෙන්නේ පුද්ගලික ගිණුමක මුදල් හුවමාරුවක් මගිනුයි. මේ අය ඉන්දියානු සමාගමේ දේශීය නියෝජිතයින් නම්, ඔවුන්ට විදේශ මුදල් හුවමාරු ගිණුමක් තිබිය යුතුයි. කොහොම වුණත් එම ගිණුම ආරම්භ කර තිබෙන්නේ ඔක්තෝබර් 18දායි. එදිනම තමයි භාණ්ඩාගාරයෙන් මුදල් මෙම ගිනුමට හුවමාරු වන්නේ. එය වෙනම ප්‍රශ්නයක් හැටියට තිබෙනවා.

ඇමතිවරයා කැබිනට් සංදේශය මගින් අවශ්‍ය ගෙවීම් කිරීමට ණය පහසුකම් ලිපියක් අදාළ බැංකුව වෙතින් භාණ්ඩාගාරය හරහා නිකුත් කරන්න කියලා එම කැබිනට් සංදේශයේ ඉල්ලා තිබෙනවා. විවෘත ටෙන්ඩර් පටිපාටියක් හරහා මෙම මිලදී ගැනීම සිදුකළ යුතුව තිබුණත් හදිසි මිලදී ගැනීමක් ලෙස ටෙන්ඩර් පටිපාටියකින් තොරව සිදුකරන්න ගිහින් දැන් හත්පොලේ ගාගෙන තිබෙනවා. එලෙස අනුමත වුණු කැබිනට් තීරණය වෙනස් වුණේ කොහොමද කියලා මේ රටේ ජනතාව දැනගන්න කැමතියි. මෙතන තවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එනම් කැබිනට් තීරණය දැනුම් දෙන්නේ ඔක්තෝබර් 19 වැනිදා වන අතර, පුද්ගලික ගිණුමට මුදල් හුවමාරුව සිදුවී තිබෙන්නේ කැබිනට් තීරණය ලැබීමටත් පෙරයි. එනම් ඔක්තෝබර් 18වෙනිදායි. එනිසා මෙතන ගැටලු ගණනාවක් මතුවෙනවා.

මෙම ගනුදෙනුව සඳහා යොදාගත් කෝටි 29ක මුදලේ විශාල වංචාවක් සිදු වී තිබෙනවා. මහජන බැංකුවේ සභාපතිවරයා පවා කියනවා මෙවැනි ගිණුමක් හරහා මෙම ගනුදෙනුව සිදුවෙන බව තමන් දැනගෙන හිටියේ නැති බව. ඩොලර් මිලියන 1.257ක් කියන්නේ සුළු මුදලක් නොවේ. එවැනි මුදලක් ගනුදෙනු වනවිට ඒ පිළිබඳ ජනතාවට විනිවිදභාවයක් තිබිය යුතුයි. අපේ රටේ ගොවි ජනතාව පොහොර ඉල්ලද්දී, මෙතරම් විනිමය අර්බුදයක් තිබෙද්දී, ඩොලර් සංචිත හිඳෙමින් තිබෙද්දීත් තිබෙන ඩොලර් ටිකත් හොරකම් කරන මට්ටමකට මේ ආණ්ඩුව පත්ව තිබෙනවා."

## මිල තීරණය කරන්නේ

01 පිටුවෙන්..



මෙහෙම තියෙද්දී ගෑස්, කිරිපිටි, පාන්පිටි, සිමෙන්ති මිල පාලනයන් ඉවත් කළා. මේක ඩොලර් පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. ඩොලර් ප්‍රශ්නයක් නම් හාල් මිල පාලනය ඉවත් කරන්න අවශ්‍ය නැහැ. ජනාධිපතිවරයා කොයි තරම් කටින් බතල කොළ හිටෙව්වත් හාල් මිල තීරණය කළේ මෝල් හිමියන්. හාල් මිල තීරණය කරන්න ජනාධිපතිවරයාට හෝ ආණ්ඩුවේ කාටවත් බැරි වුණා. ගෑස්, කිරිපිටි, පාන්පිටි, සිමෙන්ති මිල තීරණය කරන්නේ කොම්පැනිකාරයෝ.

ආණ්ඩුවේ මැති ඇමතිවරුන් පැන්ඩෝරාවල ඩොලර් හංගමින් ඉන්නේ. පසුගිය කාලයේ කළ හොරකම් දූෂණ මිනීමැරුම්වලින් නිදහස් වෙන්නේ කොහොමද කියලා ආණ්ඩුව කල්පනා කරන්නේ. ජනාධිපතිවරයා එක රටක් එක නීතියක් ගැන කොච්චර කිව්වත් මහ පොළොවේ එහෙම එකක් නැහැ. ආණ්ඩුවේ පාලනයෙන් තොරව සියලු දේවල් සිද්ධ වෙන බව ජනතාව අත්විඳිමින් ඉන්නවා. දැන් ක්‍රියාත්මක වෙන්නේ හේනේ කුඹුරේ හිටවලා ඉන්න පඹයා බියවද්දලා සත්තු භෝගවලට හානි කරනවා වගේ වැඩක්. මේ නිසා ජනතාව මහත් පීඩාවකට පත්වී සිටිනවා. මේ නිසා දැන්වත් ජනතාව පවතින තත්වය හරියට තේරුම් ගන්න ඕනෑ. ආර්ථිකය ගොඩ ගන්න තියා පවතින තත්වයෙන් පවත්වා ගන්නවත් මේ ආණ්ඩුවට බැහැ. ඒ නිසා ආර්ථිකය කඩා වට්ටවන ආණ්ඩුවට එරෙහිව මේ තත්වය වෙනස් කිරීම වෙනුවෙන් පෙළගැහෙන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා."

## පොහොසත් කළ හැකි රටක්,

07 පිටුවෙන්..

අහිමි කරනු ලැබ ඇත. ඔවුන්ට පොහොර ඉල්ලා සිටින්නේ විසිතුරු භාණ්ඩයක් ලෙස නිවසේ තබා ගැනීමට නොවේ; කෘෂි නිෂ්පාදනය සඳහාය. අද ඉහළ යන සහල් මිල පාලනය කර ජනතාවට අවශ්‍ය බත සැපයිය හැක්කේ ඒ නිෂ්පදනය සම්පූර්ණ කිරීමෙන් පමණි. නැතිනම් සහල් ආනයනයට නැවත ඩොලර් සෙවිය යුතුය. අර්බුදයට විසඳුම් සෙවීමට වගාකරන ගොවියාද අද අසරණය. වගාවෙන් ස්වයංපෝෂිත කළ හැකි කෘෂිකර්මාන්තයක් අද රටක් ණය කරන එසේම ඉදිරියේ ආහාර හිඟයකින් මුළු මහත් ජනතාවම සාගතයකට කැඳවන තත්වයට රටම පත්කර හමාරය.

**ශ්‍රී ලංකා මුදල් මුද්‍රණ බැංකුව !**

මුදල යනු වටිනාකම නොවන්නේය. මුදල සිදුකරන්නේ වටිනාකම හුවමාරු කිරීමය. වටිනාකම නිර්මාණය කරන්නේ භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදීය. භාණ්ඩ නිෂ්පාදනයක් තුළින් වටිනාකම් බිහි නොකර කාසි හා නෝට්ටු මුද්‍රණය කරන්නේ නම් එයින් සිදුවන්නේ පවතින භාණ්ඩවල මිල ඉහළයාම පමණි. ඒ, වටිනාකම නැති කාසි හා නෝට්ටුවලට කළ හැකි දෙයක් නැති නිසාය. මේ ධනේශ්වර පාලකයන් නොදන්නා පරම ආර්ථික සත්‍යයක්ය. අද පාලකයන්ගේ විසඳුම වී ඇත්තේ අතීසාරයට අමුඩ ගසන්නාක් මෙන් මුදල් අච්චු ගැසීම පමණි. එයින් ඔවුන් ඇත්ත වටිනාකම නිෂ්පාදනය නොකර බලය සඳහා ආර්ථිකය තාවකාලික බැලූනයක් තත්වයට පත් කරයි. අද ලංකාවට සිදුව ඇත්තේ මේ ඉරණමයි. නාස්තිය, දූෂණයට තිත තබා නිෂ්පාදන ආර්ථිකයක් මගින් සැබෑ වටිනාකම නිපදවන ක්‍රියාවලියක් වෙත රට යොමු කිරීමෙන් තොරව මේ බැලූනය පිපිරීම නතර කළ නොහැකිය.

බොහෝ දෙනා අද මේ පවතින ආර්ථික අර්බුදයට තාවකාලිකව හෝ විසඳුමක් නැතිදැයි විමසති. මේ ලාභයම පමණක් අරමුණු කරගත්, කෑදර කොමිස් වෙනුවෙන් රටම අනතුරට හෙළන දේශපාලන ක්‍රමය වෙනස් නොකරන තාක් කල් ආර්ථිකයේ අර්බුදයට පැලැස්තරවලින් විසඳුමක් නොවන බව පැහැදිලිය. වත්මන් රාජපක්ෂ රෙජීමය ඇතුළුව මේ වැරදි රට බංකොලොත් කරන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නගන කවර වර්ගයේ පාලනයකට වුවද කළ හැක්කේ, පොහොසත් කළ හැකි රටක් හා ජනතාවක් තව තවත් දුප්පත්කමට ඇදගෙන යාම පමණි. එය වෙනස් කළ හැක්කේද මේ දේශපාලන ක්‍රමය වෙනස් කිරීමට පළමු පියවර තබන ජනතාවටම පමණි.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# රට හැර යමුද? රට හදමුද?

පසුගිය දිනවල පැවැති කොවිඩ් 19 සංචරණ සීමා මඳක් ලිහිල් වීමත් සමග මෙරට ජනයා විශේෂයෙන් තරුණ තරුණියන් විශාල වශයෙන් විදෙස් ගත වීමට උත්සාහ කරනු පෙනෙන්නට තිබුණි. ගුවන් ගමන් බලපත්‍ර නිකුත් කරන කාර්යාල ඉදිරිපිට හා වීසා නිකුත් කරන ස්ථාන ඉදිරිපිට නිර්මාණය වූ දිග පෝලිම් විසින් හා එකී පෝලිම්වල සිටි අය ජනමාධ්‍යවලට පළ කළ අදහස් මගින් පැහැදිලි වූයේ මේ බොහෝ දෙනා රට හැර යාමට හදන්නේ රට ගැන, රටේ දේශපාලනය ගැන කලකිරීමෙන් බවය.

සැබැවින්ම මේ සිදුවී තිබෙන්නේ කුමක්ද? පසුගිය ජනාධිපතිවරණයේදී මෙරට තරුණ පරම්පරාවත්, වෘත්තිකයනුත් ගෝඨාභය රාජපක්ෂ ජයග්‍රහණය කිරීමට උපරිමයෙන් මැදිහත් වූයේ විනයගරුක, ලස්සන රටක් පිළිබඳ අවංක අපේක්ෂාවෙනි. එකල විදෙස්ගතව සිටි ශ්‍රී ලාංකිකයන් පවා අතින් මුදල් වියදම් කරගෙන ලංකාවට ආවේ ගෝඨාභය ජනාධිපති කර, 'ඉන්න හිතෙන රටක්' නිර්මාණය කර ගැනීමටය.

එහෙත් දැන් සිදුව ඇත්තේ කුමක්ද? ඉන්න හිතෙන රටක් නිර්මාණය කර ගැනීම සඳහා ගෝඨාභය ඇතුළු ආණ්ඩුව දිනවූ ජනයාට ආණ්ඩුව එපාවී රටත් එපාවීමය. දැන් ලංකාව ඉන්න හිතෙන රටක් නොව යන්න හිතෙන රටකි.

අපේ රටේ වෙන කිසිදු කලෙක නොවූ තරමේ අපේක්ෂා රැසක් ගෝඨාභය පාලනය පිළිබඳ තරුණ පරපුර ඇතුළු මෙරට ජනතාව තම සිත් තුළ දරාගෙන සිටියහ. ඔවුන් විසින් සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ තම අදහස් පළ කරමින්, විවිධ සමාජ ජාලා කණ්ඩායම් නිර්මාණය කරමින්, ගීත නිර්මාණය කරමින්, ප්‍රසිද්ධියේ මත පළ කරමින් කරන ලද මැදිහත් වීම සුළුපටු නොවේ. ඒවා කරන ලද්දේ අවංක ලෙසම රට තුළ වෙනසක් සිදුකරනු ඇතැයි යන අපේක්ෂාවෙනි.

මෙම අපේක්ෂාව කෙතරම් ප්‍රබලද යත් ගෝඨාභය රාජපක්ෂ මහතා ජයග්‍රහණය කළ වහාම ස්වේච්ඡාවෙන් පාරට බැසගත් තරුණයෝ ලස්සන රටක් වෙනුවෙන් තම අතින් මුදල් වියදම් කරගෙන, නිදිවරාගෙන තාප්පවල චිත්‍ර ඇඳීමේ ව්‍යාපාරයක්ද ආරම්භ කළහ. එම චිත්‍ර ඇඳි තාප්ප අසල මෙතරම් ඉක්මනින් වල්බිහිවනු ඇතැයි ඔවුන් නොසිතන්නට ඇත.

එසේම තවත් තරුණ පිරිසක් පුරන් වූ කුඹුරු අස්වැද්දීමේ ව්‍යාපාරයක්ද ස්වේච්ඡාවෙන් ආරම්භ කළෝය. ඒ, රට සෞභාග්‍යය කරා ගෙන යාමට දිරි දීමක් හා ආදර්ශය දීමක් ලෙසය. එහෙත් දැන් සිදුව තිබෙන්නේ කුමක්ද? රාජපක්ෂවරුන්ගේ පාලනය ආරම්භ වූයේ පුරන් වූ කුඹුරු අස්වද්දමින් වුවත් දැන් අස්වද්දමින් සිටි කුඹුරු පවා පුරන් වන තත්වයට රට පත්ව ඇත. ඒ, පොහොර හා කෘෂි රසායන සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ගත් හදිසි දුර නොදකින මුග්ධ තීරණය නිසාය.

අවසානයේ 'සෞභාග්‍යයේ දැක්ම' සහිතව බලයට ආ ගෝඨාභය ජනාධිපතිවරයාට කිසිදු දැක්මක් නැති බවත් ඔහු දේශපාලන ළදරුවෙකු බවත් ඔප්පු වී තිබේ. සිය පාලනය ආරම්භයේ ජාතිය අමතා පරිප්පු කිලෝව රුː 65/-ටත් සැමන් රුː 100/-ටත් දෙන බව පැවසූ, සහල් මිල පාලනය කිරීමට නාරාහේන්පිට තොග කඩවලට ගොස් සංදර්ශන පෙන්වූ ජනාධිපතිවරයා මෑතකදී පවසා තිබුණේ සහල්, පරිප්පු, සීනි මිල අඩු කිරීම වැනි ප්‍රශ්න ජනාධිපතිවරයාගේ කාර්යය නොවන බවය.

එපමණක් නොවේ රටේ ජනයා බලාපොරොත්තු වූ නීතිය සැමට සාධාරණ, නීතිගරුක රටක් විනයගරුක රට දැන් නැත. පවුලේ අයට වුවත් ගෝඨාභය සමග සෙල්ලම් බැහැ යයි පැවසුවද, දැන් පවුල් පාලනයම තහවුරු වී ඇත. සියල්ල අවුල් ජාලයක් වී අරාජික වී ඇත. වියත් මඟ අහලකවත් නැත. කිසිවකට වගකීමට කිසිවෙකුත් නැත. එක් අතකින් පරිසර විනාශය දිගටම සිදුවේ. අනෙක් අතින් වංචා - දූෂණය. ආර්ථිකය බිඳ වැටිලාය. බඩු මිල වැඩිවී ඇත. ජනතාව පෝලිම්වලය. බැරිකම අසමත්කම සැම අතින්ම පෙනෙන්නට පටන්ගෙනය.

අවංක අරමුණකින් ගෝඨාභය ජනාධිපති කිරීමට වෙහෙස මහන්සි වුවත් දැන් සිදුව ඇත්තේ සියලු අපේක්ෂා බිඳ වැටී ලජ්ජාවටත් අවමානයටත් පත්වීමටය. තමන් ඇසුරු කළ සමාජයට මුහුණ දීමට නොහැකි තත්වයකට බොහෝ දෙනා පත්ව සිටිති. ඔවුහු රාජපක්ෂ පාලනය විසින් පාවා දෙනු ලැබ සිටිති. තරුණ පරපුර රට හැර යාමට තීරණය කර ඇත්තේ මෙකී තත්වය තුළය. මේ තත්වයෙන් පලා යනවා හැර, වෙන විකල්පයක් නැතැයි ඔවුන් සිතනවා වන්නට පුළුවන.

එහෙත් නිර්මාණය වී ඇති අර්බුදයටත්, තමන් පාවාදීමට ලක්ව බලාපොරොත්තු කඩවීමේ වේදනාවටත් පිළිතුර රට හැර යාම නම් නොවේ. මේ රට අප හැදිය යුතුය; හැදිය හැක. දැන් අවශ්‍ය වන්නේ ඈත අතීතයෙන් මෙන්ම ඉතාම මෑත අතීතයෙන්ද පාඩම්, අත්දැකීම් රැගෙන රට ගොඩනැගිය හැකි නිවැරදි විශ්වාසනීය නව දේශපාලන මඟකට ධෛර්යයෙන් අවතීර්ණය වීමය.

ජනතාවගේ අපේක්ෂා පාවාදී රට විනාශ කළ පාලකයන් රටේ ඉතිරිකොට හොඳ මිනිසුන් රට හැර යාම හෝ නිහඬවීම නිවැරදි විසඳුම නොවේ. ඒ වෙනුවට තමන් අපේක්ෂා කළ ලස්සන රට යහපත් සමාජය ගොඩනැගීමට විකල්ප දේශපාලන මඟක් ගත යුතුය. ඒ කරුණේදී මෙරට ජනතාවට, තරුණ පරපුරට දැන් විශ්වාසය තැබිය හැකි එකම බලවේගය වන්නේ ජනතා විමුක්ති පෙරමුණත්, ජාතික ජන බලවේගයත්, එය විසින් ඉදිරිපත් කරන වැඩපිළිවෙළත්ය. එය වටා එකතුවීම හැර හොඳ මිනිසුන්ට දැන් වෙනත් විකල්පයක් නැත.

# අර්බුදය උග්‍ර කරන ආණ්ඩුවේ 'විසඳුම්' හා අප ගත යුතු මඟ

ලංකාවේ පසුගාමී බංකොලොත් ධනවාදී ක්‍රමයත් එය පවත්වාගෙන යන රාජපක්ෂ පාලනයත් මුහුණදී සිටින්නේ ගොඩ ගත නොහැකි අර්බුද රැසකටය. එක් අතකින් නිෂ්පාදන මාර්ග බිඳවැටීම, නාස්තිය, වංචාව හා දූෂණ, මහජන මුදල් හොරකම් කිරීම, අවිද්‍යාත්මක හා අවිධිමත් තීන්දු තීරණ, පාදඩ දේශපාලන සංස්කෘතිය නිසා ආර්ථිකය විනාශ වී, රට ණය බරින් මිරිකී තිබේ. භාණ්ඩ පෝලිම්, බඩුමිල ඉහළයාම හා ආදායම් මාර්ග බිඳ වැටීම නිසා පොදු ජනතාව විශාල පීඩාවකය. මෙම පීඩාව, අර්බුදය හමුවේ ජනාධිපති ගෝඨාභය ඇතුළු රාජපක්ෂ ආණ්ඩුවේ 'විසඳුම් ක්‍රියාමාර්ග' අර්බුදය තව තවත් වැඩිකරන්නක්ම වී තිබේ.

ධනවාදයේ අර්බුදයට ධනපති පාලකයන් සතුව විසඳුම් නොමැති බව අපි දනිමු. මේ පිළිබඳ වරක් ලෙනින්, ප්‍රකාශ කර තිබුණේ 'ධනපති ක්‍රමයේ අර්බුදයෙන් මිදීමට ධනපති පංතිය දරන උත්සාහය, අයෙක් තමන්ගේම සපත්තුවල පටිවලින් ඇද තමාවම ඔසවා ගැනීමට උත්සාහ දැරීමක් වැනිය' යනුවෙනි. ලංකාවේදී මෙය මීටත් වඩා හාස්‍යජනක වී තිබේ.

විශාල ආර්ථික අර්බුදයකට රට මුහුණදී සහල් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනය කර ගැනීමට නොහැකිව සිටින වේලාවක රසායනික පොහොර හා කෘෂි රසායන ගෙන්වීම එකවිට නැවැත්වීමට ගත්, ජනාධිපතිවරයාගේ තීරණය තේරුම් ගත යුත්තේ කෙසේද? මෙම තීරණයට ගොවීන් කෘෂි විද්‍යාඥයන් ඇතුළු රටේ හැමදෙනාගේම විරෝධය පළ වී තිබේ. මේ තීරණය නිසා අනිවාර්ය ලෙසම කෘෂිකර්මාන්තය විනාශ වී, ගැමි ආර්ථිකය බිඳවැටී, ආහාර හිඟයක්ද, ඇතිවීම වැළැක්විය නොහැක. අනෙක් අතට තේ වගාව ඇතුළු අපනයන බෝග වගාවද විනාශ වෙමින් තිබේ. රටට විදෙස් මුදල් හිඟ වී ණය සඳහා හිඟමන් යදින ආණ්ඩුවම විදෙස් මුදල් ලැබෙන ප්‍රධාන නිෂ්පාදන මාර්ග විනාශ වන තීරණ ගැනීම ආණ්ඩුවේ උද්ධච්චකමද? නැතහොත් මෝඩකමද? ජනාධිපතිවරයා සිතා සිටින බව පෙනෙන්නේ මේ තීරණය 'විප්ලවීය තීරණයක්' ලෙසය. ඔහු අවට සිටින ප්‍රශස්තිකරුවෝද එය නියම තීරණයක් බව පවසමින් 'රාජා අන්දන' බව පෙනේ. ප්‍රශ්නය රජා වටේ සිටින රජවාසල කවටයන් රාජාව ඇන්දීම නොව රජාද කැමැත්තෙන්ම 'ඇඳ ගැනීමය'. දැන් රජු සිටින්නේ සීතාම්බරපටය ඇඳගෙන බව ඔහු කරන කතාවලින් හා වැඩවලින් ඉතා පැහැදිලිය.



ඒ අතර රසායනික පොහොර වෙනුවට, ගෙන්වනවාය කියන ඊනියා කාබනික පොහොර එක් ආකාරයකින් ජාවාරමක් වී තිබෙන අතර අනෙක් අතින් රටට පරිසරයට, කෘෂිකර්මාන්තයට අලුත් අනතුරක් ඇති කරන අහිතකර ද්‍රව්‍යවලින් පිරි එකක් වී තිබේ. ආණ්ඩුව දැන් කරමින් සිටින්නේ කුමක්ද? මෙම වරද පෙන්වා දෙන විට එය වටහාගෙන වරද නිවැරදි කර ගැනීම නොව, වරද පෙන්වා දෙන නිලධාරීන් හා විශේෂඥ දැනුම ඇති අය තනතුරුවලින් එලවා දැමීමය. ඉන් සිදුවන්නේ අර්බුදය හා විනාශය අවම කරගැනීමේ මාවත් වැසී ගොස් විනාශයේ මාවත් පුළුල් වීමය. ඉතා පැහැදිලිව රාජපක්ෂවරු දැන් රට ඇදගෙන යමින් සිටින්නේ සෞභාග්‍යයේ මාවතේ නොව 'අපායට' යන මාවතේය.

ගෝඨාභය රාජපක්ෂ බලයට ආවේ 'එක රටක්! එක නීතියක්! හදන බව පවසමිනි. එහෙත් ගෙවුණු වසර දෙකක පාලනය තුළ සිදුවූයේ එක රටක් තුළ තමන් කැමති නීතියක් හැදීමය. ආණ්ඩුවට සම්බන්ධ අපරාධකරුවන්ගේ හා දූෂිතයන්ගේ සියලු නඩු පෝලිමට ඉල්ලා අස්කර ගනිමින් සිටින ආණ්ඩුව නීතිපති දෙපාර්තමේන්තුව යොදා ගනිමින් සිටින්නේ වැරදිකරුවන්ට නඩු පවරන ආයතනය ලෙස නොව දූෂිතයන්ගේ නඩු ඉවත් කරන ආයතනය ලෙසය.

පාස්කු ප්‍රහාරයේ කතාවද මෙයටම අදාළය. වත්මන් ආණ්ඩුව බලයට ආවේ පාස්කු ප්‍රහාරයේ සමාජ කම්පනය තම වාසියට යොදා ගනිමිනි. ජාතික ආරක්ෂාව සලසන බවටත්, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවන් සොයා දඬුවම් කරන බවටත් එකල සහතික දෙන ලදී. එහෙත් බලය ගත් පසු එය නොසලකා හැරි ආණ්ඩුව ප්‍රහාරයේ වින්දිතයන්ද අමතක කළේය. අවසානයේ කාදිනල්තුමා ඇතුළු කතෝලික ප්‍රජාව මේ ප්‍රහාරයේ වගකීම පිළිබඳව ආණ්ඩුවට ඇඟිල්ල දිගු කළේය. සැකය ආණ්ඩුව වෙත යොමු විය. සැබෑ ලෙසම පරීක්ෂණ පවත්වා සැකය දුරුකරනු වෙනුවට ආණ්ඩුව කළේ තමන්ට චෝදනා එල්ල කරන අය බිය වැද්දීමට උත්සාහ කිරීමය.

මෙහි හාස්‍යජනකම ජවනිකාව පසුගියදා සිදු විය. ඒ ජනාධිපතිවරයා විසින් ඔක්තෝබර් 26දා අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් 'එක් රටක් - එක නීතියක්' ගොඩනැගීම සඳහා ජනාධිපති කාර්ය සාධන බලකායක් පත් කිරීමය. එකී බලකායේ ප්‍රධානියා ලෙස ජනාධිපතිවරයා පත් කරනු ලැබ ඇත්තේ බොදුබල සේනා ප්‍රධානී ගලබොඩ අත්තේ ඥාණසාර හිමිය. (සිනහා නොවන්න!) ජනාධිපතිවරයා එක රටක් - එක නීතියක් හදන්නට යන්නේ කෙසේද යන්න දැන් පැහැදිලිය. මේ පෙන්වන්නේ වියත්මඟ පෙරටු කරගත් විද්‍යාත්මක පාලනයක හැටිය. අහෝ රටකට ගිය කල! යැයි කෙනෙකුට සිතීම දැන් පුදුමයට කරුණක් නොවේ.

ජනාධිපතිවරයා පසුගියදා තවත් අපූරු ප්‍රකාශයක් කළේය. ඒ හාල්, සීනි, පරිප්පු මිල අඩු කිරීමට ජනාධිපතිවරයෙක් අවශ්‍ය නොවන බවය. ඒවා ජනාධිපතිවරයෙකුගේ කාර්ය නොවන බවය. මෙහිදී අපට සිහිවන්නේ මිදි තිත්ත බව කී නරියාගේ කථාවය. පසුගිය වසරේ කොරෝනා වසංගතය පැතිරෙන විට ජාතිය අමතා පරිප්පු රුපියල් 65/-ටත් සැමන් රුපියල් 100/-ටත් දෙන බව ප්‍රකාශ කළේද මේ ජනාධිපතිවරයාමය. එපමණක් නොව හාල් මිල පාලනය කිරීමට නාරාහේන්පිට තොග කඩ අස්සේ රිංගුවේද, බඩුමිල අඩුකරන කාර්ය සාධක බලකා හා ගැසට් ගැහුවේද මේ ජනාධිපතිවරයාමය. ඒ සියල්ල අසාර්ථක වූ විට දැන් ඔහු කියන්නේ ඒවා තමන්ට අයත් කාර්යයන් නොවන බවය. ගෝඨාභය රාජපක්ෂ මහතා පිළිබඳව එකල ජනමාධ්‍ය මගින් ගොඩනැගූ 'වීර ප්‍රතිරූපයට' රැවටී ඔහුට ඡන්දය දුන් අවංක මිනිසුන්ට දැන් සිදුවී තිබෙන්නේ 'මුහුණ හංගාගෙන' ලැජ්ජාවෙන් සිටීමටය.

පොදුවේ ගත් විට 'රජතුමා' විකටයාට ඇඳ ඇත්නම් ඉන් කියැවෙන්නේ අර්බුදය බරපතළ බවය. එබැවින් පවතින අර්බුදයන්ට විසඳුම් සෙවීමට යැයි පවසමින් ආණ්ඩුව ගන්නා වැරදි අදූරදර්ශී ක්‍රියා මගින් පෙන්වන්නේ අන්කිසිවක් නොව පවතින බරපතළ අර්බුදයට දැනට පවතින ආර්ථික හා දේශපාලන ක්‍රමය තුළ ධනපති පාලකයන්ට සැබෑ විඳුම් නොමැති බවය. දැන් 'ලිහා බැලූ මල්ල' 'ඔබා බැලීමේ' තේරුමක් නැත. ජනතාව නව දේශපාලන මගකට පිවිසිය යුත්තේ මේ නිසාය.

වර්තමානයේ රටත්, ජනතාවත්, රටේ ගෞරවයත් වනසා දමා ඇති, ඊට දායක වූ සියලු පාලක කණ්ඩායම්වලින් මිදී, යළිත් රැවටීමට ඉඩ නොදී නව දේශපාලන ගමනක් සඳහා පෙළගැසීම රැවටීමටත්, පීඩාවටත්, ලැජ්ජාවටත් පත්වූ ජනතාවගේ වගකීමය. එහිදී මෙරට ජනතාවට විශ්වාස තැබිය හැකි බලවේග වන්නේ ජනතා විමුක්ති පෙරමුණ හා ජාතික ජන බලවේගයය. ඒ සඳහා ජනතාව පෙරමුණට ආ යුතුය. ඒ සඳහා ගම්මට්ටමේ සිට බිම් මට්ටමේ සිට ජනතාව සංවිධානය විය යුතුය. ඔව් ! අපි ගමෙන් පටන් ගනිමු !







# YES WE CAN

# බලහත්කාරයට එරෙහිව

පසුගියදා අපේ රටේ විදෙස් සංචිතය සෘණ අගයක් ගත්තේ චීන, ඇමරිකානු හා ඉන්දියානු ව්‍යාප්තවාදයට තව තවත් දොරගුළු විවර කරමිනි. අපේ රටේ ආර්ථිකය කඩා වැටෙන දශමයක් පාසා අධිරාජ්‍යවාදීන් අපේ රටට කරන මැදිහත්වීම් අඩියෙන් අඩිය වැඩි කරමින් ඇත. රටට ඩොලර් වුවමනා වූ විට ලෝක බැංකුවෙන් ණයක් ගන්නේ විවිධ ආර්ථික කොන්දේසි මතය. ඛනිජ තෙල් ආනයනය කිරීමට ඩොලර් නොමැති නිසා ඉන්දියාවෙන් ඩොලර් ඉල්ලයි. ඉන්දියාව ඩොලර් දෙන්නේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමටත්, 13ට එහා ගිය බලතල පළාත් සභාවලට ලබාදීමට වත්මන් ආණ්ඩුව එකඟ කරගනිමිනි. දැන් ඉන්දියාවේ පදයට නටන්නට ආණ්ඩුවට සිදුවන්නේය. වත්මන් පාලනයට එහි හිරිකිතයක් නොමැත. මන්ද ඔවුන්ගේ පැවැත්ම දැන් පවත්තින්නේ අධිරාජ්‍යවාදී වුවමනාවනවලට හැකිතරමින් කීකරු වීමෙනි. නමුත් ඉන්දියානු බලහත්කාරය දියත් කරන්නේ අපේ රට මතය. එහි බලපෑමට ගොදුරු වන්නේ රටේ ජනතාවය.

එසේම ඛනිජ තෙල් පිරිපහදුවක් වෙනුවෙන් ඇමරිකාව ආයෝජනය කිරීමට සූදානම්ය. ඒ, කෙරවලපිටිය බලාගාරයේ කොටස්, ගෑස් පද්ධතිය ඉදිකිරීම, ගෑස් සැපයුම සඳහා ආයෝජනය කිරීම මුවාවෙනි. ඔවුන් ඉදිරි විදුලි නිෂ්පාදනයේ තීරකයා වීමටද සූදානම්ය. එමඟින් අපේ රටේ බලශක්තියේ අයිතිය මෙන්ම බලශක්තිය ලබාදෙනවාද නැද්ද යන්න තීරණය කිරීමේ අයිතිය ඇමරිකාව අතට නතු කිරීම වත්මන් පාලකයින්ට ගැටලුවක් නොවන්නේ ඔවුන් එම රාජ්‍යයන්හි පුරවැසියන් වන නිසාය.

චීනය අපේ රටේ ආර්ථිකයේ හදවත බඳු කොළඹ වරායෙන් කුණුකොල්ලයට ඉඩම් ලබාගන්නේ ඩොලර් ලබාදෙන පොරොන්දුව මතය. අදානිලාට බටහිර ජැටිය වෙන්දේසි කරන්නේ ඩොලර් අර්බුදයෙන් ගොඩ ඒමටය. මේ ක්‍රියාමාර්ග ආර්ථික අර්බුදයට කෙතරම් හානිකරද යන්න වත්මන් පාලකයින්ට අදාළ වන්නේ නැත. මන්දයත් ඔවුන් උත්සහා කරන්නේ මීළඟ අවුරුදු කිහිපය බලයේ සිටීමට පමණි.


අපේ රටේ යුදමය වශයෙන් ඉතාම වැදගත් ස්ථානයක් උසුලන්නේ ත්‍රිකුණාමලයයි. එහි වරායයි. එලෙස ඉතාම වැදගත් වරාය අවට භූමියෙන් ඉඩම් අක්කර තිස්තුන්දාහක් ඇමරිකාවට දීමට කැබිනට් මණ්ඩලය සාකච්ඡා කරමින් තිබෙන්නේ ඩොලර් වුවමනාව මතය. එය අපේ රටේ ජාතික ආරක්ෂාව බරපතළ අනතුරකට ඇද දැමීමකි.

මෙලෙස අපේ රටේ ආර්ථිකය දුර්වල වන දශමයක් පාසා අධිරාජ්‍යවාදීහු අපේ රටට රටේ ආර්ථිකයට හා ජාතික ආරක්ෂාවට මැදිහත් වෙමින්, එයට බලපෑම් කරමින්, එහි කොටස්කරුවන් වෙමින්, අවසානයේ එහි තීරකයන් හා පාලකයන් බවට පත්වෙමින් සිටිති. ලංකා අයි.ඕ.සී. සමාගම ඉන්ධන මිල රුපියල් පහකින් ඉහළ දමන්නේ එහි තීරකයන් තමන් බව පසක් කරමිනි. ඇමරිකානු නිව් ෆෝට්‍රස් එනර්ජි පුද්ගලික සමාගම කෙරවලපිටිය බලාගාරයේ 40%ක කොටස් තමන් නමින් ලියාගන්නේ තම රටේ පුරවැසියන් අපේ රටේ පාලකයින් බව උජාරුවෙන් සිහි කරමිනි. චීනය, ශ්‍රී ලංකා මහජන බැංකුව අසාදු ලේඛන ගත කරන්නේ තම ප්‍රමිතියෙන් තොර කාබනික පොහොර තොගය ලබා නොගැනීම වාඩුව සංසිදුවා ගැනීමටය; තම බලහත්කාරය පෙන්වීමටය.


මෙලෙස අධිරාජ්‍යවාදීන්ගේ හා බලවත් රාජ්‍යන්ගේ බලහත්කාරයන් වරින් වර අපේ රට මත මුදාහැරෙමින් තිබේ. රාජ්‍යයන් යටත් කරගැනීම මීට දශක ගණනාවකට පෙර සිදු වූයේ සෘජු යුදමය මැදිහත්වීම් මතය. දැන් එය ඉතාම මානුෂීය මුහුණුවරකින් සිදුකෙරෙමින් ඇත. පෙරට වඩා බලවත්ව හා සදාකාලිකව නිදහස් විය නොහැකි ආර්ථික උගුලක සිරකරුවන් කෙරෙමින් තිබේ. මේ බලහත්කාරය යොදවමින් සිදුකරන්නේ යටත් කරගැනීමට අවැසි වටපිටාව නිර්මාණය කරගැනීමය.

මෙම බලහත්කාරයට එරෙහිව ක්‍රියාත්මක විය යුතුය. නැතහොත් සිදුවන්නේ යටත්වැසියන් ලෙස, කොලනි වැසියන් ලෙස ජීවත්වීමටය. ඒ වෙනුවෙන් අපේ රටේ ආර්ථිකය දිනෙන් දින බංකොලොත් කරමින් අධිරාජ්‍යවාදීන්ට හා බලවත් රාජ්‍යයන්ට අපේ රටට මැදිහත්වීමට ඉඩකඩ විවර කරන ධනේශ්වර පාලකයින් පරාජය කිරීමට පෙළගැසිය යුතුය..

# හෙට වෙනස් කරන රටට ආදර්ශය චේ







අමරණීය විප්ලවවාදියෙකු වන චේ ගුවේරා සහෝදරයා මරා දමා පසුගිය ඔක්තෝබර් 08 වැනිදාට වසර 54ක් පිරිණි. එම දිනයට සමගාමීව සමාජවාදී තරුණ සංගමය විසින් සෑම වසරකම ඔක්තොර් 08 දින 'චේ දිනය' ලෙස නම් කර විවිධ වැඩසටහන් පවත්වනු ලැබීය. මෙවර ඔක්තෝබර් මාසය තුළ විවිධ වැඩසටහන් රාශියක් සංවිධානය කරන ලද අතර එහි තේමාව වූයේ 'හෙට වෙනස් කරන රටට ආදර්ශය චේ' යන්නය. පවතින වසංගත තත්වය හේතුවෙන් අන්තර් ජාලය ඔස්සෙ සහ ප්‍රධාන වැඩසටහන ඔක්තෝබර් 08 යහලකැලේ වත්ත, චේ උද්‍යානයේදී පවත්වනු ලැබිණි. එහිදී පුෂ්පෝපහාර දැක්වීම, චේ සිතුවම් කිරීම, සංගීත වැඩසටනක් හා දේශන කිහිපයකින් ප්‍රධාන උත්සවය පවත් වන ලද අතර ඒ සඳහා කියුබානු තානාපති ඇන්ඩ්‍රස් මාර්ෂෙලෝ ගොන්සාලෙස් මහතා, ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික ජිනදාස කිතුලෙගොඩ සහෝදරයා, ජ.වි.පෙ. ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී නන්දසීලි සහෝදරිය සහභාගි වී සිටියහ. එහි දී අංජන අමරසිංහ සහෝදරයා, එරංග ගුණසේකර සහෝදරයා සහ නන්දසීලී සහෝදරිය විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

ඔක්තෝබර් මස 10 වැනි දින සූම් තාක්ෂණය ඔස්සේ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවති අතර රැඩිකල් ගීත වැඩසහන, චේ දින දෙමළ භාෂා වැඩසටහන ආදිය අන්තර්ජාලය ඔස්සේ පැවැත්විණි.

# තාමත් පණ ගැහෙන, ඉල්මහ...

මව්බිමට ප්‍රේමයෙන්
අටෝප නැති,
ස්නේහයෙන්
හෙළු ලේ කඳුළු
පොඟවා නෙතත්,
හිතත්, බිමත්...
අපරිමිත ධෛර්යයෙන්,
හද පිරි භක්තියෙන්,
ලබ්-ඩබ්.. ලබ්-ඩබ්..
පපු ඇතුල ගිනි ලා
දැවී හළුකළ නොහැකි,
මානව පෙමින්
හෙටක් වෙනුවෙන්
අදක් කැපකොට
නොමියෙන,
සදහටම පදියම්ව
සන්තානයේ අසබඩ..
තබා නෙළුමක් සුපිපුණ
සියගණන් පෙති විහිද
සුවඳ තවරා විසුළ
මියෙන්න ඉඩ නොහළ
දයාවෙන් පිරිපුන්ව..
ලොවක් වෙනුවෙන්
බියක් නැති,
දුකක් නැති..
ලොව අගනාම වස්තුව
දිවිකුසුම දී පුදා
අපට..
හැර නොයා අප හිත්,
ගැඹුරේම ලැගුම්ගත්
තවමත් පණගැහෙන
හැමගේම හදවත
නුඹය...

# SYU වෙතින් පරිසර වැඩසටහන් රැසක්

## 'සුරකිමු විල්පත්තුව සංවිධාන එකමුතුව' ගොඩ නැගීම



මේ වන විට ශ්‍රී ලංකාව තුළ විශාල පරිසර විනාශයක් සිදුවෙමින් පවතී. වත්මන් ආණ්ඩුවේ දේශපාලඥයන් මැදිහත් වීමෙන් රටේ වනාන්තර රාශියක් පසුගිය කාලය පුරාම විනාශ කළ බව අපි දනිමු. මේ අතර එහි අලුත්ම විනාශය කෝමාරිකා වගාව සඳහා අක්කර 104,066 ප්‍රමාණයක් ඇමරිකානු සමාගමකට විකිණීමට සූදානම් වීමයි. මෙමගින් රාජාංගනය යාය 18 ප්‍රදේශයේ විල්පත්තු රක්ෂිතයේ ප්‍රේරක කලාපය විනාශවීමත්, ගොවීන්ගේ ඉඩම් අහිමිවීමත් ආදියට එරෙහිව සමාජවාදී තරුණ සංගමය හා සිවිල් සංවිධාන එකතුවක් ලෙස 'සුරකිමු විල්පත්තුව සංවිධාන එකමුතුව' පසුගිය ඔක්තෝබර් 03 වැනි දින ගොඩනගන ලදී.

## Express Pearl නෞකාවෙන් වූ හානියට වන්දි කෝ



Express Pearl නෞකාව ගිනිගෙන මාස 05ක් ඉක්මවා ගොස් ඇත. එයින් සිදුවූ සාගර ජීවීන්, කොරල්පර, සාගර ශාක ඇතුළු සාගර පරිසරයට සිදු වූ විනාශය පිළිබඳ ආණ්ඩුව දැන් නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටී. සමාජවාදී තරුණ සංගමය ලෙස දිගින් දිගටම මේ පිළිබඳ මැදිහත් විය. විරෝධතා හා ලිපි මගින් දැනුවත් කළද කිසිදු පිළිතුරක් මේ වනතෙක් ලැබී තිබුණේ නැත. එම නිසා මේ පිළිබඳ නැවත විමසීම සඳහා ඔක්තෝබර් 22වැනි දින අමාත්‍යංශය වෙත ගිය අතර එහි දී ඇමතිවරයාගේ පෞද්ගලික ලේකම්වරයා විසින් පැවසුවේ සතියක් ඇතුළත ඇමතිවරයා සමග සාකච්ඡාවක් ලබා දෙන බවයි.

මෙම අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, ශෂි පියුෂාන් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

## හුස්ම පොද රැකගනිමු



'හුස්ම පොද රැක ගනිමු' මැයෙන් සමාජවාදී තරුණ සංගමය විසින් මේ වන විට පැල සිටුවීමේ වැඩසටහන් රැසක් රට පුරා දියත් කරමින් ඇත. පසුගිය ඔක්තෝබර් 23 දින මී පැළ 1000ක් සිටුවීමේ වැඩසටහන කුරුණෑගල මාගල්ල දකුණු මහ ඇලේ බලගොල්ලාගම සිදු කෙරුණු අතර පසුගිය 24වැනි දින කුඹුක් පැල සිටවීමේ වැඩසටහනක් පුත්තලම පොත්තුකුලම බිදුණු වැව අසලදී ආරම්භ කරන ලදී.

## අපේ මන්දාකිණියෙන් පිටත පළමු ග්‍රහලෝකය හමුවෙයි



අපේ මන්දාකිණියෙන් පිටත ප්‍රථම ග්‍රහලෝකය නාසා දුරේක්ෂයකින් සොයා ගෙන ඇති බව විදෙස් වාර්තා පවසයි.

ඒ අනුව මෙතෙක් සොයාගෙන ඇති සෑම බාහිර ග්‍රහලෝකයක්ම දැක ගත හැකි වී තිබුණේ අපගේ මන්දාකිණියෙනි. එනම් ඒවා පෘථිවියේ සිට ආලෝක වර්ෂ 3000කට වඩා අඩු දුරකින් පිහිටා ඇත. විද්‍යාඥයින් පවසන පරිදි මෙම නව ග්‍රහලෝකය දළ වශයෙන් ආලෝක වර්ෂ මිලියන 28 ක් දුරින් පවතී. මෙය එ51 වශයෙන් නම් කර ඇත.

මෙම එ51 ග්‍රහලෝකය තහවුරු වුවහොත්, දැනට සොයා ගෙන ඇති බාහිර ග්‍රහලෝකවලට වඩා පෘථිවිය දහස් ගුණයක් ඈතින් පවතින බව විද්‍යාඥයෝ වැඩිදුරටත් පවසති.

## සූර්ය නිරීක්ෂණට චීනයෙන් චන්ද්‍රිකාවක්



චීනය සිය පළමු සූර්ය නිරීක්ෂණ චන්ද්‍රිකාව පසුගියදා තායිවාන් චන්ද්‍රිකා දියත් කිරීමේ මධ්‍යස්ථානයෙන් දියත් කළ බව වාර්තා වේ.

මෙම චන්ද්‍රිකාව සූර්ය දුරේක්ෂයකින් සමන්විත වන අතර එමගින් සූර්ය වර්ණාවලියේ ගැඹුරු රතු එච් ඇල්ෆා රේඛාව නිරීක්ෂණය කරන බවත් එමගින් විද්‍යාඥයින් සූර්ය ගිනිදැල් අධ්‍යයනය කිරීමට හැකි බවත් පවසයි. මෙම චන්ද්‍රිකාවේ බර කි.ග්‍රෑ. 550වන අතර එහි සැලසුම් කාලය වසර 3කි. පෘථිවිය වටා එහි කක්ෂය සූර්යයාට සාපේක්ෂව ස්ථාවරව තබා ගන්නා අතර එමගින් එය නිරීක්ෂණය, දත්ත රැස් කිරීම හා සූර්ය ප්‍රතිබිම්භ නිර්මාණය සිදු කරයි.

## මානව මුතුන්මිත්තන් වසර ලක්ෂ 7කට පෙර ගල් මෙවලම් භාවිත කරලා



අපගේ මානව මුතුන් මිත්තන් මීට වසර ලක්ෂ 7කට පෙර ගල් මෙවලම් භාවිත කර ඇති බවට සාක්ෂි නව සොයාගැනීමකින් හෙළි වී තිබේ.

ඒ අනුව පිලිපීනයේ හමු වූ ගල් ආයුධ 57ක් සමඟින් රයිනෝසිරස් ඇටසැකිල්ලක් මස් කර ඇති බවට සලකුණු හමු වී ඇත. එය වසර 709,000ක් පැරණිය. මෙම රයිනෝසිරස් ඇටකටු තුළ කැපුම් සලකුණු තිබී ඇති අතර ඒවා මස් කැපීමට අනුරූප වූවක් බව පර්යේෂකයෝ පවසති. තවද රයිනෝගේ අත් පා ඇට අතර ඇට මිදුළුවලට ප්‍රවේශ වීම්ද දැකිය හැකි බවටද වැඩිදුරටත් වාර්තා වේ.

## 'ෆේස්බුක්' 'මෙටා' ලෙස වෙනස් වෙයි




ෆේස් බුක් සමාගම විවිධාංගීකරණය කිරීමේ සැලැස්ම යටතේ සිය නාමය මෙටා ලෙස වෙනස් කිරීමට පියවර ගෙන ඇත. ඒ සමඟම එහි ලාංඡනයද වෙනස් කර ඇත.

ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ මෙන්ලෝ පාක්හි ෆේස් බුක් මූලස්ථානයේ පැවති වීඩියෝ තාක්ෂණ සමුළුවක් අමතමින් එහි නිර්මාතෘ මාර්ක් සකර්බර්ග් පැවසුවේ සමාගමේ නාමය සමඟ එහි අනාගත සැලසුම් නිරූපණය වන බවත්, මෙම නාමකරණය යටතේ එහි ප්‍රධාන සන්නාම වන ෆේස් බුක්, වට්ස්ඇප්, මැසෙන්ජර්, ඉන්ස්ටග්‍රෑම් වැනි යෙදවුම් නාමයන්ට බලපෑමක් නොවන බවත්ය.



# අඳුරු නොවැම්බරයේ ඇත්ත කථාව

ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයාත්, හිටපු ප්‍රධාන ලේකම් උපතිස්ස ගමනායක සහෝදරයාත් ඇතුළු ජ.වි.පෙ. නායකයන් අත්අඩංගුවට ගෙන මරාදමා මේ නොවැම්බර් 13 දිනට වසර 32ක් පිරේ. මේ ආශ්‍රිත කාලය තුළ තවත් විශාල ප්‍රමාණයක් ජ.වි.පෙ. නායකයන්, ක්‍රියාකාරීන් හා දේශප්‍රේමීන් පැවති එ.ජා.ප. පාලනය විසින් මරා දමනු ලැබූ බව සැඟවිය නොහැකි සත්‍යයකි. මව්බිමේ නිදහස වෙනුවෙන්, ජනතාවගේ විමුක්තිය වෙනුවෙන් සටන් වැද දිවිදුන් මේ සියලුම දෙනා සැබෑ මිනිසුන්ගේ හදවත් තුළ සදා අමරණීයත්වයට පත්ව සිටිති. කිසිවෙකුටත් එය වැළක්විය හැකි වන්නේ නැත.

32වැනි ඉල් සමරුව එළඹ ඇති මේ මොහොතේ අපගේ අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් තිබේ. ඒ, මෙම දේශප්‍රේමී අරගලය පිළිබඳව සතුරන් විසින් සමාජය තුළ ගොඩනඟා ඇති වැරදි මතයන් පරදවන්නේ කෙසේද යන්නය.

ඉතිහාසය ලියනු ලබන්නේ ජයග්‍රාහකයන් විසින් යැයි කියමනක් තිබේ. එය සත්‍යයකි. ඒ අනුව 1987න් ඇරඹී 1990 දක්වා වූ මෙම වකවානුව ගැන 'ඉතිහාසය' ලියා ඇත්තේද රට වෙනුවෙන් සටන් කොට දිවිපිදූ දේශප්‍රේමීන්ගේ පැත්තෙන්, විප්ලවවාදීන්ගේ පාර්ශ්වයෙන් නොව, රට පාවාදී ඊට එරෙහි වූවන් දහස් ගණනක් මරා දැමූ පාලකයන්ගේ දෘෂ්ටිකෝණයෙනි. එබැවින් දැන් '1988 - 89 භීෂණය' ලෙස සමාජ ගතකර තිබෙන්නේ ඝාතකයන් විසින් ලියන ලද ඉතිහාසයකි. සත්‍ය ඉතිහාසය නොවේ.

1987න් ඇරඹී 1990 මුලදී අවසන් වුණු ජ.වි.පෙ. හා දේශප්‍රේමී ජන කොටස් දායක වූ සන්නද්ධ අරගලය තුළ ජ.වි.පෙ. පැත්තෙන් සිදුවූ අඩුපාඩුකම් නැතුවා නොවේ. සිවිල් යුද්ධයක් යනු, සන්නද්ධ අරගලයක් යනු තේ පැන් සංග්‍රහයක් නොවන බව අපි කවුරුත් දනිමු. ඒ නිසාම එවැනි සටනක් තුළ වැළැක්විය නොහැකි දුර්වලතා අඩුපාඩුකම් සටන් කරන බලවේග වෙතින් සිදුවිය හැක. එහෙත් සමස්ත සටනේ ඛේදවාචකය අතිශයෝක්තියට නංවා එය ජ.වි.පෙ. මත පමණක් පැටවීම දුෂ්ට අරමුණෙන් කරන තක්කඩිකමකි. මෙරට ධනේශ්වර පාලක කල්ලි හා ඔවුන්ට දාසකම් කරන විවිධ පුද්ගලයන් විසින් මෙම මතය කොතරම් තදින් පතුරුවා තිබේද යත් අදත් අප සමාජයේ පොදු ජනතාව අතර එම යුගය හැඳින්වෙන්නේ 'ජවිපෙ භීෂණ කාලේ' ලෙසය. සැබැවින්ම භීෂණය දියත් කළේ, 60,000කට ආසන්න ජනතාවක් මරා දැමුවේ, වධකාගාර පවත්වාගෙන ගියේ, 'කොළ කොටි'- 'ප්‍රා' වැනි නිල නොවන හමුදා කණ්ඩායම් පවත්වාගෙන ගියේ, එවකට බලයේ සිටි එ.ජා.ප. ආණ්ඩුවය; එහි ප්‍රාදේශීය නායකයන්ය. එහෙත් මේ වගකීමෙන් එ.ජා.ප.ය මුදා සියල්ල ජ.වි.පෙ. පිට පැටවීමට ධනපති පාලක කල්ලි ක්‍රියාකර ඇති ආකාරය බරපතළය.

මේ අනුව නොදන්නාකම නිසාත්, සතුරන් විසින් පතුරුවන වැරදි මතය නිසාත්, එකල ඉපදීවත් නොසිටි තරුණ පිරිස් පවා ජ.වි.පෙ.ට එරෙහිව එල්ල කරන චෝදනාව වන්නේ 'බස් ගිනි තිබ්බා' 'මිනී මැරුවා' වැනි දේවල්ය. 1987 - 1990 කාලයේ තිබූ සටන ඇත්තටම නිර්මාණය වූයේ කෙසේද එහි සැබෑ වගඋත්තරකරුවන් කවුද යන්න කෙටියෙන් හෝ සාකච්ඡා කර ගැනීම මේ නිසා ඉතා වැදගත් වේ.

88-89 සිදුවීම් යනු අහම්බයෙන් ඇති වූවක් හෝ ජ.වි.පෙ. හිතුවක්කාරකමක ප්‍රතිඵලයක් නොවේ. එය නිර්මාණය කරනු ලැබුවේ එවකට බලයේ සිටි ජේ.ආර්. ජයවර්ධන පාලනය විසිනි.

1971 අරගලයෙන් පසු 1976 දී යළි ප්‍රසිද්ධ දේශපාලනයට පිවිසි ජ.වි.පෙ. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තුළ විශාල බාධාකිරීම් මැද වූවත් සාර්ථක ලෙස කටයුතු කරමින් සිටියේය. ප්‍රසිද්ධ රැලි, සම්මන්ත්‍රණ පවත්වමින් ගෙයින් ගෙට ගොස් ජනතාව හමුවෙමින්, මැතිවරණවලට තරග වදිමින් කටයුතු කළ එයට, අපේ රටේ ප්‍රධාන තුන්වන බලවේගය බවටත්, ප්‍රධානතම වමේ පක්ෂය බවටත් ඉක්මනින්ම පත්වීමට හැකිවිය. 1981 දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයට තරග කොට දිස්ත්‍රික් කිහිපයකින් මන්ත්‍රී ධූර 13ක් දිනාගැනීමට එය සමත් විය. එසේම 1982 ජනාධිපතිවරණය රෝහණ සහෝදරයා අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කොට තුන්වන ස්ථානයට පත්වීමටද සමත් විය. ඉන්පසු ඒ වන විට පැවති හයෙන් පහේ පාර්ලිමේන්තුවම තවත් වාරයකට කල්දමා ගැනීම සඳහා ජයවර්ධන ජනාධිපතිවරයා විසින් 1983ට නියමිත මහ මැතිවරණය නොපවත්වා ජනමත විචාරණයක් කැඳවූ අවස්ථාවේ මැතිවරණය දිනාගැනීම සඳහා තම උපරිම ශක්තියෙන් ජ.වි.පෙ. මැදිහත් විය. 1982 දෙසැම්බර් පැවැති එකී ජනමත විචාරණය ඡන්ද දූෂණ මගින් ජයවර්ධන පාලනය විසින් දිනාගත් විට ඊට එරෙහිව අධිකරණයට ගියේද ජ.වි.පෙ. වෙනුවෙන් රෝහණ විජේවීර සහෝදරයාය. ඉන් නොනැවතී 1983ට නියමිතව තිබුණ මහා මැතිවරණය දිනා ගැනීමේ උද්ඝෝෂණ මාලාවක්ද ජ.වි.පෙ. විසින් අරඹනු ලැබුණි. ජ.වි.පෙ. ඒ සියල්ල කළේ කොතරම් බාධා තිබුණත් ප්‍රසිද්ධ දේශපාලනය තුළ තමන්ට ජයග්‍රහණ ලැබිය හැකි නිසාත් තවමත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස කටයුතු කිරීමට කැමති නිසාත්ය. එබැවින් ප්‍රසිද්ධ දේශපාලනයෙන් ඉවත්ව අවි අතට ගැනීමේ වුවමනාවක් ජ.වි.පෙ.ට තිබුණේ නැත.

එසේනම් ජ.වි.පෙ.ත් සමාජයත් එතැනට ඇද දැමුවේ කවුද යන්න අප තේරුම් ගත යුතුය. සැබැවින්ම එම මානව අපරාධයට කුමන්ත්‍රණකාරී ලෙස තීරණ ගනු ලැබුවේ ජයවර්ධන පාලනය විසින්මය.

1977 හයෙන් පහක බලයක් සහිතව ඇරඹී ජයවර්ධන පාලනය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී, මර්දනකාරී මැර පාලනයක් විය. වර්තමානයේ සඟවනු ලැබ ඇති ඇත්ත ඉතිහාසය එසේය. ශ්‍රීල.නි.ප. නායිකා සිරිමා බණ්ඩාරනායකගේ ප්‍රජා අයිතිය වසර 07කට අත්හිටවූ ජයවර්ධන පාලනය ඒ මගින් ශ්‍රීල.නි.ප.ය කඩා දුර්වල කර දැමුවේය. ඒ අතරම 1980 ජූලි ඇතිවූ සමස්ත මහා වැඩවර්ජනය බලය යොදා මර්දන කළ අතර, ලක්ෂයකට පමණ රැකියා අහිමි කළේය. ඊට පෙර උද්ඝෝෂණයකදී එ.ජා.ප. මැරයන් විසින් පහරදී සෝමපාල නම් කම්කරුවා ඝාතනය කරන ලදී.

එසේම ආණ්ඩුව විවේචනය කිරීම නිසා මැරයන් යොදා එදිරිවීර සරත්චන්ද්‍ර මහතාට පහර දුන් අතර, කාන්තා දිනයේදී විවියන් ගුණවර්ධන මහත්මියටද පහර දුන්නේය. ජ.වි.පෙ. රැස්වීම්වලට මැරයන් යොදා පහරදීම සුලබ දෙයක් විය. මූලික මිනිස් අයිතීන් කඩවීමේ ප්‍රශ්නයකදී අධිකරණය එ.ජා.ප. ආණ්ඩුවට අවාසිදායක තීරණයක් දීම නිසා එම තීරණය දුන් විනිසුරුවරයාගේ නිවස ඉදිරිපිට මැරයන් යොදා උද්ඝෝෂණය කරවන ලදී. නිවසට ගල් ගසන ලදී. එ.ජා.ප.යේ කැරැට්ටුව එසේ විය. 1981 සංවර්ධන සභා මැතිවරණයේදී කොළඹින් යාපනයට ගිය එ.ජා.ප. මැරයෝ යාපනයේ ඡන්ද පෙට්ටි කොල්ලකා අවසානයේ යාපනය පුස්තකාලයටද ගිනි තැබූහ. උතුරේ සන්නද්ධ අරගලයකට ඔවුන් පාර කැපුවේ එසේය. එබැවින් එකල පැවති එ.ජා.ප. මර්දනකාරී හා මැරබලය සහිත භීෂණකාරී පාලනය අමතක කොට 'ජ.වි.පෙ. භීෂණයක්' ගැන කතා කිරීම දේශපාලනයේ ලොකුම ඛේදවාචකය වේ.

ශ්‍රීල.නි.ප. ප්‍රමුඛ විපක්ෂය මර්දනය කළද එ.ජා.ප.යට, ජ.වි.පෙ. බිය වැද්දීමට නොහැකි විය. ඒ නිසාම ශ්‍රීල.නි.ප. දුර්වලව ඇති මොහොතක තමන්ට එන දේශපාලන අභියෝගය ජ.වි.පෙ. බව ජයවර්ධන දැන සිටියේය. ඔහු එය 1983 මැයි දිනයේදී ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරද තිබිණි. ඒ අනුව ජ.වි.පෙ. මර්දනය කර විනාශ කිරීමේ ක්‍රමයක් ජයවර්ධන පාලනය විසින් සොයමින් සිටියේය. 1983 'ජූලි කලබල' සිදුවූයේ ඒ අතරය. ජයවර්ධන ඉන් ප්‍රයෝජනය ගන්නා ලදී.

1983 ජූලි 23වැනි දින උතුරේදී බිම්බෝම්බයකට හසුවී හමුදා සොල්දාදුවන් 13ක් මිය යෑමත් ඔවුන්ගේ මෘතදේහ ඥාතීන්ට නොදී කොළඹ කනත්තේ මිහිදන් කිරීමට උත්සාහ කිරීමත් සමග ඇති වූ නොසන්සුන්තාවය එ.ජා.ප.ය විසින්ම සැලසුම් කර ජාතිවාදී කෝලාහලයකට හරවන ලදී. දෙමළ ජනයාගේ දේපළ ගිනි තබමින්, ඔවුන් මරාදමමින් සිදුවූ මෙම ප්‍රචණ්ඩ ජාතිවාදී කෝලාහලයට දින 03ක් තිස්සේ පවතින්නට ඉඩදුන් ජයවර්ධන පාලනය ජූලි 29දා හදිසිනීතිය පනවා ඒ යටතේ ජාතිවාදී කෝලාහලවලට සම්බන්ධ බව පවසා ජ.වි.පෙ. ඇතුළු පක්ෂ තුනක් තහනම් කළේය. (එසේ තහනම් කළ නව සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ තහනම පසුව ඉවත් කෙරිණි) එබැවින් 1987-88 ඛේදවාචකයේ නිර්මාතෘවරයා අන් කවරෙක්වත් නොව අසාධාරණ ලෙස ජ.වි.පෙ. තහනම් කර, ප්‍රසිද්ධ දේශපාලනයෙන් රහසිගත දේශපාලනයට තල්ලු කළ ජයවර්ධන ප්‍රමුඛ එ.ජා.ප. ආණ්ඩුවය.

ජ.වි.පෙ. තහනම් කළද ජ.වි.පෙ.ට එරෙහිව කිසිදු නීතිමය චෝදනාවක් නොවූ අතර, නඩු පැවරීමක්ද සිදුවූයේ නැත. ජ.වි.පෙ. තහනම සාධාරණය කිරීමට බොරු චෝදනා නැගුවා විනා අධිකරණ ක්‍රියාමාර්ග යක්වත් සිදුවූයේ නැත. ඉන් නොනැවතුන ජයවර්ධන පාලනය ජ.වි.පෙ. තහනම දිගින් දිගටම පවත්වාගෙන යමින් ජ.වි.පෙ. සාමාජිකයන් අත්අඩංගුවට ගැනීම හා පසුව පහරදී මරා දැමීමද සිදු කළේය. 1984දී 'ජ.වි.පෙ. තහනම ඉවත් කරනු' යන පෝස්ටරය අලවමින් සිටියදී අත්අඩංගුවට ගනු ලැබූ අනුරාධපුරයේ දිසානායක නම් සහෝදරයා පහරදී මරා දමන ලදී. ඒ වන විට ජ.වි.පෙ. අවි අතට ගෙන තිබුණේ නැත. ජ.වි.පෙ. සිටියේ තහනම ඉවත්කරවා ගැනීමේ සටනකය.

තහනම දිගටම පවතිද්දී රහසිගතව දේශපාලනය කිරීම තෝරා ගැනීමට ජ.වි.පෙ.ට සිදුවිය. ඒ, ජ.වි.පෙ. 'කැමැත්ත' නිසා නොව වෙන කළ හැකි දෙයක් නොවූ නිසාය. 1983 තහනමේ සිට 1987 දක්වාම ජ.වි.පෙ. සන්නද්ධ වූයේ නැත. එය උත්සාහ කළේ කෙසේ හෝ යළි ප්‍රසිද්ධ දේශපාලනයට පිවිසීමටය. දැන් සතුරන් විසින් සඟවා තිබෙන්නේ එම දේශපාලන සත්‍යයයි.

ජ.වි.පෙ. දේශප්‍රේමී සන්නද්ධ අරගලයකට යොමු වූයේ ඇයි? සැබැවින්ම එය සිදුවූයේ 1987 ජූලිවල ජේ.ආර්. ජයවර්ධන පාලනය ඉන්දියාවේ සිට අත්සන් කළ රට පාවාදීමේ ඉන්දු-ලංකා ගිවිසුම සමගය. ජයවර්ධන ජනාධිපතිවරයා රට පාවාදීමට සැරසෙන බවටත් ජ.වි.පෙ. විනාශ කිරීමට සැරසෙන බවටත් වූ තොරතුරු මත 87 අප්‍රේල්වල ජ.වි.පෙ. අවි එකතු කිරීම හා පැහැර ගැනීමට කටයුතු කළද සන්නද්ධ අරගලයක් ලෙස එය මතුවූයේ ඉන්දු-ලංකා ගිවිසුමත් සමගය. මෙකී ගිවිසුම දේශද්‍රෝහී ගිවිසුමක් විය. ඒ මගින් ලංකාව ඉන්දියාවට පාවාදෙනු ලැබූ අතර ඉන්දියානු හමුදාවක්ද ලංකාවට ගොඩබස්වන ලදී.

මෙම රට පාවාදීමේ ගිවිසුමට හා ඉන්දියානු ආක්‍රමණයට විරෝධය එල්ල වූයේ ජ.වි.පෙ.න් පමණක් නොවේ. පොදු ජනතාව විසින්ද පාරට බැස විරෝධය එල්ල කරන ලදී. එපමණක් නොව හමුදා සොල්දාදුවන් තුළ පවා මෙයට විරෝධයක් තිබුණි. ඉන්දු-ලංකා ගිවිසුම අත්සන්

11වැනි පිටුවට

ඉතිහාසය ලියනු ලබන්නේ ජයග්‍රාහකයන් විසින් යැයි කියමනක් තිබේ. එය සත්‍යයකි. ඒ අනුව 1987න් ඇරඹී 1990 දක්වා වූ මෙම වකවානුව ගැන 'ඉතිහාසය' ලියා ඇත්තේද රට වෙනුවෙන් සටන් කොට දිවිපිදූ දේශප්‍රේමීන්ගේ පැත්තෙන්, විප්ලවවාදීන්ගේ පාර්ශ්වයෙන් නොව, රට පාවාදී ඊට එරෙහි වූවන් දහස් ගණනක් මරා දැමූ පාලකයන්ගේ දෘෂ්ටිකෝණයෙනි. එබැවින් දැන් '1988 - 89 භීෂණය' ලෙස සමාජ ගතකර තිබෙන්නේ ඝාතකයන් විසින් ලියන ලද ඉතිහාසයකි. සත්‍ය ඉතිහාසය නොවේ.

# යුද බෙර වයන අදිරද බල අරගල

ඇමෙරිකා එක්සත් ජනපදය , බ්‍රිතාන්‍යය, සහ ඕස්ට්‍රේලියාව අතර පසුගිය සැප්තැම්බරයේ දී ගොඩනැගුණු ආරක්ෂක එකඟතාව (AUKUS) ජාත්‍යන්තර දේශපාලනයේ සැලකිය යුතු කතා බහකට මග පාදා තිබේ. එය එක් අතකින් අධිරාජ්‍යවාදී රටවල් අතර පවතින ප්‍රතිවිරෝධතාවන් තීව්‍ර කර ඇති අතර අනෙක් අතට කලාපීය රටවල් අතර යුදමය උණුසුමද ඉහළ දමා තිබේ.



එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන් මෙම එකඟතාව "ඉන්දු පැසිෆික් කලාපයේ දිගු කාලීන සාමය හා ස්ථාවරත්වය ඇති කිරීමේ අත්‍යවශ්‍යතාව මත" ගොඩ නැගුණ එක්සත් ජනපද , බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියානු "උපාය මාර්ගික යුධමය හවුල් ක්‍රියාකාරීත්වය" ලෙස හැඳින්වීය. ජාත්‍යන්තර දේශපාලනය තුළ මෙතෙක් ආසියා පැසිෆික් කලාපය හා ඉන්දියානු සාගර කලාපය ලෙස වෙන් වෙන් ව හැඳින්වූ ප්‍රදේශ, විශේෂයෙන්ම Quad සම්මුතියෙන් පසු, එක්සත් ජනපද වුවමනාව මත ඉන්දු පැසිෆික් කලාපය ලෙස පුළුල් කර හැඳින්වීමට පටන් ගෙන තිබේ. ඉන්දු පැසිෆික් කලාපයට ඇතුලත් වන්නේ එක්සත් ජනපදයේ බටහිර වෙරළ තීරයේ සිට ඉන්දියාවේ වෙරළ තීරය දක්වා වූ ප්‍රදේශයයි. ජෝ බයිඩන්ට අනුව මෙම එකඟතාවේ අරමුණ වන්නේ 20වැනි සියවසයේදී මෙන් 21වැනි සියවසයේදීද ඔවුන් හමුවේ ඇති තර්ජනවලට එක්ව මුහුණ දීමයි.

21වැනි සියවසයේදී ඇති වී ඇති තර්ජනය කුමක්ද? මේ අදහස් කරන්නේ අනෙකක් නොව චීනය හා රුසියාවයි. මෙම එකඟතාව තව දුරටත් ඉදිරියට යමින් "වේගවත්ව වර්ධනය වන තර්ජනයෙන්" ආරක්ෂා වීම සඳහා ප්‍රධාන ව්‍යාපෘතියක් දියත් කරන ලදී. එනම් ඕස්ට්‍රේලියාව න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාත්මක වන සන්නද්ධ සබ්මැරීන බලකායක් ගොඩ නැංවීමට එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය ආධාර ලබා දීමයි.

ඕස්ට්‍රේලියාව ප්‍රධාන වශයෙන් භාණ්ඩ ආනයනය හා අපනයනය මත රඳා පවතින රටකි. මෙම භාණ්ඩවලින් 98= ක්ම ආනයනය හෝ අපනයනය කෙරෙන්නේ මුහුදු මාර්ග යෙනි. ඕස්ට්‍රේලියාව ලෝකයේ නැව් භාවිතා කිරීම අතින් විශාලත්වයෙන් හතර වන ස්ථානය ගන්නා රට වන නමුත් එරට භාවිතා කරන නැව්වලින් විශාල ප්‍රමාණයක් අයත් වන්නේ විදේශීය පෞද්ගලික සමාගම්වලටයි. කලකට ඉහත දී ඕස්ට්‍රේලියාව සතුව ඉතා හොඳ භාණ්ඩ ප්‍රවාහන නෞකා පද්ධතියක් පැවතුණද දැන් ඕස්ට්‍රේලියාව සතුව ඇත්තේ භාණ්ඩ ප්‍රවාහන නෞකා 12ක් පමණි. ඕස්ට්‍රේලියානු සමුද්‍ර සංගමය පවසන්නේ ඕස්ට්‍රේලියාවට මේ මොහොතේදී අවශ්‍ය වන්නේ යුදමය න්‍යෂ්ටික සබ්මැරීන නොව භාණ්ඩ ප්‍රවාහන වෙළඳ නෞකා සමූහයක් බවය.

මෙම එකඟතාවය ප්‍රකාශයට පත් වීමෙන් පසු ඒ සඳහා පළමුව ප්‍රතිචාර දැක්වූයේ ප්‍රංශයයි. ඕස්ට්‍රේලියාව හා ප්‍රංශය අතර ඩීසල් සබ්මැරීන 12ක් සඳහා වූ ඩොලර් බිලියන 90ක එකඟතාව මෙම ගිවිසුම හේතුවෙන් අහෝසි වී තිබේ. ප්‍රංශය වහාම ඕස්ට්‍රේලියානු හා එක්සත් ජනපද ප්‍රංශ තානාපතිවරුන් ආපසු සිය රටට කැඳවන ලදී. ඊට අමතරව එකට එක කිරීමක් වශයෙන් සයිනොෆාම් එන්නත ප්‍රංශය තුළ භාවිතය සඳහා අවසර ලබා දුන් අතර එන්නත් නිෂ්පාදනය සඳහා කියුබාවට යුරෝ මිලියන 450ක් ප්‍රංශය විසින් ලබා දෙන ලදී. එබැවින් එක් අතකින් මේ සිදුවෙමින් පවතින්නේ වෙළඳපොළ බෙදා ගැනීම සඳහා වන යුද්ධයකි. ලෝක ආර්ථිකය තුළ එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ ආර්ථික බලය හීන වෙමින් පවතින මොහොතක එය නවත්වා ගැනීම සඳහා සහ හීන වී යන බලය යළි අත්පත් කර ගැනීම සඳහා වඩා ආක්‍රමණකාරී ලෙස සිදු කරනු ලබන මැදිහත් වීමකි.

ජෝ බයිඩන් ප්‍රකාශ කරන ආකාරයට චීනයෙන් හෝ රුසියාවෙන් එක්සත් ජනපදයට හෝ බ්‍රිතාන්‍යයට එල්ල කරනු ලබන යුදමය තර්ජනයක් නොමැත. සිදුවෙමින් පවතින්නේ එහි අනෙක් පැත්තයි. චීනයෙන් හා රුසියාවෙන් කි.මී. දහස් ගණනක් ඈතින් පිහිටි එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යය චීනයට හා රුසියාවට එරෙහිව ඉන්දු පැසිෆික් කලාපය තුළ යුද බලය වර්ධනය කිරීමයි. මේ ගිවිසුම මගින් නිශ්චිතව සිදු කර ඇත්තේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදී වුවමනාවන් වෙනුවෙන් සැකසුන සැලැස්මකට ඕස්ට්‍රේලියාව ද තදින් ගැට ගසා ගැනීමයි. චීනය හා රුසියාවට එරෙහි යුද්ධයකදී ඕස්ට්‍රේලියාව, එක්සත් ජනපදයේ පහරදීමේ මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීමයි. එය ඕස්ට්‍රේලියානු ධනපති පංතියේ වුවමනාවක් විය හැකි නමුත් ඕස්ට්‍රේලියානු ජනතාවගේ අවශ්‍යතාවක් නොවන බව ස්ථිරය.

මෙවැනි ගිවිසුමක් සඳහා එළඹීමට බ්‍රිතාන්‍යය පොළඹවන ලද්දේ කුමන තත්වයක් විසින්ද යන්න මේ මොහොතේදී විමසා බැලීම වටියි. බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් වෙන් වීමෙන් පසු "ගෝලීය බ්‍රිතාන්‍යයක්" යන සිහිනය හඹා යමින් සිටින බව පෙනේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ අපේක්ෂාව වී ඇත්තේ, ඇඟිලි අතරින් රූටා යන ලෝක ආර්ථික හා දේශපාලන බලයේ තමන්ගේ කොටස ආරක්ෂා කර ගැනීමයි; ඒ තාක් දුරට එක්සත් ජනපදය හා එක්ව කටයුතු කිරීමයි. මීට අමතරව බ්‍රිතාන්‍යය 1968 සිට පවත්වා ගෙන ආ සූවස් ඇලෙන් නැගෙනහිරට යුද හමුදා නොයැවීමේ ප්‍රතිපත්තිය වෙනස් කරමින් දැනටමත් දකුණු චීන මුහුද වෙත ප්‍රහාරක බලකායක් පිටත් කර යවා තිබේ.

මේ අනුව පෙනී යන්නේ AUKUS ගිවිසුම ඉන්දු පැසිෆික් කලාපයට සාමය, ආරක්ෂාව, ස්ථාවරත්වය, හෝ සෞභාග්‍යය ගෙන එන්නක් නොවන බවය. එය ඒ වෙනුවට ඊට ප්‍රතිවිරුද්ධ දේ වන යුද්ධය, අවි තරගය, හා අස්ථාවරත්වය ගෙන එන්නක් බවය. යුද තර්ජනයක මුවාවෙන් රටවල් අධිරාජ්‍යවාදී ග්‍රහණයට නතු කර ගන්නා එකඟතාවක් බවය.


## ජර්මනිය: රෝහල් සේවකයෝ ඉල්ලීම් දිනාගෙන

ජර්මනියේ බර්ලින් නුවර Vivantes සහ Charite රෝහල් සමූහයේ සේවකයෝ සති ගණනක් තිස්සේ ඇදුණු වැඩ වර්ජනය ජයග්‍රහණයෙන් කෙළවර කිරීමට සමත් වූහ. ඔක්තෝම්බර් මස මුලදී ජර්මනියේ දෙවන විශාලතම රෝහල් සමූහය වන Vivantes සහ Charite රෝහල් සමූහයේ සේවකයෝ ඔවුන් මත පටවා ඇති වැඩ ප්‍රමාණය අඩු කරන ලෙසත් රෝහල් තුළ පවතින සේවක හිඟයට වහා පිළියම් යොදන ලෙසටත් බල කරමින් වැඩවර්ජනයක් ආරම්භ කල අතර උද්ඝෝෂණ ක්‍රියා මාර්ගවලටද එළඹුණහ. උද්ඝෝෂණ හා වෘත්තීය ක්‍රියා මාර්ගවලට රෝහල් තාක්ෂණ ශිල්පීන්, රසායනාගාර ශිල්පීන්, හෙදියන්, වින්නඹු මාතාවන් ඇතුළු රෝහල් සේවකයෝ 5000කට වැඩි පිරිසක් සහභාගි වූහ. අවසානයේදී ඔවුන්ගේ ඉල්ලීම් අතරින් තීරණාත්මක ඉල්ලීම් ලබා දීමට පාලකයන් එකඟ වීමෙන් පසු වර්ජනය අවසන් කිරීමට මෙම වෘත්තීය ක්‍රියා මාර්ගයට නායකත්වය දුන් බර්ලින් රෝහල් ව්‍යාපාරය තීරණය කළේය.




## කියුබාව: වියට්නාමයට එන්නත් තාක්ෂණය ලබාදී

පසුගියදා කියුබාව සහ වියට්නාමය කොවිඩ් 19 එන්නත් අපනයනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹුණහ. එම ගිවිසුමට අනුව කියුබාව තම රටේ නිෂ්පාදනය කරන ඇබ්ඩාලා එන්නත වියට්නාමයට ලබා දීමට එකඟ වූ අතර එහි වඩාත් වැදගත් අංගය වූයේ කොවිඩ් 19 එන්නත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණයද වියට්නාමයට ලබා දීම සඳහා වූ එකඟතාවයි.




කියුබාව එන්නත් මාත්‍රා තුනකින් යුක්ත ඇබ්ඩාලා එන්නත් මිලියන 10ක් වියට්නාමයට ලබා දීමට නියමිතය. එහි පළමු කොටස දැනටමත් වියට්නාමයට අපනයනය කර තිබේ. කොවිඩ් 19 රෝගයට ප්‍රතිකාරයක් ලෙස භාවිතා කරන ඉන්ටර්ෆෙරෝන් ඇල්ෆා 2 බී ඖෂධයද මීට පෙරද වියට්නාමයට ලබා දුන් අතර වියට්නාමය කියුබාවට සහල්, කෝපි, රසායනික ද්‍රව්‍ය, රෙදි පිළි සහ පාවහන් වැනි දෑ අපනයනය කරයි.

## එක්සත් ජනපදය: ඇමසොන් සේවකයෝ වෘත්තීය සමිතියක් ඉල්ලා

කොවිඩ් 19 ලෝක වසංගත තත්වය හමුවේ අති විශාල ලාභ ප්‍රමාණයක් ඉපයූ එක්සත් ජනපදයේ ඇමසොන් සමාගමේ නිව්යෝර්ක්හි Staten Island ගබඩාවේ සේවකයෝ වෘත්තීය සමිතියක් ලෙස සංවිධානය වීමේ අයිතිය ඉල්ලීම දිනා ගැනීම සඳහා වූ පෙත්සමක් එක්සත් ජනපද කම්කරු කාර්යංශයට භාරදුන්හ. සමාගමේ බාධාකිරීම් මධ්‍යයේ ඒ සඳහා අවශ්‍ය අත්සන් ප්‍රමාණය එකතු කර ගැනීමට ඔවුහු සමත් වූහ. ඇමසෝන් කම්කරු සංගමයට වෘත්තීය සමිතියක් ලෙස අනුමත කර ගැනීම සඳහා සමාගමේ වෘත්තීය සමිති විරෝධී ක්‍රියාකාරිත්වයට එරෙහිව විශාල අරගලයක් කිරීමට සිදුව තිබේ.




ලෝකයේ විශාලතම සමාගම්වලින් එකක් වන සහ ජෙෆ් බෙසෝස් වැනි ලෝකයේ ධනවත්ම පුද්ගලයන්ගේ අයිතියේ පවතින ඇමසෝන් සමාගමේ සේවකයන්ට ඉතාම දුෂ්කර තත්වයන් යටතේ වැඩ කිරීමට බල කෙරී ඇත. කාර්ය බහුලතාවය හේතුවෙන් එහි සේවකයන්ට මුත්‍රා කිරීම, මළ පහ කිරීම වැනි කටයුතු පවා මහ මගදී බෝතල් බෑග් වැනි දේවලට කිරීමට සිදුව ඇති බව වාර්තා වේ. එක්සත් ජනපදයේ දෙවන විශාලතම පුද්ගලික අංශයේ සමාගම වන එහි ලොව පුරා මිලියනක පමණ සේවක පිරිසක් සේවය කරති.

## ඉතාලිය: කියුබානු කොවිඩ් සහයට කළගුණ දක්වා

ඉතාලිය තුළ කොවිඩ් 19 වසංගතය දරුණු ලෙස පැතිරී ගිය මොහොතේදී ජාත්‍යන්තර සහය රැගෙන ගිය කියුබාවේ හෙන්රි රීව්ස් වෛද්‍ය බලකාය තාවකාලික ක්ෂේත්‍ර රෝහලක් පිහිටුවා ගනිමින් රෝගීන්ට ප්‍රතිකාර කළ ස්ථානය හෙන්රි රීව්ස් නමින් සිහිවටන ස්ථානයක් බවට පසුගිය දා පත් කරන ලදී. ඒ සඳහා මුල් වී ක්‍රියා කලේ ඉතාලි කියුබානු මිත්‍රත්ව සංගමයයි.



# පොහොසත් කළ හැකි රටක්, දුප්පත් කරන හැටි

1956දී සිංගප්පූරුවේ අගමැති ලී ක්වාන් යූ පැවසුවේ නොදියුණු දුප්පත් සිංගප්පූරුව, ශ්‍රී ලංකාවක් කරන බවයි. ඔහු තමන්ගේ අනාගත වාක්‍ය සම්පූර්ණ කළේ එදා පැවැති ලංකාව, ලංකාවේ පාලකයන් විසින් දියුණු කළේ නම්, අද පවතින සිංගප්පූරුව බවට හෝ ඉන් ඉදිරියටත් දියුණු කළ හැකි බව ඔප්පු කරමින්ය. ඒ සිංගප්පූරුව දියුණු ධනපති රටක් බවට පත් කරමිනි. නමුත් ලංකාව පාලනය කළ බලකාමී කොමිස් ලැදි දූෂිත පාලකයන් විසින් ලංකාව මේ වන විට පහළට ඇද දමා අවසන්ය. ඒ දකුණු ආසියාවේ බංගලාදේශයටත් වඩා පහළට ලංකාව ඇද දමමිනි. අද බංගලාදේශයේ දළ දේශීය නිෂ්පාදනය ඇමරිකන් ඩොලර් බිලියන 324.2 (2020) වන විට ලංකාවේ එය ඩොලර් බිලියන 80.7ක රැඳී පවතී.

1977 දී සිංගප්පූරුවේ දළ දේශීය නිෂ්පාදනය ලංකාවට වඩා වැඩි වූයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 02කින් පමණි. ලංකාවේ 1977 දී දළ දේශීය නිෂ්පාදනය 4.1ක් වූ අතර සිංගප්පූරුවේ දළ දේශීය නිෂ්පාදනය 6.9ක් විය. නමුත් අද වන විට සිංග ප්පූරුවේ එම ප්‍රමාණය ඩොලර් බිලියන 390කි. ලංකාවේ පුරවැසියෙකුගේ ඒක පුද්ගලික ආදායම ඩොලර් 4000ක් වන විට සිංගප්පූරුවේ එය ඩොලර් 40,000කි.

**"පොහොසත් රටක් - දුප්පත් හෙටක්"**

ලංකාව ලෝකයේ අනිත් රටවල් සමග සැසඳීමේදී භූමිය අතින් කුඩා වුවද පිහිටීම අතින් ඉතාම පොහොසත්ය. " ඉන්දියන් සාගරයේ මුතු ඇටය" විරුදාවලියට ලංකාව හිමිකම පාන්නේ නිකම්ම නොවේය. අතීතයේදී අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණයන්ට ඉලක්ක වන්නේත්, වර්තමානයේදී ප්‍රබල රටවල්වල ආරක්ෂක හා ආර්ථික ඉලක්කයක් වන්නේත් මේ පිහිටීමේ විශේෂත්වය නිසාමය. අතීතයේදී ලංකාවේ වරාය අත්පත් කර ගැනීමට බොහෝ ආක්‍රමණිකයෝ උත්සාහ දැරූහ. අදත්, චීනය, ඉන්දියාව, ඇමෙරිකාව ඒ උත්සාහයම දරමින් සිටී. ඒ ලංකාවටම උරුම පිහිටීමේ විශේෂත්වය නිසාවෙනි. පිහිටීමේ පොහොසත්කම නිසාවෙනි. මහාද්වීප යා කරන නාවුක මාර්ගයේ පිහිටි ලංකාවේ මුහුදු සීමාව ආසන්නයෙන් වසරකට යන එන භාණ්ඩ ප්‍රවාහන ජාත්‍යන්තර නැව් ප්‍රමාණය 37,000කි. ලෝකයේ තෙල් ප්‍රමාණයෙන් 2/3ක්ද සමස්ත වෙළඳාමෙන් 1/3ක්ද අත්පත් කරගෙන ඇත්තේ ඉන්දියන් සාගරයයි. ඒ නිසා නැව් සඳහා පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙසත්, ආරක්ෂිත වරායක් ලෙස යොදා ගැනීමේදීත් ලංකාව අති විශේෂ වැදගත්කමක් දරයි.

නමුත්, මේ වන විට ඒ නාවුක බලයේ වැඩි පංගුව, දුබල හා කෑදර වත්මන් රාජපක්ෂ පාලනය විසින් ලංකාවේ ඒ ශක්‍යතාවය අහිමි කොට හමාරය. නාවුක බලය විකුණමින් තිබේ. හම්බන්තොට වරාය චීනයට ලබාදෙමින් රනිල්-මෛත්‍රී පාලනය මේ කටයුත්ත ඇරඹීය. රාජපක්ෂ පාලනය කොළඹ වරායේ කොටසක් ඍජු ලෙසම චීනයේ ෂක්ඛ සමාගමට පවරන ලදී. දැන් ඒ වරාය කොළඹ චීන වරාය වී හමාරය. ඊළඟට වරායේ නැගෙනහිර කොටස විකිණීමට දරන උත්සාහය වෘත්තීය සමිති හා දේශපාලන බලවේගය විසින් පරාජය කළද කොළඹ වරායේ බටහිර ජැටිය ඉන්දියාවේ අදානි සමාගමට විකුණා දමන ලදී. ඊළඟට දැන් සූදානම ත්‍රිකුණාමලේ තෙල් ටැංකි පද්ධතිය සහ ත්‍රිකුණාමලේ ස්වභාවික වරාය අලෙවි කිරීමටය. රටක් දියුණු කළම හැකි වටිනාම සම්පත් විකිණීමෙන් රටක් ලබන ලාභයක් නැත. නමුත්, ජනවරම හැරවිණි. දැන් නවතම ක්‍රියාවලිය වී ඇත්තේ තෙල් සංස්ථාව යටතේ ඇති තෙල් ටැංකි පද්ධතිය හා විදුලි බලමණ්ඩලයට විදුලිය ලබා ගැනීමේ යාන්ත්‍රණය ද්‍රවීකෘත ගෑස් (එල්එන්ජී) බවට පරිවර්තනය කිරීම මගින් රටම බංකොලොත් කිරීමයි. රටේ අවශ්‍යතාවය ජල විදුලිය මගින් සපුරාගෙන ඉතිරි අවශතාවය සඳහා ගෑස් මිලදී ගැනීම වෙනුවට, ඇමෙරිකානු සමාගමක් යටතේ කොමිස් වෙනුවෙන් රට බලශක්තියෙන් දුර්වල කිරීම අරඹා ඇත. රටක බලශක්තිය අත්පත් කර ගැනීමේ ශක්තිවන්තයා ඒ රට පාලනයට බලපෑම් කරනු ඇත. ඒ අර්ථයෙන් මේ දුබල හා කෑදර පාලකයන් විසින් ලංකාව නව යටත්විජිත ආක්‍රමණයකට ලක්කරනු ලැබ ඇත. ඇඟලුම් කර්මාන්තයට වූයේද ඒ සන්තෑසියමය. දැන් ලංකාවෙන් අඩු මිලට යුරෝපීයයන් ලබාගත් ලාභ කම්කරු ශ්‍රමය ඉන්දියාවෙන්, බංගලිදේශයෙන් සහ සමහර අප්‍රිකානු රටවලින් ලබාගත හැකිය. ඒ නිසා ලංකාවේ ඇඟලුම් කර්මාන්ත ශාලා හිමිකරුවෝ දැන් ක්‍රමයෙන් තම නිෂ්පාදන ආයතන එම රටවලට මාරු කරමින් සිටිති. අනෙක් අතට ඇඟලුම් නිෂ්පාදන සඳහා ආනයනික අමුද්‍රව්‍යවලටද විශාල වියදමක් දැරීමට සිදුවීමෙන් ඇඟලුම් කර්මාන්තය ව්‍යාපාරයක් ලෙස ආර්ථිකයට එකතු කරන පංගුව සීමා සහිතය.

නමුත්, ලංකාව රටක් ලෙස පොහොසත් කළ හැකි බොහෝ අවස්ථාවන් පාලකයන්ගේ වැරදි ආර්ථික උපායමාර්ග නිසා අත්හැර දැමුණි. ඒ නිසා මුදල් කරන පාලකයන් ලබන බොහෝ දේ ඇත. ඒ නිසා පාලකයන් පොහොසත් වී රට දුප්පත් වෙයි.

> බොහෝ දෙනා අද මේ පවතින ආර්ථික අර්බුදයට තාවකාලිකව හෝ විසඳුමක් නැතිදැයි විමසති. මේ ලාභයම පමණක් අරමුණු කරගත්, කෑදර කොමිස් වෙනුවෙන් රටම අනතුරට හෙළන දේශපාලන ක්‍රමය වෙනස් නොකරන තාක් කල් ආර්ථිකයේ අර්බුදයට පැලැස්තරවලින් විසඳුමක් නොවන බව පැහැදිලිය.

**විදුලිය, ගෑස් කිරීම!**

ලංකාවේ ජල විදුලි බලය, ප්‍රධාන බලශක්ති සැපයිම් පද්ධතියයි. ඊට අමතර ලෙස වසර පුරාම ඒකාකාරී සූර්ය රශ්මියක්ද ලබන රටකි. තෙල් ආනයනය කළද, දැවිතෙල් ඇතුළු පිරිපහදුවේ බොහෝ කොටස් අමතර නිෂ්පාදන ලෙස යොදා ගැනිමේ අවස්ථාවන් ඉතිහාසයේ රජය සතු විය. මුලින් ඒ කොටස් විකිණීම ඇරඹිණි. විදුලි බලමණ්ඩලයේ අයිතියද කොටස් ලෙස හා වක්‍රව පෞද්ගලික සමාගම්වලට

**අපනයන හා විදේශ ආදායම**

ලංකාවේ වර්තමාන ප්‍රධානම අර්බුදයන් නිර්මාණය වී ඇත්තේ විදේශ විනිමය ගැටලු සමගය. විදේශ විනිමය හිඟයට හේතුව අපගේ අපනයන ආදායම මෙන් දෙගුණයක් ආනයන වියදම් දැරීමට සිදුවීමය. අපනයන ආදායම තේ, ඇඟලුම් වැනි නිෂ්පාදන මත රඳා පැවැතියත් එවැනි අපනයන සඳහා සමාන තරගකරුවන් බොහෝමයකි. අද ලංකාවට සුවිශේෂී වටිනාකමක් සහිත වූ "සිලෝන් ටී" සන්නාමය ලංකාවෙන් අත්හැරෙමින් තිබේ. එය වියට්නාමය, කෙන්යාව, චීනය වැනි බොහෝ වෙනත් රටවල් වේගයෙන් අත්පත් කරගෙන ශ්‍රී ලංකාව ලෝකයේ දුප්පත් සහ මේ වන විට විදේශ විනිමය අර්බුදය නිසා කඩා වැටෙන රටක් බවට පත්වෙමින් තිබේ.

ශ්‍රී ලංකාවේ කුරුඳු නිෂ්පාදනයට ලෝකයේ ඒකාධිකාරී සන්නාමය හිමිය. නමුත් කුරුඳු අමුද්‍රව්‍යයක් ලෙස මිස කුරුඳු භාවිත කරන නිෂ්පාදනයන් අහිමි රටකි. ගම්මිරිස්, කෝපි, සාදික්කා, එනසාල් වැනි සුළු අපනයන බෝග රැසක්ම මේ කාණ්ඩයට අයත්ය.

ඛනිජ නිෂ්පාදන ක්ෂේත්‍රයේද එලෙසමය. පුල්මුඩේ ස්වභාවික ඛනිජ වැලි නිධිය ලංකාවට ස්වභාව ධර්මයෙන් ලද මහඟු දායාදයකි. නිදහසින් වසර 73කට පසු අදටත් අප සිදුකරන්නේ ඛනිජ සම්පත අමුද්‍රව්‍ය ලෙස රට පැටවීම පමණි. අඩු තරමින් ඛනිජ වැලි ලෙස නොව නිස්සාරණය නිසි පරිදි සිදු කොට ඉල්මනයිට්, රූටයිල්, ඇපටයිට් ආදී වශයෙන් ඛනිජ නිෂ්පාදන මට්ටමට පත් කිරීමටවත් රට සමත් වී නැත. කොමිස් කෑදරකමට අධිවේගී මාර්ග හෝ ක්‍රීඩා පිටි හැදීමට ණය ගැනීමට දඟලන ආණ්ඩු මේ ඛනිජ නිෂ්පාදන සඳහා තාක්ෂණය මිලදී නොගනී.

නමුත්, ආනයන ක්ෂේත්‍රය එසේ නොවේ. ලංකාවට අවශ්‍ය ඛනිජ තෙල් අනිවාර්යයෙන්ම මිලදී ගත යුතුය. මේ වන විට බොරතෙල් ගෙන්වීම ඇණ හිටින මට්ටමේ ඇත. මෑතකදී ලංකාවට තෙල් සැපයීම සඳහා ලංසු කැඳවීමේදී ඉදිරිපත්වී ඇත්තේ එක් සැපයුම්කරුවෙකු පමණි. ඒ, මීට ඉහතදී ලංකාවට ගෙනා බාල තෙල් නිසා අසාදු ලේඛන ගත කළ සිංගප්පූරු විටෙවිල් සමාගමයි. අද ලංකාවට අවශ්‍ය ඉන්ධන සැපයීමට සැපයුම්කරුවන් ඉදිරිපත් නොවන්නේ තෙල්වලට මුදල් ගෙවීමට ලංකාවට සල්ලි නැති නිසාය. ලංකාව ඇද දමා ඇති තත්වය එලෙසය.

පසුගිය 2020 වසරේදී පමණක් ආනයනික භාණ්ඩ සීමා කරන ලද තත්වය යටතේදී පවා ලංකාවට ආහාර ආනයනයට ඩොලර් මිලියන 1552ක් වියදම් කර ඇත. මේ ධනවාදී විවෘත ආර්ථික ක්‍රමය මහජනතාව වෙත බලහත්කාරයෙන් පටවන ලද අධිපාරිභෝජනවාදී ආර්ථික ක්‍රමයේ ප්‍රතිඵල විසින් දැන් ජනතාව දවසින් දවස දුප්පත්කමේ පතුලටම ඇද දමමින් තිබේ.

**නැති අය නැති කිරීම**

පසුගියදා ගෑස් හිඟයත් සමඟ ජනතාව ගෑස් ටැංකි සහිතව පෝලිමට පැමිණියේය. කිරිපිටි හිඟයට උත්තරය ලැබුණේ කිරිපිටි මිල ඉහළ දැමීමෙන් පසුවය. සීනි, සිමෙන්ති, තිරිඟු පිටි මේ සියල්ලටම උත්තරය ලැබුණේ මිල ඉහළ දැමීමය. මිල ඉහළ දැමූ පසු නැති භාණ්ඩ වෙළඳපොළට පැමිණියේය. හාල් මිල පාලනයට හදිසි නීතියද පැනවීය. පසුව මිල පාලනය ඉවත් කර මිල වැඩි කිරීමේ අයිතිය මුදලාලිලාට භාර දුනි. සහල් මිල නිවේදනය කරන්නේ සහල් මෝල් ප්‍රධානීන්ය. ගෑස් මිල තීරණය කරන්නේ ගෑස් කොම්පැනිකරුවන්ය. තිරිඟු පිටි මිල තීරණය කරන්නේ ආනයනකරුවන්ය. කහට කෝප්පයේ සිට සියලු භාණ්ඩවල මිළ වෙළෙන්දන්ටම තීරණය කිරීමට ඉඩ හැර ඇත.

නමුත්, ශ්‍රමය වගුරන ගොවියාගේ නිෂ්පාදනයේ මිල ගොවියාට තීරණය කළ නොහැකිය. මිල තීරණය වී ඇති ගුරුවරයාගේ වැටුප් ශ්‍රමයට නොගෙවා ඇති කොටස අවුරුදු 24ක් තිස්සේ හිඟය. එය ඉල්ලා සිටීම පවා අපරාධයක් වී ඇත. ගොවියාට වගාවට පොහොර

02 වැනි පිටුවට







"ධනේශ්වර සහ ඉඩම් හිමි ආණ්ඩුවල ලෝක ව්‍යාප්ත අත්දැකීම් ජනතාව පීඩනයේ ගිල්වා තබා ගැනීමේ ක්‍රම දෙකක් බිහි කර තිබේ. පළමුවැන්න බලහත්කාරයයි... නමුත් 'පාඩම් උගත්' බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ධනේශ්වර පංතිය හොඳින්ම සංවර්ධනය කළ තව ක්‍රමයක් වෙයි. එය රැවටීමේ, චාටු බස් දෙඩීමේ, කදිම වදන් පැවසීමේ, දශ ලක්ෂ ගණන් පොරොන්දු දීමේ, පාන් රොඩු විසිකිරීමේ හා අවශ්‍ය දේ තබාගෙන අනවශ්‍ය දෙයින් වරදාන පිදීමේ ක්‍රමයයි."

**ලෙනින්**
**අප්‍රේල් තිසීසයන්**
**1917 අප්‍රේල් 17**

# අරගලයට පණ දීමට අපි සූදානම්



අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ විධායක සභික

ජ.වි.පෙ. නාගරික මන්ත්‍රිනි

**එච්.බී. සීතා හේරත්**

"ලෝකය අලුත් කරන්නේ ගැහැනියයි. අලුත් ප්‍රාර්ථනා දස දහස් ගණන් ඉපදෙන්නේත් අරගල කරන ගැහැනියගේ ආදරණීය හිත් තුළයි. එහෙත් මහ පොළවත් සමග ජීවත් වීමට අරගල කරන කාන්තාවන් දහස් ගණනක් ණය ගෙවා ගැනීමට නොහැකිව අද සුසුම් හෙළනවා.

අම්මලා බඩගින්නට දරුවන් සමග වස පානය කරන තත්වයකටත් පත් වෙලා.

රටේ ජනතාවගේ මුදල් හොරාකෑම අමන පාලකයින්ගේ ප්‍රතිපත්තිය වෙලා. දවසින් දවස විනාශය කරා යන රට ආපසු හැරවිය හැක්කේ අරගල කරන කාන්තාවන්ට පමණයි. ගොවිබිමේත් ගමේත් නගරයේත් ජන අරගලයට පණ දීමට අපි සූදානම්. එය කළ හැක්කේ සියලු ධෛර්යමත් කාන්තාවන් එක මිටකට නැගී සිටියහොත් පමණයි."

# මහ පොළොව උණුසුම්ය!

'පාන් නැත්නම් කේක් කාපල්ලා' මෙසේ කීවේ ප්‍රංශයේ 06වැනි ලුවී රජුගේ බිසවයි. 'කන්න නැතත් ඉන්න රටක් ඕනෑ' යන ආදර්ශ පාඨය ජන මනස තුළ ස්ථාපිත කරමින් බලයට පත් ලංකාවේ නූතන ලුවීලා අපේ ගෘහණියන්ට 'තුන්වේල කන්න බැරි නම් දෙවේලක් කාපල්ලා' යනුවෙන් පවසති. දෙවේලක් තියා එක වේලක්වත් කන්නට බැරි තරමට ආර්ථික පීඩනය ඉහළ ගොස් ඇත. මේ පීඩනය වැඩිපුර දැනෙන්නී කුස්සිය බාර ගෙන ඉන්නා මව්වරුන්ට, ගෘහණියන්ටය.

පෝලිම් ගැන අපේ රටේ ප්‍රමුඛ නිදසුන් ගැන අසන්නට ලැබෙන්නේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ පාලන සමයේ වුවද වර්තමානයේ රට පුරා බැලූ බැලූ අත දිගු පෝලිම් දක්නට ලැබේ. රෝහලේ පෝලිම, බස්පොළේ පෝලිම, එන්නත් පෝලිම, සහනාධාර පෝලිම හැරුණු විට, මේ නවතම පෝලිම් නිර්මාණය වන්නේ පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙනි. හාල්, සීනි, කිරිපිටි, භූමිතෙල්, පොහොර, සිමෙන්ති අතරට එක් වූ නවතම පෝලිම් වන්නේ ගෑස් හා කිරි පිටි පෝලිම්ය. මේ පෝලිම්වල ගිනි ගහන අව්වේවරු ගණන් තපින්නේ වැඩි වශයෙන් ගෘහණියන්ය.

ආණ්ඩුව රුපියල් 60/-ට අඩු කළ පරිප්පු දැන් රුපියල් 260/-කි. රුපියල් 250/-ක්ව පැවති සැමන් ටින් එක දැන් රුපියල් 360/-කි. සබන් කැටයත් දිනෙන් දින මිල වැඩිවී රුෑ74/-ක් බවට පත්වී ඇත. මිරිස්, තුනපහ බිස්කට්, සෝයාමීට්, සීනි, හාල්, නූඩ්ල්ස්, කහ ආදී භාණ්ඩවල මිල දිනෙන් දින ඉහළ යයි.

ඉතිහාසයේ නොවූ විරූ ලෙස ගෑස්මිල ඉහළ ගියේ 84% ක ප්‍රතිශතයකිනි. මේ ගෑස් මිල ඉහළ යාම ගම්බද කාන්තාවන්ට වඩා තදින්ම දැනුනේ රැකියා කරන කාන්තාවන්ටත්, නාගරික මහල් නිවාස හා පැල්පත් නිවාසවල ජීවත්වන කාන්තාවන්ටත්ය. ගෑස් මිල වැඩිවීමත් සමග ඒවා භාවිතා කළ ගෘහනියන්ට නැවතත් අතීතයට හෙවත් දර ලිපට යෑමට බල කෙරී ඇත. එය එසේ වුවත් , මහල් නිවාසවල කාන්තාවන් දර ලිපක් හදා ගන්නේ කොහේද? යන ප්‍රශ්නය පැන නැගී තිබේ. ඒ නිසාම ඔවුහු ගෑස් ලිප අතහැර දමා භූමිතෙල් ලිපට පුරුදු වූහ. වැඩි වැඩියෙන් භූමිතෙල් ලිප් පරිහරණය කරන්නට පෙළඹෙද්දී රුපියල් 500/-ට උදේ තිබූ භූමිතෙල් ලිප හවස්වන විට රුපියල් 950/-ක් දක්වා වැඩිවිය.

"දරුවෙකු එළදායී පුරවැසියෙකු කිරීමේ අත්පොත තැබීම සිදුවන්නේ මව අතිනි. පවුලක සතුට රඳා පවතින්නේ ගෘහණිය මතය සමාජයක් විනය ගරුක වන්නේ නිවසේ සිටම දරුවන්ට නිවැරදි මඟ පෙන්වීම ලබා දුන් විට යි. මේ නිසා අපේ දීර්ඝ කාලීන අරමුණ ඉටු කර ගැනීමට කාන්තාවගෙන් ලැබෙන දායකත්වය ඉතා වැදගත් වේ." -ගෝඨාභය රට හදන සෞභාග්‍යයේ දැක්ම,පිට -27.





බලයට පත් වීමට පෙර කාන්තාවන්ගේ සමාජමය කාර්යය භාරය අගය කරමින් 'සෞභාග්‍යයේ දැක්ම' නමින් නිකුත් වූ ජනාධිපතිවරයාගෙ ප්‍රතිපත්ති ප්‍රකාශනයයේ කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කරනවා යැයි පැවසූ රැවටිලිකාර වදන් හමුවේ බලාපොරොත්තු සහගතව ඡන්දය දුන් ගැහැනුන් දැන් හැඬූ කඳුලින් තමන්ටම ශාප කර ගනිමින් හිඳිති.

'මේ ආණ්ඩුව ගෙනාවා වගේම එළවන්නෙත් අපි' යනුවෙන් සටන්කාමී කාන්තා හඬවල් රටපුරා තැනින් තැන ඇසෙන්නට පටන්ගෙන තිබේ.

'මුන්ට ඡන්දෙ දුන්නට අපිට මඩුවලිගෙන් ගහන්න ඕනෑ' යැයි තවත් පිරිසක් පවසති. මේ සියල්ලෙන්ම පෙනී යන්නේ ආණ්ඩුව ගෙන යන මේ ප්‍රෝඩාකාරී, පීඩාකාරී වැඩපිළිවෙළට අඩුම තරමින් ඡන්දය දුන් 69 ලක්ෂයවත් කැමති නොවන බව නොවේද?

අඟහරු ලොවෙත් ට්‍රැෆික් ඇතිවන තත්වයට විද්‍යාව හා තාක්ෂණය දියුණු වූ ලෝකයක අපේ රටේ පමණක් කාන්තාවන් ඒ දියුණුව කරා යන කොටස්කරුවන් කරනු වෙනුවට, ලිප්බොක්කට තල්ලු කර දමන්නට පාලකයන් කටයුතු කරමින් හිඳියි. රජුන් තනන්නට ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරන කාන්තාවන් මේ ඉරණම භාරගත යුතු ද?

දැන් මහ පොළොව උණුසුම්ය. පොහොර නැති ගොවියන් ගෙවිළියන් සටන් වදිමින් හිඳිති. පෝලිම්වල ආණ්ඩු විරෝධය පුපුරා යමින් තිබේ. අස්වනු විකුණා ගැනීමට නොහැකි ගොවියෝ මෙන්ම වෙළෙඳුන්ද විරෝධය පාති. උදුරාගත් වැටුප් ඉල්ලා ගුරු විදුහල්පතිවරු සටනේය. කුසගින්න හා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් මව්වරුන්, ගෘහණියන් වීදි බැස ඇත. දැන් මුළු රටම පාලකයන්ට එරෙහිව දෑත් ඔසවා තිබේ.

මේ විරෝධය තවත් එක් ආණ්ඩු මාරුවකට සීමා නොවිය යුතුය. හුදෙක් එකම තැටියේ පිච්චෙන රොටිය මෙන් දෙපැත්ත මාරු නොකර දැනුවත්ව හා ක්‍රමවත්ව මේ ආණ්ඩු විරෝධය පවතින සමාජ ක්‍රමයේ වෙනසක් දක්වා පෙළ ගැසිය යුතුව තිබේ.

සමාජ පරිවර්තනයක් දක්වා කාන්තාවන් පෙළ ගැස්විය නොහැකි වුවහොත් රැල්ලට හසුවී කොහේ හෝ වෙරළකට ගොඩගසා නැවතත් මුහුදට ගසාගෙන යන වැලි කැට මෙන් වනු ඇත. එසේ නම් ලිප්ගල් තුනට කොටු නොවී දැලි කුණුවලින් මිදී ගත කරන සමාජ ජීවිතයක් වෙනුවෙන් කාන්තාවන් යොමු කිරීමේ වගකීම ඇත්තේ මෙය කියවන සහෝදර ඔබට හා මටය.

ජනගහනයෙන් 51% ක් පමණවූ කාන්තාවන් සවිඥානිකව සමාජ පරිවර්තනයක් වෙනුවෙන් පෙළගස්වා ගැනීම මේ මොහොතේ අප මත පැවරුණු අත්හළ නොහැකි වගකීමක් බව අමතක නොකළ යුතුය.

කාන්තාවන් මත පැටවුණු බර පොදිය බිමින් තබා ඇයට සැහැල්ලුවෙන් ආර්ථික ජීවිතයක්, පෞද්ගලික ජීවිතයක් සමාජ ජීවිතයත්, ගත කළ හැකි සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් වඩ වඩාත් කැපවීමෙන් කටයුතු කරමු. යැයි අපි ඔබට යෝජනා කරමු.

## නොමියෙන රතු කුසුමන්

ඒ ඈත වන පෙත
කටුක දුර්ගයන් අස
අකම්පිත කඳු හිස
රක්ත පැහැ නෙක කුසුම්
විකසිත

බක්මහ අසෙණි පසුකර
නොසැලී, නොබා පෙරටුව
ඉල් මහට උණුසුම් ගෙන
සොයුරියන් දිවි පුද කළ

කරට කර හිඳිමින
සහෝදර සිත් සවි කළ
උණ්ඩයට නොවැළකි වුණ
කිරිලියන්, එක රෑනෙ පියාඹුව

දෙතිස් වසකට පෙර
මරා දැමුණත් ඔබ
තවත් පරපුරක් ඈත
ඔබෙන් පන්නරය ලැබගෙන

උලලේනුන් හැඬුවත් කළුවර
රෑට
රතු කුසුමන් පිපෙයි නිසැකව
හැමදාක
ඉල්මහ පරපුරේ සොහොයුරින්
නිබඳ
යදමින් බැඳුණු ලඳුනට
සවියකි නේක



# සිව්දෙසින්



## ප්‍රංශයේ කාන්තා හිංසනයට එරෙහිව





බටහිර යුරෝපයේ රටවල් අතරින් විවාහ හෝ ප්‍රේම සබඳතා මත කාන්තාවන් ඝාතනයට ලක්වීම සම්බන්ධයෙන් ප්‍රංශය ප්‍රකටය. මෙම කතාබහ මෑතකදී නැවත අලුත් වූයේ කාන්තාවක් පෙර විවාහයේ සැමියා විසින් මිලේච්ඡ ලෙස ඇයගේ දරුවන් ඉදිරියේ දීම ඝාතනය කිරීමත් සමගය. මේ වසරේදී පමණක් මේ දක්වා මෙවැනි ඝාතන 94ක් පමණ ප්‍රංශය තුළ සිදුවී ඇත. 2019 වර්ෂයේ මෙම සංඛ්‍යාව 146ක් වූ අතර 2020 වසරේ 102ක් විය. මෙම ප්‍රවණතාවයට එරෙහිව කාන්තාවෝ විවිධ විරෝධතා දියත් කරමින් සිටිති.

## හිඳගැනීමේ අයිතිය




ඉන්දියාවේ වෙළඳ සේවක සේවිකාවන් දිනකට පැය 10 ක් පමණ සිටගෙන වැඩකරන අතර මේ අතරින් බහුතරය සේවිකාවෝ වෙති. හැකි සෑම අවස්ථාවකම ඉඳගැනීමට වෙළඳ සේවක සේවිකාවන්ට ඉඩ ලබාදෙන නීතියක් පසුගියදා තමිල්නාඩු ප්‍රාන්තය තුළ සම්මත විය. මෙතෙක් කල් මෙම සේවිකාවන්ට තිබූ එකම පහසුව දිවා ආහාරය සඳහා ලැබෙන විනාඩි 20 ක් පමණි. මෙම නීතිය සම්මත වීමට පෙර සමහර වෙළඳසැල්වල පාරිභෝගිකයින් නැති විටදී පවා ඉඳගැනීමට මෙම සේවිකාවන්ට ඉඩ නොලැබුණි. මෙම නීතිය සම්මත කිරීම වෙළඳ සේවක සේවිකාවන්ට යම් සහනයක් අත්කර දී ඇත. කෙසේ නමුත් ඉඳගැනීමට ඇති අවස්ථාවත් නීතියකින් ලබාදීමට සිදුවීම තුළ අප ජීවත් වන ධනේශ්වර ක්‍රමයේ අමානුෂික ස්වභාවය පැහැදිලි වෙයි. මේ ස්වභාවයේ නීතියක් ඉන්දියාව තුළ පළමු වරට සම්මත කරන ලද්දේ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය ඇතුළු වාමාංශික පක්ෂ සන්ධානයක් ආණ්ඩු කරන කේරළ ප්‍රාන්තය තුළ 2018 වසරේදීය.

## ගර්භණීභාවයට නීති





ලොව පුරා කාන්තාවෝ සිය ප්‍රජනක සෞඛ්‍ය සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම සඳහා අරගලයක යෙදී සිටිති. මේ වන විට ඇමරිකාවේ ටෙක්සාස් ප්‍රාන්තයේද මෙම අරගල ක්‍රියාත්මක වීම දක්නට ලැබෙයි. මේ අතර ඉරානයේ ගර්භණීභාවයට පත් වන කාන්තාවන් ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීමට කටයුතු තිබේ. මෙය සිදුකර ඇත්තේ ගබ්සාව වැළැක්වීම සඳහාය. මේ අනුව ඉදිරියේදී විද්‍යාගාරවලට ගර්භණීභාවය තහවුරු කෙරෙන කාන්තාවන් පිළිබඳව රජයේ ආයතනවලට වාර්තා කිරීමට සිදුවනු ඇත. මෙය කාන්තාවන්ට සිය ශරීරය සම්බන්ධය ඇති අයිතියට රජය විසින් අතපෙවීමක් බවට සමාජ මාධ්‍ය ජාලා තුළ මත පළවෙමින් තිබේ.



# ලංකාවේ කළු ආර්ථිකයේ කතාව

*ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කළ 2021 වසර මැද මූල්‍ය තත්ව වාර්තාව පිළිබඳව ඔක්තෝබර් 08වැනි දින පාර්ලිමේන්තුවේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින් සිදු කරන ලද කථාවේ සංක්ෂිප්ත සටහනයි.*



අපි දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ අයවැය වාර්තා, මහ බැංකු වාර්තා මුදල් අමාත්‍යාංශ වාර්තා තුළ අඩංගු සංඛ්‍යා දත්ත විශ්ලේෂණය කරමින් කරුණු ඉදිරිපත් කර තිබෙනවා. අද අපිට අවශ්‍ය නම් සංඛ්‍යා දත්ත විශ්ලේෂණයකට යන්න පුළුවන්. සංඛ්‍යා දත්තවලින් ඔබ්බට ගිහිල්ලා ආර්ථික අර්බුදය ජන ජීවිතවලට බලපෑම් කරමින් තිබෙන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ.

කිරිපිටි මිලදී ගැනීම සඳහා දිග පෝලිම් ගෑස් මිලදී ගැනීම සඳහා දිගු පෝලිම් සහ සතොසෙන් සීනි කිලෝවක් මිලදී ගන්න දිග පෝලිම් අපි පසුගිය දවස්වල දැක්කා. කන්ටේනර් 80ක් විතර නිදහස් කරගන්න බැරිව වරායේ හිර වෙලා තිබුණා. එදිනෙදා වගාකරන්න පොහොර ලබාදෙන්න ආණ්ඩුවට බැරි වුණා. එදිනෙදා මිලදී ගන්න භාණ්ඩවල මිල ගණන් විශාල ලෙස ඉහළ යමින් තිබෙනවා. මෙය පාලනය කිරීමට ආණ්ඩුව විවිධ ගැසට් නිවේදන නිකුත් කළා. ඊට අමතරව හදිසි නීතිය ප්‍රකාශයට පත්කළා. අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස්වරයෙක් පත්කළා. හැබැයි එවැනි නිවේදන හා නීති ඉක්මවා යන අර්බුදයක් අපේ රටේ තිබෙනවා. ඒ තරමට මේ අර්බුදය පිටාර ගලමින් තිබෙනවා. ඒ නිසා හාල් මිල පාලනය ඉවත් කරන්න කැබිනට් මණ්ඩලයට සිදුවුණා. මෝල්හිමියන් විසින් පසුවදාම හාල් මිල ප්‍රකාශයට පත්කළා. ඉතා හොඳින් සලකා බැලුවොත් කැබිනට් මණ්ඩලය හා මෝල් හිමියන් අතර එකඟතාවයක්ද කියන සැකය තිබෙනවා. සඳුදා හාල් මිල පාලනය ඉවත් කරනකොට අඟහරුවාදා මෝල් හිමියන් හාල් මිල ප්‍රකාශයට පත්කළා. කැබිනට් මණ්ඩලය හදිසියේ 07 වෙනිදා රැස්වෙලා කිරිපිටි ගෑස් සිමෙන්ති පාන් පිටි ආදී භාණ්ඩ ගණනාවක පාලන මිල ඉවත් කළා.

මේ සියල්ලන්ගෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද? දත්ත වාර්තා, නියෝගවලින් පාලනය කරන්න බැරි ගැඹුරු ආර්ථික අර්බුදයක අපේ රට ගිලී තිබෙන බවයි. ගමන් කරමින් තිබුණු ආර්ථික දිසානතිය අනතුරුදායක බව අපි දීර්ඝ කාලයක් තිසේසේ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබුණු අර්බුදය මෙවැනි කඩාවැටීමකට යන බව අපි පාර්ලිමේන්තුවේදීත් ඉන් පිටතත් සාකච්ඡා කරමින් තිබෙනවා. ණය මත ගොඩනැගුණු මහා කොන්ක්‍රීට් වනාන්තර ජනතාවගේ ජන ජීවිතය එක්ක සම්බන්ධ නොවන බව අපි පෙන්වා දුන්නා. මේ ආර්ථික මාර්ග යෙන් රට හෝ ජනතාවගේ ජීවිත උසස් නොකරන බව අපේ ඇස් ඉදිරිපිට අද පෙන්නුම් කරමින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් වූ ආර්ථික උපායමාර්ගය විතරක් වැදගත් වෙන්නේ නැහැ. මේ හා බැඳුණු අත්හරින්න බැරි වංචා දූෂණ මහා පරිමාණයෙන් සිදු කරනවා. ඇමතිවරයා සමහර ව්‍යාපෘති ආරම්භ කරන්නේම තමන්ට ලැබෙන කොමිස් මුදල මතයි. දීර්ඝ කාලයක් මෙයින් අත්පත් කරගෙන තිබෙන ණය බර මේ අර්බුදයේ හේතුවක් බවට පත්වී තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් නෙළුම් කුළුණ ආලෝකයෙන් බැබලෙනවා. කුරහන් පාට වර්ණයෙන් කොළඹ නගරයේ කුළුණක් බැබලුණාට සාමාන්‍ය ජනතාවගේ ජීවිතවල තිබෙන්නේ අඳුරු කළු වර්ණයක්.

අපිට ප්‍රශ්න මල්ලක් තිබෙනවා. අපිට සල්ලි මල්ලකුත් තිබෙනවා. ප්‍රශ්න මල්ලේ ප්‍රමුඛතාවයක් අපි හැදිය යුතුව තිබෙනවා. ප්‍රශ්න මල්ලේ ප්‍රමුඛතාවය අනුව සල්ලි වියදම් කළ යුතුව තිබෙනවා. එහෙම ප්‍රමුඛතාවයක් නැතුව වියදම් කර අධික බරක් ආර්ථිකයට එකතු කර තිබෙනවා. මත්තල ගුවන්තොටුපලට ඩොලර් මිලියන 243.8ක් වියදම් කර තිබෙනවා. අද අපිට ලැබී තිබෙන ප්‍රතිඵලය මොකක්ද? සංචාරක ඇමතිවරයා කැබිනට් පත්‍රිකාවක් දාලා මත්තල ගුවන්තොටුපලේ යානා ගොඩ බැස්සවීමට එකඟ වෙනවානම් අවුරුද්දක කාලයක් ගාස්තුවලින් නිදහස් කළා. මත්තල ගුවන්තොටුපලට ගුවන් යානා ගෙන්වා ගැනීම වෙනුවෙන් බණ්ඩාරනායක ගුවන්තොටුපලේ අය කිරීම 50% කින් කපා හැරීමට යෝජනා ගෙනාවා. මේ කොන්ක්‍රීට් වනාන්තර ආර්ථිකයකට බරක් වී නැද්ද? ඒකේ ප්‍රතිවිපාකවලට අද රට මුහුණ දී තිබෙනවා. සූරියවැව ක්‍රීඩාංගණයට රුපියල් බිලියන 3.4ක් වැය කළා. තරග කීයද ක්‍රීඩා කළේ කියල හොඳට හොයල බලන්න. මේ ඊනියා සංවර්ධන මාවත අද මේ රට අර්බුදයට පත්කර තිබෙනවා. මේ නිසා එක එක වර්ගයේ ණය ගන්න සිදුව තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, රාජ්‍යයන් අතර එකඟතාවයන් සහ ස්වෛරීත්ව බැඳුම්කරවලින් ණය ලබාගත්තා. හැබැයි දැන් ණය නොදෙන තත්වයට අපව බ්ලැක්ලිස්ට් කර තිබෙනවා.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඩොලර් බිලියන 2.5ක් ණය ගන්න උදය ගම්මන්පිල ඇමතිවරයා 2021.08.24 කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මේ ණය එම්එස් කන්සෙප්ට් ග්ලෝබල් මූල්‍ය ආයතනයේ ගනුදෙනු සම්බන්ධ ඇමරිකාවේ පීඑස්එල් සමාගම අතමැදියන් ලෙස යොදා ගත්තා. ණය මුදල ලබා ගැනීමේ කොමිස් මුදල වශයෙන් 7%ක් දෙන්න ඕනෑ. ඩොලර් මිලියන 2500ක කොමිස් මුදල් කියන්නේ ඩොලර් මිලියන 175යි. ණය ගන්නේ 3% පොලියට. ඩොලර් මිලියන 175 රුපියල්වලින් බැංකුවේ අනුපාතයට බලන්න නම් 203කින් වැඩි කරන්න. කළු කඩේ අනුපාතයට නම් 255න් වැඩි කරන්න. මෙන තරම් ධනස්කන්දයක්ද මේ. මේවා නිකන් සිදුවන දේවල් නෙවෙයි. අද ලෝකයේ කොතනක වංචා දූෂණ ගැන එළිදැක්වෙනවානම් අපේ රට ගැනත් සඳහන් වෙනවා. පැනමා පේපර්ස්වලින් එළියට ආව 335කගේ නාම ලේඛනයේ අපේ රටේ දෙන්නෙකුත් ඉන්නවා.

කළු ආර්ථිකයේ යටගියාව ගැන උදාහරණ පසුගියදා එංගලන්තයත් ඇමරිකාවත් එක්වී එයාර් බස් ගැන කළ පරීක්ෂණවලිනුත් හෙළි වුණා. ප්‍රංශයේ එයාර් බස් සමාගම ලෝකයේ බොහෝ රටවලට වැඩිපුර එයාර් බස් විකුණන්න කොමිස් මුදල් ලබාදී තිබෙනවා. මේ ගැන හොයන්න ඒ රටවල් තුන එකතුවී සාමූහික පරීක්ෂණයක් කළා. ඒ වකවානුවේ එයාර් ලංකා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී කපිල චන්ද්‍රසේනගේ බිරිඳගේ ගිණුමට බෲනායිවල පිහිටි ෂෙල් ගෑස් සමාග මක් හරහා ඩොලර් මිලියන දෙකක් බැරකර තිබෙනවා. පරීක්ෂණවලින් හෙළිවුණේ මුළු අල්ලස් මුදල ඩොලර් මිලියන 16ක් බවයි. එයින් දෙකක් ලබාදී තිබෙනවා. අවසානයේ ගුවන් යානා මිලදී ගැනීම අහෝසි කරන්න සිද්ද වුණා. ඒ වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඩොලර් මිලියන 108ක වන්දියක් ගෙව්වා. කොමිස් මුදලෙන් ලැබිය යුතුව තිබුණු ඩොලර් මිලියන 14ක් ලැබුණේ නැහැ. ගනුදෙනුව සම්පූර්ණ නොවුණ නිසයි ඒ මුදල නොලැබුණේ. බෲනායි බැංකු ගිණුමෙන් ඕස්ට්‍රේලියාවේ තිබෙන කපිල චන්ද්‍රසේනගේ ගිණුමට සල්ලි ඇවිත් ඒ හරහා ලංකාවට ආවා.

> **ඉස්පිරිතාලයේ බෙහෙත් පෙත්ත ගන්න නැතිව, තමන්ගේ අස්වැන්න විකුණාගන්න බැරිව, මේ රට පිළිබඳව අපේක්ෂාභංගත්වයට පැමිණ රට හැර යන්න උත්සාහ කරන, ධීවරයාගේ ප්‍රශ්න ආදියෙන් හෙම්බත්වී හූල්ලන ජනයාගේ ධනය එක්රැස්වී තිබෙන්නේ කොතැනද?**

ආර්ථිකය කඩාවැටීමට හේතු වූ කළු ධනය සැරිසරන්නේ ඒ විදියටයි. ඒ විතරක් නෙවෙයි. එක්සත් ජනපදයේ ඉමාඩ් සුබේරි කියන සීඅයිඒ නියෝජිතයා බදු මුදල් වංචා කිරීම ඇතුළු කරුණු කිහිපයකට අත්අඩංගුවට ගත්තා. ඔහු අධිකරණයෙන් වැරදිකරු වී අවුරුදු 12ක සිරදඬුවමක් නියම කළා. ඒ පරීක්ෂණවලදී හෙළි වුණේ 2013 - 2014 කාලයේ ඉමාඩ් සුබේරි වෙත ශ්‍රී ලංකා මහබැංකුව ඩොලර් මිලියන 6.5ක් ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය කරන්න ලබාදුන් බවයි. එය ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් මිලියන 1300ක්. ඇමරිකාවේ පරීක්ෂණවලින් හෙළිවී තිබුණේ සුබේරි ප්‍රතිරූපය ගොඩනග න්න වැය කර තිබුණේ ඩොලර් ලක්ෂ 8.5ක් පමණක් බවයි. ආසන්න වශයෙන් ඩොලර් මිලියන 5.5ක්ම පෞද්ගලික පරිහරණයට අරන්. මේ ඩොලර් මිලියන 6.5 දුන් අයට කොමිස් ලැබෙනවා.

එදා මහබැංකුවේ අධිපතිවරයා අජිත් නිවාඩ් කබ්රාල් ඔහු නැවත මහ බැංකුවේ අධිපති කරන්න කලින් ඩොලර් මිලියන 5.5ක් වංචා කිරීම ගැන සොයන්න තිබුණා. නමුත් පරීක්ෂණ නැතිවම මේ අය මේ පුටුවල නැවත වාඩි කරන්නේ ඇයි කියලා මම දැනගන්න කැමතියි. මේ අතර තමයි පසුගියදා තිරු කුමාර් නඩේසන්ගේ ප්‍රශ්නය ආවේ. අපේ රටේ තිබෙන ආර්ථිකයේ කළු පැත්ත ගැන මා නැවත නැවත කියා තිබෙනවා. ඉස්පිරිතාලයේ බෙහෙත් පෙත්ත ගන්න නැතිව, තමන්ගේ අස්වැන්න විකුණා ගන්න බැරිව, මේ රට පිළිබඳව අපේක්ෂාභංගත්වයට පැමිණ රට හැර යන්න උත්සාහ කරන, ප්‍රශ්න ආදියෙන් හෙම්බත්වී හූල්ලන ජනයාගේ ධනය එක්රැස්වී තිබෙන්නේ කොතනැද?

තව උදාහරණයක් ගිං නිල්වලා යෝජනා ක්‍රමයෙන් දැක්වෙනවා. මේ යෝජනා ක්‍රමය වෙනුවෙන් ජනාධිපතිවරණයට පෙර සති 03ක් තුළ මේ සමාගමට ආසන්න වශයෙන් රුපියල් මිලියන 4000ක් ගෙවනවා. චීනයේ සීඒඑම්සී කියන සමාගමෙන් රුපියල් මිලියන 4000ක් ගෙවලා තිබෙන්නේ කොන්ත්‍රාත් ගත් රෙඩ් රූත් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් සමාගමේ ගිණුමටයි. රෙඩ් රූත් ඉන්වෙස්ට්මන්ට් සමාග මේ හිමිකරු නඩේසන්. මේ සමාගම විසින් ආසන්න වශයෙන් ඩොලර් මිලියන 5.9ක් තිරු නඩේසන්ගේ හොංකොං ගිණුමට බැර කරනවා. තිරු නඩේසන් ගම්පහ මල්වාන ප්‍රදේශයේ අංක 111/3, මහවත්ත මල්වාන ලිපිනයේ අක්කර 17ක ඉඩම අරගෙන තිබුණා. තක්සේරු මිල රුපියල් මිලියන 64යි. නමුත් වික්කේ රුපියල් මිලියන 30කට. ඔහු කියනවා රුපියල් මිලියන 30න් 20ක් බැංකුකින් සහ ඉතිරි මිලියන 10 පුද්ගලයෙකුගෙන් ණයට ගත් බවයි. ඊට අමතරව ගෙවන්න තිබෙන රුපියල් මිලියන 34 දීල තියෙන්නේ මුදිත ජයකොඩි. මුදිත ජයකොඩිගේ සාක්ෂියේදී කියන්නේ ඒ මිලියන 34 දුන්නේ නඩේසන් කියලා. අක්කර 17ක පොල්වත්ත මිලදී ගන්න නඩේසන් රුපියල් මිලියන 64ක් විදයම් කරනවා. අන්න ඒ තිරු නඩේසන්ගේ අංක 11220000091 දරණ නේසන් ට්‍රස්ට් බැංකුවේ කුරුඳුවත්ත ශාඛාවේ ගිනුමෙන් අර කියූ බැංකු ණය මුදල හිලව් කරනවා. නේසන් ට්‍රස්ට් ගිණුමට සල්ලි එන්නේ හොංකොංවල තියෙන රෙඩ් රූත් ඉන්වෙස්ට්මන්ට් සමාගමෙන්. මේ ගිණුමට සල්ලි යන්නේ ගිං නිල්වලා යෝජනා ක්‍රමයෙන්.

මේවා කිව්වට කරපු දෙයක් නැහැ කියලා බොහෝ අය කියනවා. ඒක මම දන්නවා. හෙටත් මොකුත් වෙන්නේ නැහැ. මේ රටේ පරීක්ෂණ යනු සත්‍යය වසන් කිරීම හා අපරාධකරුවන් නිදහස් කිරීමයි. චයිනා හාබර් සමාගම තමයි හම්බන්තොට වරාය ඉදිකළේ. වෙනුවෙන් ඩොලර් බිලියන 1.3ක් වැය වී තිබෙනවා. 2015 ජනවාරි 08 තිබුණු ජනාධිපතිවරණයේදී වර්තමාන අගමැතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් එම සමාගම ඩොලර් මිලියන 7.6ක් වැය කළ බව එතුමා දන්නවා. චෙක්පත් අංකත් එක්ක මම ඉදිරිපත් කර තිබෙනවා. ලංකාවේ මැතිවරණයක එක් අපේක්ෂකයෙකුට චයිනා හාබර් සමාගම සල්ලි දෙන්නේ ඇයි? අපේ රටේ ආර්ථිකය කඩා වැටීමට මේ වංචා දූෂණ සැලකිය යුතු ප්‍රමාණයකට ඉවහල් වී තිබෙන බවයි මට කියන්න ඕනෑ.

චයිනා මර්චන්ට් ඉන්ජිනියරින් සමාගම පුෂ්පා රාජපක්ෂ අරමුදලට 19,500,000ක් සල්ලි දානවා. ඒ ගොල්ලන්ට කොළඹ වරාය දකුණ ජැටිය ලබාදෙනවා. වරාය ආසන්නයේ අක්කර 13කුත් දෙනවා. මේ ව්‍යාපෘති හා ගනුදෙනු අතර සම්බන්ධය ඕනෑම සිහිබුද්ධිය තියෙන කෙනෙක් දන්නවා. ආර්ථික අර්බුදයේ එක් පැතිකඩක් විතරයි මුදල් වාර්තාවලින් පෙන්වන්නේ. හැබැයි මුදල් වාර්තාවලින් නොපෙන්වන කළු ආර්ථික කතාවක් අපේ රටේ තිබෙනවා. ඒ කළු ආර්ථික කතාවට අපි විසඳුම් හොයන්නේ නැත්නම් මොන අයවැය ලේඛන ඉදිරිපත් කළත් මොන ආර්ථික සැලසුම් හැදුවත් වැඩක් නැහැ. ආර්ථිකයේ ණය අර්බුදය ආර්ථිකය කඩා වැටීම පිටුපස තිබෙන්නේ දැවැන්ත වංචා දූෂණවලට උදව් දෙන දේශපාලනයක්. ව්‍යාපෘතියක් තීරණය විය යුත්තේ අමාත්‍යවරයාට ලැබෙන මුදල් ප්‍රමාණය මත නම් අර්බුදයෙන් ගොඩ එන්න බැහැ. ඒ දූෂිත දේශපාලනයට තිත තියන්න සූදානම් නැත්නම් රටට ගොඩ එන්න බැහැ.

# පෝ ලිටිකල් පංතිය

දවසක් පොලිටික්කා ළමයි එන්නත් කලින්ම පංතියට ඇවිත්, මල්ලෙන් කඩදාසි වගයක් අරගෙන ඇස් පුංචි කර කර බලනවා. මේ අතරේ ළමයි කිහිපදෙනෙක් ඇවිත් ඉඳගත්තත් කවුරුවත් ගුඩ් මෝනිං කියන්න ගියේ නැහැ, දැහැන බිඳෙයි කියලා.

"ගුඩ් මෝනිං සර්" අනුරුද්දිය වසන්තියව ඉස්සර කරගෙන පංතියට ඇතුල් වුණා.

"වෙරි ගුඩ් මෝනිං සර්" වසන්තිය සද්දෙටම කිවුවෙ අනුරුද්දය කියපු මෝනිං පාර ඇහුණෙ නෑ කියල හිතාගෙන.

"ආ ඔය ළමයි ආවද? ආයුබෝවන්, ගුඩ් මෝනිං!" පොලිටික්ක සද්දෙ සැරට දැහැනෙන් මිදුණා.

"මොනවද සර් ඔච්චරටම බලන්නෙ" අනුරුද්දය ඇහුවේ ගුඩ් මෝනිං ප්‍රතිචාරෙ ආවෙ නැති කොක්කටත් එක්ක.

"මේ වටිනා ලේඛනයක්, ලංකාවෙ වකුගඩු රෝගෙට හේතුව හොයාගෙන" පොලිටික්කා රාජ්‍ය රහසක් කියන්න වගේ පංතිය දිහා බැලුවා, "දැන් කාටත් තේරෙයි ගෝඨා සර් රසායනික පොහොර තහනම් කළේ ඇයි කියලා."

"මොකක්ද සර් ඕකෙ කියලා - ලියලා තියෙන්නේ" කනියගෙ කට කහනවා.

"මේකෙ අපි දැනන් හිටපු නැති ගොඩක් දේවල් තිබෙනවා. මේක පෝරත් එක්ක ආසනික් පස්වලට උඩින් එකතු වෙලා කියලා ඔප්පු කරපු දත්ත වගයක්" පොලිටික්කා කඩදාසි එකින් එක අතට ගන්නව.

"කොහොමද සර් එහෙම කියන්නේ" මංජුව කොණක් පාදගන්න බලනව.

"මේකෙ තියෙනවා පස්වල ආසනික් උඩ හරියෙදි වැඩියිලු, යටදි අඩුයිලු. ඒකෙන් පේනවා ආසනික් එකතු වෙලා තියෙන්නෙ උඩින් කියලා" පොලිටික්කා කොලර් එක අතගෑවෙ සොයිල් ප්‍රොපෙසර් කෙනෙක් වගේ.

"ඉතින් සර් කොහොමද හරියටම කියන්නේ මේක පිටින් එකතු වුණාමයි කියල. ස්වභාවිකව වෙන්න බැරිද? මංජුව අතුරු ප්‍රශ්නයක් දැම්ම.

"ආසනික් එකතු වුණේ ස්වභාවිකව නම් පස් යට ඉඳන් හැදෙන කොට වැඩියෙන් තියෙන්න ඕන යට..." පොලිටික්කා පුටුවෙන් නැගිටලා විග්‍රහය පටන් ගන්න කොටම සමන අත උස්සගෙනම නැගිට්ට.

"කවුද සර්ට, පස් යට ඉඳන් හැදෙනව කිවුවෙ. ඔය කතාව ඩොක්ට පාදෙනියත් කියන්න ගිහින් හොඳටම ඇන ගත්ත සර් දැක්කෙ නැද්ද?" සමනගෙ කතාවට පොලිටික්ක ආපහු පුටුවට වැටුණා.

"ඇයි පස් හැදෙන්නෙ පොළොවෙ යට ඉඳල නොවෙයිද?" පොලිටික්ක අන්දුන් කුන්දුන්.

"පාංශු විද්‍යාඥයො කියන විදිහට ලෝක ඉතිහාසයේ පුරාම පස් සෑදුණෙ මතුපිට මව් පාෂාණ දිරන්න පටන් අරන් උඩ ඉඳන් පහළට. ඒ නිසා ඒ ගල් දිරනකොට ඒව ඇතුළෙ ඛනිජ පසට එකතු වෙනවා... හැබැයි ඊයෙ පෙරෙයිදා ඉඳලා ඒක වෙනස් වුණාද දන්නෙ නෑ" සමනගෙ අන්තිම කෑල්ලට පංතියටම හිනා පැන්න.

"ඔය ළමයි නාඩගම්කාරයෝ බලනවද? "පොලිටික්කා මාතෘකාව එකසිය අසූවක් ආපිට කැරකෙව්ව.

"ඇයි සර් ඒකෙ පස්වල ආසනික් ගැන වෙන කතාවක් කිවුවද?" කනිය අග මුල ලෙහන්න බැලුව.

"නෑ ළමයිනේ. මං ඇහුවෙ දැන් ඒක නැගල යනව නේද?" පොලිටික්ක පස් ගැන කතාවක් කරලම නෑ වගේ.

"සර් කියන්නෙ ටීවී එකේ නාට්‍යය ගැන නේද?" වසන්තිය පොලිටික්ක අතට පිදුරු ගහ දික් කළා.

"ඔව් ඔව් ළමයිනේ. ඔය ළමයි බලනවද?" පොලිටික්ක පිදුරු ගහ හයියෙන් අල්ල ගත්තා.

"දැන් ඊට වඩා දස්ස නාඩගම්කාරයෝ ටිකක් ඉන්නවා" මංජුව වමටම කැපුව. "විමල්ල, ගම්මන්පිලල, වාසුල සෙට් එකත් එක්ක ටීවී එකේ අයට හැරෙන්නවත් බෑ. ආණ්ඩුව කුජීත වෙනකොට අපි ඒවට නෑ කියල එයාල ඇඳිවත බේරගන්න හදනව... හැබැයි ඇතුළෙ පිට කියල නෑ ඔය ඔක්කොටම රෙදි නැතුව තමයි යන්න වෙන්නේ."

"එන පොට හොඳ නෑ. දුවමු මිතුර දුවමු..." කවුරු හරි පිටිපස්සෙ පේලියෙන් කියන කොට පොලිටික්කා මේසෙ උඩ කඩදාසි ටික පොඩිකරගෙනම හම් මල්ලට එබුවා.

කවුළුව හැර තබමි

# පොළොව සිප නොගෙන එය අස්වැද්දූ මිනිසුන්



විප්ලවවාදියෙකු පළමු කොට තමා විසින් තමාවම සොයා ගත යුතු යැයි කියමනක් තිබේ. ඉන්පසු ඔහුට සමාජය තුළ තමන් ස්ථානගත වී සිටින ස්ථානයද එම ස්ථානගතය මිනිසෙකුට යුක්ති සහගතද මිනිස්කමට සුදුසුද නොඑසේනම් එසේ වී ඇත්තේ ඇයිද යන්නද සොයා ගැනීම පහසු කරනු ඇත.

මේ අප කතා කරන මිනිසුන්ද පළමුව තමා විසින් තමාව සොයාගෙන එම 'තමාව' අනෙකාගේ ජීවිත සුවපත් කිරීම සඳහා කැපකළ මිනිසුන්ම වේ. අපි ඔවුනට සුපුරුදු බසින් ඉල්මහ විරුවන් යැයි කියමු. එය ඔවුන්ව අර්ථ ගැන්විය හැකි දුප්පත්ම හා පටුම වදන් පෙළ යැයි අපට සිතේ. මන්ද ඔවුන් එක මසකට, එක වසරකට, එක පළාතකට සැබැවින්ම ගත් කළ එක දේශයකට පමණක් සීමාවූ විරුවන් නොවන නිසාය. ඔවුන් තම දිවි මුදා හළේ මුළු මහත් මිනිස් සංහතියම වෙනුවෙනි. මුළු මහත් මිනිස් සංහතියේම යහපත උදෙසා වූ ලාංකේය කොටස ඉටුකිරීම වෙනුවෙනි.


තරුද, විරුද යන්ත්‍රානුසාරයෙන් නිපදවන රටක ඔවුන් නම් සැබෑ මිනිස් විරුවන්මය. ඒ මිනිස් විරුවන්ට මඟ හසර කියාදුන් මහා විරු නියමුවා වූයේ අපේ රෝහණ විජේවීර සහෝදරයාය.

සැබෑ විරුවෙකු නම් ඔහු පළමුව පවත්නා ආචීර්ණ කල්පිත සමාජ සම්මතයන්ගෙන් විනිර්මුක්ත විය යුතුය. දෙවනුව අසීමිත මානව ප්‍රේමයෙන් උතුරා ගිය කෙනෙකු විය යුතුය. තෙවනුව ලොව දුක්විඳින මිනිසුන්ගේ විමුක්තිය පතා නොබිඳෙන නොසැලෙන ධෛර්යයෙන් සටන් වැදිය යුතුය. මේ සියල්ල සඳහා අවශ්‍ය වඩාත්ම විශ්වාස කටයතු මිනිස් දැනුම් සම්භාරය ඔහු සතුකර ගත යුතුය. රෝහණ විජේවීරයන් යනු ඒ සුදුසුකම් ඉහළින්ම සපුරාලූවෙකි.

ඒ නිසාය, ඔහුට සහ ඔහු නායකත්වය දුන් ව්‍යාපාරයට නග්න ස්වාර්ථකාමයෙන් තොර ආදරණීය මිනිස් සටන් සගයන් දස දහස් ගණනක් නිර්මාණය කළ හැකි වූයේ.

මිනිස් වර්ගයා ලෝක ඉතිහාසය වෙනස් කිරීමට දායක වූ ශ්‍රේෂ්ඨ මිනිසුන්ට කෙදිනක හෝ කෘතගුණ දක්වනු ඇත.

# සුරලොව සහ නරලොව



ලොව විනාශය කරා ගිය බොහෝ රටවල් එසේ වූයේ එම රටවල පාලකයන් සහ ඔවුන්ගේ පවුල්වල දූ දරුවන් ජනතාව අසීමිත ලෙස සූරාකමින්, රටේ සම්පත් විකුණාකමින් සුර සැප විඳිමින් පිස්සු කෙළීම නිසා බව පැහැදිලි සත්‍යයකි. දැන් අපේ රටේද අපි එයම අත්විඳිමින් සිටිමු.

රජ පවුලේ හුරතලා චී චී බේබි වරක් රොකට් එකක් යැව්වේය. ඒ සඳහා ගිය වියදම ඩොලර් මිලියන 372ක් ලෙස වාර්තා විය. පුතුගේ ගගනගාමී ආසාව වෙනුවෙන් මහරජුට එය 'නතිං' විය. රොකට්ටුව ආගිය අතක් නැත. ඉන්පසු සිංදු කිව්වේය; නැටුවේය. දැන් අලුත්ම එක ක්‍රිකට් ක්‍රීඩාවට අවතීර්ණ වීමය. වැඩිකලක් නොගොස්ම ඔහු ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා වීමටද ඉඩ ඇත. මේ ගමනේදී රටේ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයන් කිහිප දෙනෙකුටම පරලොව සම්ප්‍රාප්ති ගතවීමට ඉඩකඩ සැලසිය හැකිය.

නාමල් බේබි කලක් රගර් ගැසුවේය. ඔහු ඉදිරියේ හැමෝම පරාජය විය යුතු බව මහරජාගේ නියෝගය විය. සියලු පිස්සු නැටූ ඔහු දැන් රටේ ක්‍රීඩා ඇමතිය. ඊට අමරව තවත් අමාත්‍යාංශ ගණනාවක ලොක්කාය. දැන් ඔහුගේ අලුත්ම ආසාවේ ප්‍රතිඵලය පෝට් සිටියේ 'වැලි කඳු කාර් රේස්' පැදීමය. එම සිහිනයද දැන් සැබෑවී හමාරය.

රාජපක්ෂ බේබිලා එසේ ජනතා මුදලින් ෆන් ගනිද්දී ජීවන බරින්, බඩු මිලෙන්, බදු බරින්, පොහොර, කිරි පිටි, ගෑස්වලින් බැට කනවා මදිවාට කුසට පාන් පෙත්තක්වත් දමා ගැනීමට තරම් මුදලක් අත නොමැතිව රටේ දුගී දුප්පත් පවුල්වල අහිංසක දරුවන් සහ මව්පියන් සිය ගණන් වසරකට මිය යති.

දැන් ලෝක දෙකේ වෙනස ඉතා පැහැදිලිව වෙන්වී පෙනේ. රජ පවුලේ දරුවන් ගුවන්ගත වෙද්දී රටේ දුප්පත් දරුවන්ට සිදුවන්නේ භූගත වන්නටය. සුරලොව සහ අපාය පැහැදිලිව දිස්වේ.

නිකමුන් අතලොස්සකගේ සැප උදෙසා, බහුතරයක් ජනයා නිකරුනේ අපා දුක්විඳින අතීතයකට, වර්තමානයකට, උරුමකම් කියන අපි අනාගතයටත් එයම උරුමකර දෙමුද? නැතිනම් සුරලොව කළඹන දේශපාලන අවි අතට ගනිමුද! තීරණය අප අපම සතුය.

# එක රටක් - එක නීතියක්...

'එක රටක් එක නීතියක්' ජනාධිපති විශේෂ කාර්ය බලකායේ සභාපතිකමට ඥානසාර හිමිව පත් කරනු ලැබ තිබීම මේ දිනවල ප්‍රසිද්ධ පුවතකි. එම පත්වීම කර ඇත්තේ ගෝඨාභය ජනාධිපතිවරයාය.

මේ විකාර පාලනය සහ උන්මත්තක පාලකයා ගැන තවත් නම් කවර කතාද?

මිනිස් ලේවලටම ඉව අල්ලන ජාතිවාදී උන්මත්තක පාලකයන් සහ ඔවුන්ට ආසිරි පැන් ඉසූ එවැනිම පූජකයන් නිසා කෙතරම් මිනිස් ජීවිත ලේ සයුරු මත ගිල්වා දමනු ලැබ තිබේද යන්න ඉතිහාසය දන්නා මිනිසුන්ට නම් අමුතුවෙන් පහදා දිය යුතු නැත.

නීතියයි රටයි දෙකම තමන්ගේ යැයි සිතා සිටි පාලකයන් අතර, හිට්ලර්, ඉඩි අමීන්, බොකාසා, මාර්කෝස් වැනි ම්ලේච්ඡ පාලකයන් සිටි රටවල අහිංසක මිනිසුන් කෙතරම් ලේවලින් වන්දි ගෙව්වේද?

මෙවැනි තනතුරක් භාරදීමෙන්ම මේ රට ගමන් කරන්නේ කුමන දිසාවටද, මේ රටේ අහිංසක සිංහල, දෙමළ, මුස්ලිම් මිනිසුන්ගේ ඉරණම කෙබඳු විය හැකිද යන්න සිතා ගැනීමට පොත් සිය දහසක් කියවා දැනුම ලබා ගත යුතු නැත. මේ නම් රටේ සෑම පුරවැසියෙකුගේම හිසට උඩින් අසිපතක් එසැවී ඇති බවට දෙන සංඥාවක්ම මිස වෙන අන්කවරක්ද?

බුදුන් වදාළේ 'අත්තූංකම්මන-පරවම්මන' එපා කියාය. එනම් තමන් උසස් කොට අනුන් පහත් නොකරනු කියාය. ආගමත් ජාතිකත්වයත් විකුණා කමින් තම සුපිරි දිවිපැවැත්ම ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය සියලු සැප සම්පත් පාලකයන්ගෙන් වරදාන ලෙස ලබමින්, ඊට කෘතගුණ ලෙස ජාතිවාදය සහ ආගම්වාදය පතුරුවා මේ වියරු උන්මත්තක පාලකයන් රකින්නවුන්ට බුදු දහම අනුව කුමන අපායක් හිමිවේදැයි අපි නොදනිමු. එහෙත් රට කරවන්නේ මෙලෙස නම් මුළු රටම අපායක් වන බව නම් නිසැකය.



2021 ඔක්තෝබර් 05

# ආණ්ඩුවේ වැරදි ප්‍රතිපත්ති නිසා රටම රිවස් වී තිබෙනවා

පාර්ලිමේන්තු මන්ත්‍රී
**විජිත හේරත් සහෝදරයා**

*(එකතු කළ අගය මත බදු පනතේ නියෝග පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)*

අපි කවුරුත් දන්නවා. අද ආර්ථිකය තිබෙන්නේ ඉතාම දරුණු ප්‍රපාතයක බව. කොච්චර කයිවාරු ගැහුවත්, කොච්චර සංඛ්‍යාලේඛන ඉදිරිපත් කළත් ඇත්ත කථාව තමයි, අද සීනි පෝලිම් තිබෙනවා, කිරිපිටි පෝලිම් තිබෙනවා, ගෑස් පෝලිම් තිබෙනවා, පොහොර අර්බුදයකට මුහුණ දී තිබෙනවාය කියන එක. ඒ වාගේම බරපතළ ආහාර හිඟයක්, සාගතයක් පැමිණීමේ පෙර නිමිති අප ඉදිරිපිට පහළ වී තිබෙනවාය කියන එක. මේක තමයි ඇත්ත. එම නිසා වචන හරඹවලින් මේ ආර්ථිකය ශක්තිමත් කියලා කියන්න හැදුවාට, ඇත්ත කථාව තමයි අද ආර්ථිකය කඩා වැටිලා තිබෙන බව. මේ කඩා වැටීමට ප්‍රධාන හේතුව කොරෝනා වසංගතය නොවෙයි. ආණ්ඩුව උත්සාහ කරනවා, ආර්ථිකයේ මේ කඩා වැටීමට ප්‍රධාන හේතුව කොරෝනා වසංගතයයි කියලා පෙන්වන්න.

2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ කොරෝනා වසංගතය තිබුණේ නැහැ; රට වහලා තිබුණේත් නැහැ. හැබැයි, එම වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු කියන පළමුවැනි කාර්තුව තුළ අපේ කෘෂි කර්මාන්තය සියයට 5.6කින් කඩා වැටී තිබෙනවා; කර්මාන්ත ක්ෂේත්‍රය සියයට 7.8කින් කඩා වැටී තිබෙනවා; සේවා ආර්ථිකය සියයට 1.6කින් කඩා වැඩිලා තිබෙනවා. ඒ පළමුවැනි කාර්තුවේ ආර්ථික වර්ධන වේගය ඍණ සියයට 1.7යි. එම නිසා මේක කොරෝනා නිසා ඇති වුණු අර්බුදයක් නොවෙයි. අවුරුදු ගණනක් තිස්සේ අපේ රටේ අනුගමනය කළ වැරදි ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් විධියට තමයි මේ ආර්ථිකය කඩා වැටිලා අද ගෑස් පෝලිම්, කිරි පිටි පෝලිම්, සීනි පෝලිම්, හාල් අර්බුද, වී අර්බුද ඇති වෙලා තිබෙන්නේ. ඒ වාගේම, ආහාර අර්බුදයකුත් හෙට දවසේ ඒමට නියමිතව තිබෙනවා.

මෙය කොරෝනා නිසා ඇති වෙච්ච අර්බුදයක් නොවෙයි කියන එක පැහැදිලි වන එක උදාහරණයක් මා කියන්නම්. අපි කවුරුත් දන්නවා, දැන් හාල් මිල තීරණය කරන්නේ ආණ්ඩුවේ පාරිභෝගික කටයුතු ඇමති නොවන බව, කැබිනට් මණ්ඩලයත් නොවන බව. කවුද හාල් මිල තීරණය කරන්නේ ? හාල් මිල තීරණය කරන්නේ ඩඩ්ලි සිරිසේන මහත්මයා ඇතුළු මෝල් හිමියන්. සම්බා හාල් මිල කියද, රතු කැකුළු හාල් මිල කියද, වී මිලදී ගන්නේ කීයටද කියලා තීරණය කරන්නේ කවුද? කැබිනට් මන්ඩලයද?

පොහොර ප්‍රශ්නය ගන්න. පොහොර ප්‍රශ්නය ආවේ කොරෝනා හින්දා ද? නැහැ. යල කන්නයේ තීන්දුවක් ගන්නවා, මහ කන්නයේ -මාස තුනක් තිබියදී- රසායනික පොහොර නවත්වන්න. කෘෂිකර්මය ගැන අංශු මාත්‍රයක හෝ දැනුමක් තිබෙනවා නම්, ගොවිතැන ගැන පුංචි හෝ



දැනුමක් තිබෙනවා නම්, නම් මේ ඔළ මොට්ටල තීරණය ගන්නේ නැහැ. මේ තීරණය නිසා අද මුළු රටම විපතට පත් වෙලායි තිබෙන්නේ; ගොවියා මහ පාරට වැටිලායි තිබෙන්නේ. දැන් මහ කන්නය පටන් ගෙන ඉවරයි. මහ කන්නය පටන් ගන්න කොට පොහොර දෙන්නම් කියලා ආයෙත් කියලා වැඩක් නැහැ. මොකද, දැන් මහ කන්නය පටන් ගෙන තිබෙන්නේ නමුත්, දැන් පොහොර නැහැ; කෘෂි රසායනික ද්‍රව්‍ය නැහැ. ඉන්දියාවෙන් හොරට බෝට්ටුවලින් ගෙන්වන ඒවා. BLACK MARKET එකේ තිබෙනවා. ඒවා ගිනි ගණන්වලට තිබෙන්නේ. හැබැයි, ගොවියාට අවශ්‍ය බෙහෙත් ටික, පොහොර ටික නැහැ. මේ තීන්දුව ගන්න තිබුණේ කාබනික පොහොර ක්‍රමානුකූලව හඳුන්වා දීමෙන් පසුවයි. ඒ නිසා මේක කොරෝනා හින්දා ඇති වුණු අර්බුදයක් නොවෙයි. සීනි අර්බුදය ඇති වුණේ, සීනි කිලෝව රුපියල් 240 දක්වා ඉහළ ගියේ කොරෝනා හින්දාද? නැහැ. ආණ්ඩුව සීනි සඳහා වන බද්ද ශත 25 දක්වා අඩු කළා. එතකොට ජාවාරම්කාරයෝ මහා පරිමාණයෙන් සීනි ගෙනාවා. සීනි මිල ඉහළ දැම්මා. ඒක කොරෝනා එක්ක සම්බන්ධයක් නැහැනේ. හාල් මිල තීරණය වෙලා හාල් අර්බුදයක් ඇති වුණේ කොරෝනා හින්දාද? නැහැ මේ හාල් මාෆියාව හින්දා. ඒක කොරෝනා එක්ක සම්බන්ධයක් නැහැ. ඒ නිසා කොරෝනා නිසා මේ ආර්ථික අර්බුදය ඇති වුණා නොවෙයි. ආණ්ඩුවේ වැරදි ක්‍රමවේද. ප්‍රතිපත්ති හින්දා තමයි මේ අර්බුදය ඇති වෙලා තිබෙන්නේ.

> 2020 වර්ෂයේ පළමුවන කාර්තුවේ කොරෝනා වසංගතය තිබුණෝ නැහැ; රට වහලා තිබුණෝත් නැහැ. හැබැයි, එම වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු කියන පළමුවැනි කාර්තුව තුළ අපේ කෘෂි කර්මාන්තය සියයට 5.6කින් කඩා වැටී තිබෙනවා; කර්මාන්ත ක්ෂේත්‍රය සියයට 7.8කින් කඩා වැටී තිබෙනවා; සේවා ආර්ථිකය සියයට 1.6කින් කඩා වැඩිලා තිබෙනවා.

අද මේ මුළු රටේම ජනගහනය දෙකෝටි විසිලක්ෂයක් වෙනවා. රජයේ මහ බැංකු වාර්තාවේම කියනවා, ජනතාවගෙන් සියයට 42ක් ඉන්නේ දවසකට ඩොලර් දෙකකට වඩා අඩු ආදායමක් ලබන තත්ත්වයේ කියලා. ඒ කියන්නේ, දවසකට රුපියල් 350ක්, 400ක් සොයා ගන්න බැරි, අසූපන්ලක්ෂයක් මේ රටේ තවමත් දුක් විඳිනවා. අන්ත දුප්පත් තත්වයට රටේ ජනතාව බහුතරයක් පත්වෙලා තිබෙන්නේ, මේ වැරැදි ආර්ථික ක්‍රමය නිසා. රටේ සාතිශය බහුතරයක් ජීවත්වීම සඳහා තමන්ගේ දෛනික ආදායම හොයා ගන්න බැරි තත්වයක සිටියදී අනෙක් පැත්තෙන් කෝටි-ප්‍රකෝටි ගණන් කළු සල්ලි විවිධ තැන්වල ජාවාරම්වල යොදවනවා. ඒවා තමයි අද මේ ආන්දෝලයට ලක්වෙලා තිබෙන 'පැන්ඩෝරා' පත්‍රිකාවලින් හෙළි වෙලා තිබෙන්නේ. මෙය, එසේ හෙළි වූ පළමුවැනි අවස්ථාව නොවෙයි.

හැබැයි, දේශපාලනඥයෙකුගේ නමක් සඳහන් වෙච්ච පළමුවැනි අවස්ථාව මේකයි. අද මේ කුප්‍රකට ලේඛන පිළිබඳව, ඒවායේ මේ නම් තිබීම පිළිබඳව ආණ්ඩුව පැහැදිලිව ජනතාව දැනුවත් කළ යුතුයි. ඒක පෞද්ගලික ගිණුමක් කියලා මඟහැර ඉන්න බැහැ. අද චෝදනාවක් තිබෙනවා. ඒ ගිණුම කොයි විධියටද පවත්වාගෙන ගිහින් තිබෙන්නේ? එය 1991 වසරේ ඉඳලා පවත්වාගෙන ගියා නම්, ඒකට මුදල් ගියේ කොහොමද? 2006 වර්ෂයේදී තමයි මුදල් විශුද්ධිකරණය - menoy laundering - පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වුණේ. එතැනින් පසුව ඒ ගිණුමට මුදල් ගිහින් තිබෙනවාද? 2006 වර්ෂයේ Prevention of Money Laundering Act එක සම්මත වුණාට පසුව මේ දක්වා වූ කාලය තුළ මේ කියන කුප්‍රකට ගිණුමට සල්ලි ගිහින් තිබෙනවාද, කොච්චර ප්‍රමාණයක් ගිහින් තිබෙනවාද? කොයි ආකාරයෙන්ද ගියේ? ඒවා හෙළිදරව් කරලා නැත්තේ ඇයි? ඒ ගිණුම් වාර්තා පිළිබඳව ලංකාවේ අදාළ විගණන වාර්තා ඉදිරිපත් කරලා නැත්තේ ඇයි? ඒවා පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද? ඒ විතරක් නොවෙයි. ඒ ගිණුම පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් සම්බන්ධයි කියලායි චෝදනාව තිබෙන්නේ. එතකොට, දේශපාලනඥයෙක් ඍජුවම සම්බන්ධ වෙලා තිබෙනවා. එවැනි අයථා ගනු දෙනුවක් සිදුවුණා නම්, අපේ රටේ මහා පරිමාණ සල්ලි ප්‍රමාණයක් පිටට ගියේ කොහොමද? 1991 වසරේ ඉඳලාම එසේ සිදුවුණා නම්, පසුගිය ආණ්ඩු සියල්ලටම වගකීමක් තිබෙනවා, ඒ පිළිබඳව හෙළිදරව් කරන්න. ඒ නිසා මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද කියා පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ඒ ගිණුමේ නීත්‍යානුකූල අයිතිය මොකක්ද, ඔවුන් ඒවා හෙළිදරව් කළාද, නැද්ද, ඒ පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය මොකක්ද, Prevention of Money Laundering Act එක සම්මත වුණාට පසුව කොච්චර මුදල් ප්‍රමාණයක් ඒකට ගිහින් තිබෙනවාද, එහෙම නම් ඒ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු කරනවාද, නැද්ද කියන කාරණා පිළිබඳව ආණ්ඩුවේ ස්ථාවරය දැන ගන්න කැමැතියි.

---

## අඳුරු නොවැම්බරයේ...

5 පිටුවෙන්

කිරීමට පැමිණි රජීව් ගාන්ධි අගමැතිවරයාට ආචාර පෙළපාළියේදී ලංකාවේ නාවික භටයෙක් තම රයිපල් බඳෙන් පහර දීම මගින් පෙන්නුම් කළේද මෙම විරෝධයේ තරමයි. එම නාවික භටයා ජ.වි.පෙ. සාමාජිකයෙකු නොවේ. මෙවැනි මහා පාවාදීමකදී ඊට එරෙහිව සටන් නොකර සිටිය හැක්කේ නිවටුන්ට පමණි. ජ.වි.පෙ. දේශප්‍රේමී අරගලයට අවතීර්ණ වූයේ මේ තත්වය තුළ මිස හේතුවක් නැතිව නොවේ. ජ.වි.පෙ. තහනම් නොකර තිබුණා නම් එය සන්නද්ධ අරගලයක් වන්නේ නැත. එහෙත් ජ.වි.පෙ. තහනම් කර තිබීමත් රට පාවාදීමට එරෙහිව සටන් වැදීම සඳහා තිබූ ක්‍රම අතර, සන්නද්ධ අරගලය එකක් වීමත් නිසා මෙම සටන ඇතිවිය. එබැවින් ජ.වි.පෙ. සටන් කළේ තම පෞද්ගලික වුවමනාවක් සඳහා නොව රට බේරා ගැනීමේ, ඉන්දියානු හමුදාවත් රට පාවාදුන් ජයවර්ධන පාලනයත් පලවා හැරීමේ ශුද්ධ වූ අරමුණෙනි.

ජයවර්ධන පාලනයේ කෲරත්වය කොතරම්ද යන්න සඳහා හොඳම උදාහරණය වන්නේ 1987 ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහි ජනයා දහස් ගණනින් පාරට බැස සාමකාමීව සිය විරෝධය පළකරද්දී එම පෙළපාළිවලට වෙඩි තබා නිරායුද අහිංසක පුරවැසියන් 147දෙනෙක් පමණ එක දිනකදී මරා දැමීමය. ඉන්දු-ලංකා ගිවිසුමටත්, ඒ මගින් රට පාවාදීමටත්, ඉන්දියානු ආක්‍රමණික හමුදා ලංකාවට ගෙන ඒමේ දේශද්‍රෝහී ක්‍රියාවටත් එරෙහිව පොදුවේ දේශප්‍රේමී බලවේග සටන් කළ අතර, එහි පෙරමුණේ සිටියේ ජ.වි.පෙ.ය. ප්‍රේමදාසට අවසානයේ ඉන්දියන් හමුදා ආපසු යැවීමට සිදුවූයේද මේ සටන නිසාය. එ.ජා.ප. පාලනය වධ කඳවුරු ගොඩනගමින්, නිල නොවන සන්නද්ධ කල්ලි නිර්මාණය කරමින් දහස් ගණන් ජනයා මරා දැමීය. ජ.වි.පෙ.ට සිදුවූයේ ඊට එරෙහි ප්‍රතික්‍රියා දැක්වීමටය.

ජයවර්ධන පාලනය 1987 මැයි දිනයද තහනම් කර ඒ වෙනුවෙන් අභයාරාමයට රැස්වූ අයට වෙඩි තබා කම්කරුවෙක් හා ශිෂ්‍යයන්ද මරාදැමුවේ මැයි දිනය සැමරීමේ වරදටය.

හමුදා සෙබළුන් හා ජ.වි.පෙ. අතර තිබූ සම්බන්ධය බිඳවීමට විවිධ කුමන්ත්‍රණ හා ප්‍රහාරයන් සැලසුම් කළ එ.ජා.ප.ය අත්අඩංගුවට ගත් අහිංසක මිනිසුන් පවා මරා දැමීය. එසේම 1989 නොවැම්බර් 12 දා උලපනේ නිවසේ සිටියදී අත්අඩංගුවට ගනු ලැබූ රෝහණ සහෝදරයාත් එදිනම බණ්ඩාරගමදී අත්අඩංගුවට ගත් උපතිස්ස ගමනායක සහෝදරයාත් තවත් කිහිපදෙනෙකුත් අධිකරණ ක්‍රියාමාර්ගවලින් තොරව අත්අඩංගුවේදීම මරා දැමුවේ රටට බොරු කියමිනි.

ඉදින් එ.ජා.ප. මර්දනකාරී, ප්‍රජාතන්ත්‍ර විරෝධී, පාලනයේ සියලු ක්‍රියාකාරකම් නොලසකා, අමතක කර, 88-89 ජ.වි.පෙ. භීෂණයක් ලෙස අර්ථ ගැන්වීමත්, ජ.වි.පෙ. මිනිසුන් මැරුවා යනුවෙන් පැවසීමත් තුළ සැබැවින්ම සිදුව ඇත්තේ සැබෑ අපරාධකරුවන්ට සුදුහුණු ගෑමය. 1987 වසරේ සිට 1990 දක්වා තිබූ සිවිල් යුද තත්වය තේරුම් ගත යුත්තේ මනෝමූලිකව හෝ එකිනෙකාගේ අවලාද බොරු විග්‍රහ තුළ නොව සැබැවින්ම සිදුවූ දේශපාලන වටපිටාව තුළය.

එදා ඒ ඉල්මහේදී දිවිදුන් අය විරුවන් වන්නේ ඔවුන් පවිත්‍ර අරමුණකින්, පොදු අරමුණකින් සටන් කොට දිවි පිදූවන් වන නිසාය. ජනතාවගේ සතුරන් කොතරම් අවලාද නගමින් මේ සත්‍යයත් ඊට අදාළ ඉතිහාසයත් විකෘති කිරීමට කොතෙක් උත්සාය කළත් සත්‍යය අනාගතයේදී ජය ගන්නවා ඇත. ඉල්මහ විරුවන්ගේ උදාරත්වයත් ඔවුන්ගේ පරිත්‍යාගයත්, කැපවීමත් ඉතිහාසයෙන් මකා දැමිය නොහැකි වනු ඇත. අවසාන වශයෙන් ධනවාදයේ අර්බුදය විසින්ම පාඩම් ඉගෙන ගන්නා ජනතාව සත්‍යය තේරුම් ගනිමින් ජනතා විමුක්ති පෙරමුණ හා එක්ව මේ රටේ ඉතිහාසය නුදුරු අනාගතයේදීම අලුතින් ලියනු ඇත. එදිනට ඉල්මහ විරුවන්ගේ උදාරත්වයට මුළු සමාජයම හිස නමා ආචාර කරනු ඇත.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




සුන්දර රටක් - ලස්සන ජීවිතයක් වෙනුවෙන්



යහලකැලේ චේ සැමරුමට එක්වී...



බලශක්තියේ අයිතිය රැකගැනීමට අධිකරණයට...



ගොවි අයිතිය වෙනුවෙන් සටන් වැද...



ඉතාලි කොමියුනිස්ට් පක්ෂයට සුබපැතුම් එක් කරමින්...



හුස්ම පොද රැකගැනීම සඳහා...



## ජනාධිපතිවරයාගේ වෙනස රට රැගෙන යන්නේ විනාශකාරීත්වය වෙතයි

**ජනතා විමුක්ති පෙරමුණේ නායක**
**අනුර දිසානායක සහෝදරයා**

ජනාධිපතිවරයා තමන් බලය ලබා ගත්තේ වෙනසක් සඳහා බව ප්‍රකාශ ඇති නමුත් ඔහු කරමින් තිබෙන වෙනස රට රැගෙන ගොස් ඇත්තේ විනාශකාරිත්වය කරා බව පැහැදිලි යැයි ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා පෙන්වා දුන්නේය.

අනුර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 23වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දක්වමින් අනුර සහෝදරයා මෙසේද පැවසීය.

"විනාශකාරීම ප්‍රවේශය අත්පත් වී තිබෙන්නේ කෘෂිකර්මාන්තයට, ගොවි ජනතාවට සහ රටේ ආහාර සුරක්ෂිතභාවයටයි. කිසිදු සැලැස්මක් හෝ ඇතිවිය හැකි විනාශය ගැන කිසිදු සොයාබැලීමක් නොකර කැබිනට් මණ්ඩලය විසින් රසායනික යෙදවුම් නතර කිරීමට තීරණය කළා. ඒ නිසා මේ වන විට ගොවීන් ගොවිතැන අත්හැර දමලා. පහුගිය දිනවල ගොවි ජනපදවල කන්න රැස්වීම් කලහකාරී තත්වයන් ඇති වුණා. ගොවියෝ දහස් ගණනක් මෙම ප්‍රශ්නය කේන්ද්‍රකරගෙන උද්ඝෝෂණ කරනවා.

රසායනික යෙදවුම්වල සිට කාබනික යෙදවුම් දක්වා වෙනස් වීමේදී සැලකිය යුතු කාලයක් ගත වෙනවා. එය එක කන්නයකින් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි කියලා අපි නිතරම කිවුවා. ඒ අතර රට තුළ කාබනික පොහොර නිෂ්පාදනය මුළුමනින්ම අවුල් ජාලාවක් බවට පත්වුණා. මිලදී ගත් කාබනික පොහොරවල අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ අඩංගු නැති බවත් ගල්කැට, පස් අඩංගු බවත් ගොවීන් මැසිවිලි නගනවා. ඉන් පසුව ආණ්ඩුව තීරණය කළා කාබනික පොහොර ආනයනය කරන්න. ඒත් ශාඛ නිරෝධායන ආයතනය මගින් චීනයෙන් ගෙන්වීමට තිබූ කාබනික පොහොර තොගයේ ඉතාම අහිතකර ක්ෂුද්‍ර ජීවීන් සිටින බැවින් ආනයනය නතර කළා. නමුත් අමාත්‍යවරයා පෙනී සිටියේ තමන්ගේ දැනුම ඥානය භාවිතා කර පරීක්ෂණ සිදුකළ ආයතනය හෝ නිලධාරීන් වෙනුවෙන් නොව චීන සමාගම වෙනුවෙන්. අපි ආණ්ඩුවට කියනවා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගත් තීන්දුව ආපසු හැරවීම කිසිසේත්ම නොකළ යුතුයි කියලා. මොකද මේ පාලනය විසින් කෘෂිකර්මාන්තයට සහ ගොවි ජනතාවට අත්කර දී ඇති විනාශය හොඳටම ප්‍රමාණවත්. විනාශකාරී ක්ෂුද්‍ර ජීවීන් අපේ රටට ඇතුල්වීමෙන් අපේ රටේ ජෛව පද්ධතියම කඩාවැටීමකට භාජනය වෙන්න පුළුවන්.

ඒ වගේම පළමු වතාවට ගුවන් යානයක් මගින් නැනෝ යූරියා ලංකාවට ගෙනාවා. එය පිළිගැනීමට ඇමතිවරු ගණනාවක් ගුවන්තොටුපලට ගියා. අපිට ලැබී තිබෙන වාර්තා අනුව මෙය ජූනි මාසයේ තමයි පරීක්ෂණ අවසන් කර ඉන්දියාවේදී වගාවලට යොදවා තිබෙන්නේ. අගෝස්තු මාසයේ ඉන්දියාවෙන් අපනයනයට අවසර ලැබී තිබෙන්නේ. ඒ නිසා නැනෝ යූරියා ගෙන්වීම විශාල ව්‍යාකූලත්වයක් ඇතිකර තිබෙනවා. එනිසා මේ සෙල්ලම් කරමින් තිබෙන්නේ අපේ රටේ ආහාර සුරක්ෂිතභාවය, ගොවි ජනතාවගේ ආදායම් මාර්ග සහ අපනයන ආදායමෙන් 25%ක ප්‍රතිශතයක් දෙන ක්ෂේත්‍රයක් සමගයි. කාබනික පොහොර වගාවට කවුරුවත් අකමැති නැහැ. නමුත් ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේම සඳහන් වන්නේ ඒ සඳහා අවම වශයෙන් වසර 10ක් ගත වෙන බව. ඒ සියල්ල අත්හැර තමයි ජනාධිපතිවරයා මේ අමනෝඥ, මුග්ධ තීරණය අරගෙන තිබෙන්නේ."



## කෘෂිකර්මයේ විනාශය බේරාගන්න කොන්ද කෙලින් තබාගෙන වැඩ කරන්න

**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික**
**වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**

කෘෂි විද්‍යාඥයින් විද්‍යානුකූලව තීන්දු ගන්නා ලෙස කියද්දී ජනාධිපතිවරයා, කෘෂිකර්ම ඇමතිවරයා, කෘෂිකර්ම රාජ්‍ය ඇමතිවරයා එකතු වී අපේ රටේ පදනම වන කෘෂිකර්මාන්තයට බරපතළ හානියක් සිදු කරමින් සිටින බව කියා සිටි ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, මේ තත්වය තුළ තමන්ගේ විශේෂඥභාවය, රටට ඇති ආදරය උපරිම ලෙස පෙන්වමින් කොන්ද කෙලින් තබා ගෙන කටයුතු කරන ලෙස කෘෂි ක්ෂේත්‍රයේ සියලු විද්වතුන්ගෙන් හා නිලධාරීන්ගෙන්ගෙන් ඉල්ලා සිටියේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 26වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදීය. එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ නලින්ද සහෝදරයා මෙසේද කියා සිටියේය.

"පොහොර සම්බන්ධයෙන් දැන් ඇතිවී තිබෙන්නේ සුර අසුර යුද්ධය මෙන් කාබනික රසායන අතර යුද්ධයක් නෙමෙයි. රසායනික හෝ කාබනික යන දෙවර්ගයේම පොහොර හඳුන්වා දෙනු ලබන්නේ විද්‍යාත්මක පදනමකිනුයි. මේ නිසා මේ ගැටුම කාබනික සහ රසායනික පොහොර අතර ගැටුමකට ලඝු කිරීම සුදුසු නැහැ.

ලංකාව මත්ද්‍රව්‍ය ආනයනය කරන කේන්ද්‍රයක් වී තිබෙන නමුත් විවිධ රටවල අහිතකර ක්ෂුද්‍ර ජීවීන් ලංකාවට ගෙන්වීම විවිධ අණ පනත් නිසා සහ එම නීති ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නිසා වැළකී තිබෙනවා. අපේ ශාක හා භූමිය විනාශ වීම වැළැක්වීමට වැට බැඳී තිබෙනවා. මෙම නිලධාරීන් මෙතෙක් තමන්ගේ කාර්යභාරය යම් ප්‍රශස්ත මට්ටමකින් ඉටු කර තිබෙනවා. චීන සමාගම සූදානම් වන්නේ ක්ෂුද්‍ර ජීවීන් සහිත පොහොර තොගය ගොඩබෑමටයි. ආණ්ඩුව හොර ගල් ඇහිළීමෙන් තොරව මේ පිළිබඳ සත්‍යය හෙළිදරව් කළ යුතුයි. තමන්ගේ නිලධාරීන් ආරක්ෂා කර ගනිමින් කටයුතු කර ගැනීම ආණ්ඩුවේ වගකීමක් වනවා.

මේ වන විටත් ආණ්ඩුව රටේ කෘෂිකර්මයට ඇති තරම් හානි කර තිබෙනවා. මේ යන ආකාරයට එළඹෙන අප්‍රේල් මාසයේ සිංහල දෙමළ අලුත් අවුරුද්දට කිරිබත් කන්නට සිදු වෙන්නේ පාකිස්ථානයෙන් ගෙන්වන ලද සහල්වලිනුයි."



## කාන්තාව ලිප්ගල් තුනට කොටු කරන පාලනයට එරෙහිව නැගී සිටින්න

**අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම්**
**සමන්මලී ගුණසිංහ සහෝදරිය**

වත්මන් පාලකයින් සූදානම් වන්නේ රටේ කාන්තාවන් 21වැනි සියවසේ දියුණු තත්වයකට ගෙන යාමට නොවන බවත් කාන්තාවන් නැවතත් ලිප්ගල් තුනට කාන්තාවන් කොටු කිරීමට බවත් පෙන්වා දුන් අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ සහෝදරිය, කාන්තාව ලිප්ගල් තුනට කොටු කිරීමට උත්සාහ කරන පාලන ක්‍රමයට එරෙහිව නැගී සිට සමාජය වෙනස් කළ හැකි දේශපාලන තීන්දුවක් ගන්නා ලෙසට ශ්‍රී ලාංකේය කාන්තාවන්ට ආරාධනා කළාය.

සමන්මලී ගුණසිංහ සහෝදරිය මේ අදහස් පළ කළේ පසුගිය 14වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය මෙසේද පැවසුවාය.

"මේ වන විට බඩු මිල වැඩිවීමෙන් අපේ රටේ කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳව මේ රටේ පාලකයන්ට පෙන්වා දෙන්න සිදු වී තිබෙනවා. වර්තමාන ආණ්ඩුව බලයට පත්වී අවුරුදු දෙකක්වත් ගත වෙන්න පෙර මැතිවරණවලදී කාන්තාවන්ට දුන් පොරොන්දු සියල්ල කඩකර තිබෙනවා. අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගන්න ඩොලර් නැති තත්වයට අර්බුදය බරපතළ වී තිබෙනවා. මේ පාලකයින්ට ආර්ථිකය ශක්තිමත් කරන්න බැහැ. බඩුමිල අඩු කරන්න බැහැ.

ජනතාව ණය වෙනවා, දුප්පත් වෙනවා. කාන්තාවන්ගේ ආර්ථිකය වැටී දරුවාට කිරි වේලක් දෙන්න විදිහක් නැහැ. නමුත් රටේ නායකයින්ගේ ආර්ථිකය පොහොසත් වෙනවා. මේ ප්‍රශ්නය වඩාත් හොඳින් තේරුම් ගන්න ඕනෑ කාන්තාවන්. මේ රටට ඩොලර් ගේන්නේ විදේශ ගත වෙන ශ්‍රමිකයන්ගෙන් බහුතරයක්ම කාන්තාවන්. ඔවුන් පිටරට පාරවල් සුද්ධ කරලා, ගෘහණියන් හැටියට වැඩ කරලා එවන මුදල්. මේ මුදල්වලින් පාලකයන් හොරකම් කළ නිසා කිරිපිටි වරායෙන් බා ගන්න විදිහක් නැහැ. සීනි නැව බා ගන්න විදිහක් නැහැ.

රුපියල් බිලියන 35ක හෙළිදරව් නොකළ මුදල් තැන්පත් කර තිබෙන බව පැන්ඩෝරා පත්‍රිකාවලින් කියනවා. මේ එකක් විතරයි. මේ හොරකම් කිරීම නැවැත්තුවේ නැත්නම් රටක් හදන්න විදිහක් නැහැ. අපි කාන්තාවන්ගෙන් ඉල්ලන්නේ ඔබේ ඡන්දයෙන් හොරකම් කරන්න නායකයන් පත්කර ගත්තා ඇති කියලා. ඒ නිසා වහාම ඔබ මේ ගැන දැනුවත් වී අනික් අයත් දැනුවත් කරන්න. ඇත්තටම රට සංවර්ධනය කරන මාවතට මුලින්ම හැරෙන්න ඕන කාන්තාවෝ. මේ රටේ කාන්තාවන් තමන්ගේ පවුල් ගොඩ ගන්න, දරුවාට කිරි වේලක් දෙන්න, දරුවට හොඳ අනාගතයක් හදන්න පුළුවන් ආණ්ඩුවක් පිහිටුවා ගන්න ඕනෑ."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.